


දිවයින
ඉරිදු සංග්‍රහය

ලිපි මාලාවක් ඇසුරින්

අතහැරීම 7

# මහ රහතුන් වැඩි මඟ ඔස්සේ



ඉදිරිපත් කිරීම
ඉන්ද්‍රජිත් සුබසිංහ

# මහ රහතුන් වැඩි මඟ ඔස්සේ

## අතහැරීම 7

**(සතර අපායෙන් මිදෙමු)**

ඉදිරිපත් කිරීම
**ඉන්ද්‍රජිත් සුබසිංහ**

**දිවයින ඉරිදා සංග්‍රහයේ**
**ලිපි මාලාවක් ඇසුරිනි**

© ඉන්ද්‍රජිත් සුබසිංහ

පළමුවන මුද්‍රණය - 2014 සැප්තැම්බර්
පස්වන මුද්‍රණය - 2015 ජනවාරි
දහවන මුද්‍රණය - 2015 ජුනි
පහළොස්වන මුද්‍රණය - 2016 ජනවාරි
දහසයවන මුද්‍රණය - 2016 පෙබරවාරි
දාහත්වන මුද්‍රණය - 2016 මාර්තු

ISBN 978-955-7887-04-3

**පොත ලබාගත හැකි ස්ථාන**

**දිවයින පුරා පොත් අලෙවි සැල්**

**විමසීම් -** 071 2 199 900
(කාර්යාල වේලාවන් හීදී පමණක් ඇමතීමට කාරුණිකවන්න)

ඡායාරූප
**වාසල සේනාරත්න**

මුද්‍රණය සහ බෙදාහැරීම
**ස්මාර්ට් ප්‍රින්ට් සොලියුෂනස් සෙන්ටර්**
444/3B, පිටිපන දකුණ, හෝමාගම




මේ ලිපි මාලාව ලියූ ස්වාමීන් වහන්සේ මේ වන විට කොහි වැඩ සිටිනවාදැයි මම නොදනිමි. එහෙත් උන්වහන්සේ මේ පින් බිමේ කුමන හෝ ගැඹුරු වනගැබක අලි, කොටි, වලසුන් මැද ඒක විහාරීව දහම් සුව විඳිමින් සිටිතැයි මම විශ්වාස කරමි. මේ ඝෝර කටුක සංසාරයේ බිය දැක මේ ආත්මයේදීම සසර දුකින් එතෙරවීම අදිටන් කරගනිමින් සෘජුව නිවන් මගේ ගමන් කළ උන්වහන්සේ ලබා ඇති මග ඵල ගැන කියන්නට තරම් මම සමතෙක් නොවෙමි. එහෙත් උන්වහන්සේ වැඩිය යුතු බවුන් වඩන උතුමකු බව කියන්නට මම නොපැකිලෙමි. තම අවබෝධය මෙන්ම අත්දැකීම්ද උන්වහන්සේ සතුවූ සටහන් පොත් කිහිපයක සංස්කරණය නොකළ සටහන් ලෙසින් මා අතට පත්කළ උන්වහන්සේ නොපෙනී ගියහ. එහෙත් ඒ සටහන් කෙතරම් දාර්ශනිකද. ගැඹුරුද. ආශ්චර්යමත්ද. නිවන් මඟට පිළිපන් ගිහි පැවිදි උභය පාර්ශ්වයටම මෙය අගනා පූජාවක් වනු ඇතැයි මගේ පුහුදුන් සිත කියයි. මේ සියල්ල ඔබ වෙත ඉදිරිපත් වුවද ඒවා ලියූ උන්වහන්සේගේ නාමය හෙළි නොකරන සේ කරන ලද ඇයැදුමක්ද විය. කර්තෘ අඥාත වුවද මේ සියල්ල ඔබ හැමගේ යහපතට හේතුවනු නිසැකය. ඒ නිසාම මා ලද ඒ අතිශයින් අගනා දහම් පඬුර පොතක් ලෙසින් ඔබ අතට පත්කිරීමට මට ඉඩ දුන මැනවි!

( 2012 වෙසක් පුන් පොහෝ දින )

මේ ඝෝර කටුක භයානක සංසාරයේ
තියෙ දුක, මේ ආත්මභාවයේදීම
සසර දුකින් එතෙර වීමට
අධිෂ්ඨානය කරගෙන වීර්ය වඩමින්
ඔබටත් මග පෙන්වන "දහම"
නිසි ලෙසදී අවබෝධ කරගන්
සව් අසිරිමත් නිවාණය
ඥානවන්ත වේවා, ශක්තිමත්ම වේවා,
ධෛර්යවන්තම වේවා
තම තමාට එළඹෙන ප්‍රශ්නවලට
තම තමන්ගේ විසඳුම් සොයා ගනිත්වා.
දුරම හෝ විහාරයේ දුරදී ඇතත්
ඔබ නොකළ වරදකට
ඔබ නොගැටෙව්,
පුනරුත් අනුකම්පා කෙරෙව්,
වැරදි නාහොත් නිවැරදි වෙස
නිවැරදි ලෙස දකිත්වා.
ඔබේ සතුටත් සමඟ ප්‍රාර්ථනාව
ඔබ සුවපත් සහනයට වේවා,
තම තමාටම විශිෂ්ට කොට ගනිත්වා.

(පින්වත් ඔබ වෙනුවෙන් මෙම සටහන් තැබූ භික්ෂුන් වහන්සේ විසින් ලියූවකි.)

# පිදුම

මේ අනන්ත වූ සංසාරයේ අප කරක් නොගැසූ තැනක් වේද? අත් නොවිඳි අත්දැකීමක් වේද්ද? ඒ සා තැන්හී කරක් ගසා, ඒ සා අත්දැකීම් විඳ මෙලෙසින් තවත් උපතක් ලැබූ අපි මේ භව චක්‍රයේ තවත් කැරකෙමුද? අප හැමදාම කැරකුනේ එකම තැනක් වටාය. විඳගත්තේ ජාති, ජරා, ව්‍යාධි, මරණ.... වැනි එකම අත්දැකීම් පෙළකි.

හිත හැරුණු අතේ, හිස හැරුණු අතේ....යන්නන් වාලේ ගිය මේ ගමනේ වෙහෙස යනු 'දුක' යැයි කියාදුන්, ඒ දුකට සමුදීමේ ක්‍රමවේදය 'දුක අවබෝධ කිරීම' යැයි කියාදුන්, දුක අවබෝධ කිරීමේ උත්සාහයට වචනයකින් හෝ ආදර්ශයෙන් හෝ සවිය දෙන කළ්‍යාණ මිත්‍රයෙක් යැයි කියන්නා වූ යමෙක් වෙත්ද, ඒ කළ්‍යාණ මිත්‍රයා වෙනුවෙන් මෙය පුදමි.

**ඉන්ද්‍රජිත්**

# පටුන


ඔබේ තරුණ ලස්සන රුව කවුද රැගෙන ගියේ... 1

බලාගෙනයි! දුකට පාර කියන ඒජන්තවරු එමටයි 5

බුදුරජුන්ගෙන් පාර නැසූ අවාසනාවන්තිය 11

බෞද්ධ පින්වතුන්ගේ 'ජනප්‍රිය පැනය' (මස් මාංශ අනුභවය 1) 23

මෛත්‍රිය දෘෂ්ටිය අනුභව කර
මස් මාංශ නොකෑමෙන් පළක් වේද? (මස් මාංශ අනුභවය 2) 27

මස් මාංශ අනුභව කරන කුස සුසානයක් නම්... 31

මාංශයට ඇලී, මාංශයට ගැටී
තවත් මස් ගොඩක් දරාගෙනම ඉපදෙමුද? 35

භාවනාවට පෙර පළමු කොටස
ඔබ නැවත නැවතත් 'අ' යන්නම ඉගෙන ගන්නේ ද 42

භාවනාවට පෙර දෙවන කොටස
අතීත ශක්තීන් අවබෝධයෙන් ආයෝජනයට ගන්න 46

භාවනාවට පෙර තෙවන කොටස
සිත තැන්පත් නොවීමත් භාවනාවට ආයෝජනයක් කරගන්න 49

භාවනාවට පෙර සිව්වන කොටස
අකුසලය යටපත් කරන්න අමනුෂ්‍යයා අනිත්‍ය ලෙස දකින්න 53

භාවනාවට පෙර පස්වන කොටස
භවය යනු කඳුළු සාගරයකැයි නුවණින් දකින දා.. 58

භාවනාවට පෙර සයවන කොටස
දැකිය යුත්තේ සසර බියමය 64

භාවනාවට පෙර සත්වන කොටස
භාවනාවට පෙර මේ ගැනත් සිතන්න
සතර අපා දුක් නොවින්ද කව්රුනම් ලොවේ සිටිත් ද? 67

භාවනාවට පෙර අටවන කොටස
මෛත්‍රී භාවනාව කියන්නේද අතහැරීමකි 72

භාවනාවට පෙර නවවන කොටස
කමටහන මගහැර කවරනම් භාවනාවක්ද? 76

භාවනාවට පෙර අවසාන කොටස
ඔබ ඔය ද්වේශ කරන්නේ ඔබගේම මෝහයට නොවේද? 80

හිංසාවේ රාත්‍රිය 85

දෙවියන්ද වඳින පින් බිමයි මේ 92

අවසාන අවස්ථාව 98

# ඔබේ තරුණ ලස්සන රුව
# කවුද රැගෙන ගියේ...

ආදරය කියන වචනය පින්වත් ඔබට බොහෝම ප්‍රියමනාප හැඟීමක් දෙන වචනයක්. ඇසේ ආශ්වාදය උදෙසා තවත් ඇසකට බැඳුනොත්, කනේ ආශ්වාදය උදෙසා තවත් කනකට බැඳුනොත්, නාසය නිසා තවත් නාසයකට බැඳුනොත්, දිව නිසා තවත් දිවකට බැඳුනොත්, මනස නිසා, කය නිසා තවත් මනසකට කයකට බැඳුනොත් අපි එයට කියනවා ආදරය කියලා.

ඇසක් ඇසක් සමග බැඳෙනවා කියන්නේ දුකක්, දුකක් සමග බැඳෙනවා කියන කාරණයයි. කව්රු කොහොම බැඳුනත් ඔබ බැඳෙන්නේ කරුණු පහකටය කියලා ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. ඒ රූප, වේදනා, සංඥා, සංකාර, විඤ්ඤාණ කියන කරුණු පහයි. මේ කාරණා පහේ ස්වභාවය නිරතුරුවම අනිත්‍ය භාවයට පත්වීමයි. යමක් ස්ථිර භාවයේ නොපවතී නම් එතැන ඇත්තේ දුකයි. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා 'පින්වත් මහණෙනි, කාමයේ ආශ්වාදයක් තිබෙනවා' කියලා. බුදුරජාණන් වහන්සේ කොතැනකදීවත් දේශනා කරන්නේ නෑ කාමයේ ආශ්වාදයක් නැතිය කියලා. 'කාමයේ ආශ්වාදයක් තිබෙනවා. මහණෙනි, ඒ නිසාමයි සත්ත්වයා මේ තරමටම ඇස, කන, දිව, නාසය, මන, කය කියන ආයතන පිනවන්න උත්සාහ ගන්නේ. ඒ උදෙසා දිවා රාත්‍රී වෙහෙසෙන්නේ. නමුත් පින්වත් මහණෙනි, කාමයේ ආශ්වාදය වගේම එහි ආදීනවයකුත් තිබෙනවා. කාමයේ ආශ්වාදය කෙටිය. ඒ උදෙසා විඳින්නට වන ආදීනවය අතිදීර්ඝයි,

කටුකයි කියලයි බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ. එහෙම නම් යමෙක් ආදරයේ නාමයෙන් තව කෙනෙක් සමග බැඳෙනවා කියන්නේ කෙටි ආශ්වාදයක් උදෙසා අතිදීර්ඝ කටුක ආදීනවයකට බැඳෙනවා කියන එකයි.

කෙටි සැපයක් උදෙසා දීර්ඝ දුකක්.....

මේ සටහන කියවන පින්වත් ඔබ ආදරයේ නාමයෙන් කුමන හෝ බැඳීමකට ලක්වූ අයෙක් නේද? ඔබේ ජීවිතයට මේ උතුම් ධර්මය ගලපා බලන්න. ගෙදර සාලය මත, කුමක් හෝ රඳවනයක් මත තබා තිබෙන ඔබගේ සුන්දර මංගල ඡායාරූපයේ හුරුබුහුටි මනාල මහත්මිය සහ කඩවසම් මනාල මහතා යන දෙපළගේ තාරුණ්‍යයේ ලස්සන, හැඩරුව මේ මොහොතේ ඔබේ ජීවිතය තුළ රැඳී තිබෙනවාද? ඒවාට මොකද වුනේ? කවුද අරගෙන ගියේ? කොහෙටද අරගෙන ගියේ?...

ජාති, ජරා, ව්‍යාධි, මරණ දෙසටම නේද?

මොකක්ද දැන් ඉතිරිව තිබෙන්නේ?

ශෝක, පරිදේව, දුක්ඛ, දෝමනස්සයන් නේද?

වර්තමාන සමාජයේ ඔබ සමග ජීවත්වන වයෝවෘද්ධ ආච්චිලා, සීයලාත් අතීතයේ ඔබ වගේම තාරුණ්‍යයෙන් ඔදවැඩී ජීවත්වුන අය. ඒ අයගේ රූපය තුළත්, ඔය තාරුණ්‍යය ඔබට වැඩිය තිබුණා. ඒ අයත් අතීතයේ රූප රාජිණී තරඟවලට ඉදිරිපත් වුනා. දැන් තමා දෙස බැලුවහම ඒ අයට තේරෙනවා මොකක්ද මම අතීතයේ ඉදිරිපත් කළේ කියලා. ඒ අතීතය මතකයට නගන කොට ඉතිරිව ඇත්තේ පංච උපාදානස්කන්ධයක දුක පමණයි.

මංගල දිනයේ මනමාල මහත්මයෙකුට, මනමාලියකට ඇඳුම් අන්දවන්න, ලස්සන කරන්න පමණක් ලක්ෂ ගණන් වියදම් කරන සමාජයක් මේක. ලක්ෂ ගණන් වියදම්කොට කාටද මේ අන්දවන්නේ. අවිද්‍යාවටම නේද? තෘෂ්ණාවේ සළුපිළි, රන් රිදී තමයි මේ පළඳවන්නේ. ඇඳුම් පැළඳුම් ලස්සන බව ඇත්ත.

සුවඳ විලවුන් සුවඳ බවත් ඇත්ත. මුහුණේ සිනහව ප්‍රසන්න බවත් ඇත්ත. ඒත් කවුද මේවායේ හැඩ බලන්නේ? වෙන කවුරුවත්ම නෙමෙයි, මාරයායි මේවායේ හැඩ බලන්නේ.

මෙතැනදී මාරයා හැඩ බලන්නේ කාගේද? මාරයාගේ හැඩමයි මාරයා විසින්ම බලන්නේ. රූපයේ කියන්නෙත් මාරයාමය. රූපය ඇසුරින් සකස්වන පංච උපාදානස්කන්ධයත් මාරයාමය. මාරයාගේ හැඩරුව මාරයාම බලනවා. පින්වත් ඔබට වැටහෙනවාද මේ කියන කාරණය.

තවත් තේරුම්කොට කියනවා නම් දූක විසින් දූකේ හැඩරුව බලනවා.

රූපය දූකක් වෙන්නේ, රූපය නිර්මාණය වෙලා තිබෙන්නේ නිරතුරුවම අනිත්‍ය භාවයට පත්වෙන සතර මහා ධාතුවෙන්. ඒ නිසා නිරතුරුවම යමෙක් ඡන්දරාගයෙන් අල්ලාගන්නේ ජාති, ජරා, ව්‍යාධි මරණයට අයත් රූපයක්මයි. ඵස්ස, වේදනා, සංඥා, සංකාර, විඤ්ඤාණ කියන ධර්මතාවයන් පහක් සකස්වෙන්නේ අනිත්‍යයට පත්වෙන රූපයක් හේතුවෙන්. රූපය අනිත්‍ය නම්, ඒ හේතුකොට සකස්වෙන යම් ධර්මතාවයක් වේ නම් ඒවාද අනිත්‍ය විය යුතුය.

ලොව්තුරා බුදුරජාණන්වහන්සේ දේශනා කරනවා රූපය නිරතුරුවම මැරෙමින් ඉපදෙමින් පවතිනවා කියලා. නමුත් ඒ බවක් ඔබ දන්නේ නැහැ. ඔබ මරණය ගැන සිතන්න කැමතිත් නැහැ. ගෙදර තමන්ගේ ඥාතියෙක් මියගිය හොත් දේහය ගෙදර තිබෙන තාක්, මරණය ගැන සිතනවා. අනේ මමත් මැරෙනවා නේද? කියලා සිතනවා. මාව දාලා ගියේ ඇයි, මාවත් අරන් යන්න කියලා බලෙන් මරණය ගන්න හදනවා. මේ දින තුන හතර මරණානුස්සතිය වැඩෙනවා. ඒත් ටික දවසයි ඒ උණුසුම තිබෙන්නේ. ඔබට මරණය අමතක වෙනවා. නැවත මරණය ගැන සිතන්න ඔබ කැමති නැහැ. මරණය ගැන සිතීම අසුබ දෙයක්, සෘණාත්මක දෙයක්, පසුගාමී දෙයක් හැටියටයි ඔබ දකින්නේ.

යමෙක් මරණය ගැන නිරතුරුවම සිතනවා කියන්නේ, නුවණින් දකිනවා කියන්නේ ඇත්ත ඇති සැටියෙන් දකිනවා කියන එකයි. මෙතැන සෘණ හෝ ධන දෘක්මක් නැහැ. මෙතැන තිබෙන්නේ යථාර්ථයයි. සිදුවෙමින් පවතින ඇත්තයි. ඔබ මරණය සිහිකිරීමට බියවෙනවා කියන්නේ ඇත්ත දෑකීමට බියවෙනවා කියන එකයි. උදේ සිට රාත්‍රිය දක්වා මේ ශරීරයට ආහාර, ජලය, බෙහෙත් ලබාදෙමින් අපි කරන්නේ ජාති, ජරා, ව්‍යාධි, මරණ වසන් කරන්නට හදන එකයි. ඔබ ඔය සැබෑ ඇත්ත වසංකරලා, මොකක්ද ඇත්ත හැටියට අරගන්නේ. මෝහයයි. මෙතැනදී ඔබ අධර්මයමයි ධර්මය හැටියට අරගන්නේ. මේ මෝහ මූලික දෘක්ම පෝෂණය කරන්න ඕනෑ තරම් මාර බලාවේග සමාජය තුළ තිබෙනවා. ජීවිතය අත්විඳින්න! මරණය ගැන නොසිතන්න!..... බොහෝම සුන්දර අදහස් ලෙසින් සමාජයට එනවා. ඒත් ඒවායේ සුන්දරත්වය වැඩි තරමටම එහි ඇති අර්ථය තුළ දුකද ගොඩගැසී තිබෙනවා.

ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා මේ ඇස නිරතුරුවම මැරෙමින් උපදිනවා කියලා. මේ කන, නාසය, දිව, මනස, කය නිරතුරුවම මැරෙමින් උපදිනවා කියලා. ඇසත්, බාහිර රූපයත්, විඥානයත් එස්සය වීමේදි ඇස උපදිනවා. ඇස උපදිනවා කියන්නේ චක්ඛු විඥානය උපදිනවා කියන එකයි. ඒ සැනින් ඇස මැරෙනවා. තවත් ආයතනයක් උපදිනවා. ඒ කියන්නේ මනෝ විඥාණය සකස්වෙනවා. මෙය බොහෝම වේගවත් ක්‍රියාවලියක්. සෑම මොහොතකදීම කුමක් හෝ ආයතනයක් ඉපදී පවතිනවා. එක ආයතනයක් ඉපදිලා, කියන්නේ අනෙක් ආයතන පහම මැරිලා කියන එකයි. ශරීරයේ උණුසුමත්, ආයුෂත් තිබෙනවා. උපදින කුමන හෝ ආයතනයක් නිරතුරුවම ක්‍රියාත්මක භාවයේ පවතින නිසා විඥානය ඇතිවෙමින් නැතිවෙමින් පවතිනවා. ඒ නිසා මරණයක් ගැන ඔබට පෙනෙන්නේ නැහැ. ඔබ මරණය හැටියට දකින්නේ ආයුෂත්, උණුසුමත්, විඤ්ඤාණයත් පහව ගිය ශරීරයක මරණය ගැන පමණයි.

# බලාගෙනයි! දුකට පාර කියන ඒජන්තවරු එමටයි

සිය මංගල උත්සවයේදී හැඩවෙන්න මනාල යුවලක් ගන්නා වෙහෙස...? අපි ඉකුත් සටහනේ කථාකළා. දැන් ඔබට තේරෙනවාද ඔබ මේ ලක්‍ෂ ගණන් වියදම්කරලා හැඩ බලන්නේ, සතුටුවෙන්නේ නිරතුරුවම මැරෙමින් උපදින මළකඳක් හැඩවැඩ කරලාය කියන කාරණය. සම්මුතිය තුළ මේ අර්ථය වෙනස්වෙනවා. නමුත් ධර්මයට අනුව මීට වඩා මෙතන  අර්ථයක් නැහැ. ඔබම මේ අර්ථය හොඳින් නිරීක්‍ෂණය කරන්න පුළුවන්. මේ මොහොතේ ඔබේ මංගල ඡායාරූපය හොඳින් බැලුවොත් ඔබට මේ යථාර්ථය වැටෙහෙන්නේ නැහැ. මේ යථාර්ථය දකින්න නම් ඔබේ දෙමාපියන්ගේ මංගල ඡායාරූපය දිහා හොඳින් බලන්න. ඔබට පෙනේවි රූපයේ ඉපදීම, දිරීම, මියයාම හොඳින්ම.

ඔබට අවශ්‍ය නම් පුළුවන් ඔබේ ජීවිතයත් ඒ අනුව ගලපා බලන්න.

ඒත් ඔබ කැමති වෙන්නේ නැහැ... මොකද ඒ කැමත්ත තමයි ලෝකයේ තිබෙන අති දුර්ලභම කැමැත්ත. ලෝකයේ පවතින අතිදුර්ලභම දෙය තමන්ගේ කැමත්ත බවට පත්කරගත් උත්තමයන් තමයි අතීතයේ වැඩසිටි අරහත් උත්තමයන් උත්තමාවියන්. මේ වීරවරයන් වීරවරියන් අරිහත් මාර්ග ඥානය අවබෝධයට පැමිණි ගමනේදී මැරෙමින් ඉපදෙමින් පවතින මලකඳක් සළු පිළියෙන් රන් රිදියෙන් සරසන්න ගියේ නැහැ. ධර්මය තුළිනුයි ජීවිතය සරසන්නේ. ධර්මය තුළින් සරසා ගත්තාය කියන්නේ අනිත්‍ය, දුක්ඛ, අනාත්ම භාවයේ අර්ථය ජීවිතයෙන් වටහාගත්තාය කියන

කාරණයයි. ගොඩාක් දේවල් තිබුනේ නැහැ මෙහිදී අවබෝධ කරගන්න. ලෝකය කොතරම් සංකීර්ණ වුවද, අද්භූතවුවද, පුළුල් වුවද කාරණා දෙකක් අවබෝධ කරගැනීමෙන් ලෝකයම අවබෝධ කරගැනීමට හැකිබව ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනාකරනවා. ඒ කාරණා තමයි රූපයත් විඤ්ඤාණයත් කියන කාරණා දෙක. බලන්න මාරයා විසින් ලෝකය මේ තරම් සංකීර්ණභාවයට පත්කර ඇතත්, කාරණා දෙකක් අවබෝධකර ගැනීමෙන් ලෝකයෙන් එතෙරවීමට අවස්ථාව ඔබට ලැබෙන්නේ කොහොමද කියන කාරණය.

ලොව්තුරා සම්මාසම්බුද්ධ ඥානයට පින්සිද්ධ වෙන්නමයි. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ හැර වෙන කව්රුත් නම් මාරයා විසින් පඹගාලක්, කටුඅකුලක් සේ සංකීර්ණභාවයට පත්කර ඇති මේ ලෝකයේ යථා ස්වභාවය අවබෝධකරගන්නද? මෙය බුදුරජාණන් වහන්සේගේ ආශ්චර්යවත් සම්මා සම්බුද්ධ ඥාණයේ බලමහිමයයි. ඔබට පුළුවන් මේ ධර්ම මාර්ගයේ ගමන් කරන්න. බුදුරජාණන් වහන්සේ දේශනාකරනවා ධර්මයේ සන්දිට්ඨික ගුණය ගැන. ඒ නිසා ඔබ අවංක නම් එහි ප්‍රතිඵලය ස්ථිරයි. බුදුරජාණන් වහන්සේමයි අපිට දුකෙන් මිදෙන පාර පෙන්වන්නේ. එසේ නොමැතිව හඳහනේ ග්‍රහයෙක් දේවාලයක දෙවියෙක් නොවේ ඔබට දුකෙන් මිදීමේ පාර පෙන්වන්නේ. අපි හැම මොහොතකම දුකෙන් මිදීමට පාර අසාගන්නේ දුක තුළම ජීවත් වෙන්නෙක්ගෙන්. එහෙම කෙනෙක් පාර කියන්නේ දුකටමයි.

පින්වත් ඔබට දැනෙනවා නම් ඔබ අත්විඳින ජීවිත අත්දැකීම් නිසා 'අනේ මේ ජීවිතය දුකයි' කියලා, කවුද ඔතනට එන්න පාර පෙන්නුවේ. එකක් පැහැදිලියි ස්ථිරවම. ඒ බුදුරජාණන් වහන්සේ නම් නොවේ. බුදුරජාණන් වහන්සේලා කවදාවත් දුකට පාර පෙන්වන්නේ නැහැ. ඒ උන්වහන්සේලා සතු මහා කරුණා සමාපත්ති ගුණය නිසා. පසේ බුදුරජාණන් වහන්සේ නමකට, මහාරහතන් වහන්සේ නමකට මහා කරුණා සමාපත්ති ඥානය

පිහිටන්නේ නැහැ. ඒ නිසා බුදුරජාණන් වහන්සේලාගේ අසමසම කරුණා ඥානයට මෙලොව කිසිවෙකුට ළංවෙන්න බැහැ. ඇයි මේ උතුම් රැකවරණය ඔබ නොගන්නේ. අර්ථවත් ලෙස ඔබේ ජීවිතයට දායාද කරගත හැකි මේ උතුම් ධර්ම මාර්ගය අතහැර, දුකට පාර පෙන්වන මාර නියෝජිතයින් ගෙන් පාර විමසන්නේ.

බුදුරජාණන් වහන්සේ පාර කියාදුන් පින්වත් තරුණයෙක් සිටියා ඔහුගේ නම ඡත්ත. මිථ්‍යාදෘෂ්ටික බමුණු පවුලක තරුණයෙක්. දිසාපාමොක් ආචාර්යවරයා ළඟට ගොස් හොඳින් ශිල්ප හදාරලා බමුණු ගෙදරට පෙරළා පැමිණියා. දෙමාපියන්ට ඥාතීන්ට ශිල්ප පෙන්නලා ඒ අය සතුටු කළා. තම පුතුගේ හැකියාවන් ගැන සතුටුවුන දෙමාපියන්ගේ ගුරුපඬුරු රැගෙන ශිල්ප ඉගැන්වූ ගුරුවරයාට ගුරු පූජාවක් කරන්න පිටත්වුනා. ගුරුගෙදරට මහා කැළය මැදින් වැටී ඇති මාර්ගයකයි යන්න තිබෙන්නේ. මේ අවස්ථාවේ බුදුරජාණන් වහන්සේ දිවැස් ඥානයෙන් දකිනවා ඡත්ත තරුණයා ගැන. ඡත්ත තරුණයාගේ ජීවිතයට අනතුරක් වෙනවාය කියල. ඒ කියන්නේ කැළය මැදින් යනවිට සොරු රැළක් ඡත්තව මරා දමලා මුදල් පැහැරගන්නවාය කියලා. පෙර කර්ම විපාකයක් නිසා සිදුවෙන මේ සිද්ධිය දිවැසින් දැකලා බුදුරජාණන් වහන්සේ ඡත්ත තරුණයාට පිහිටවීම සඳහා ඡත්ත ගමන් කරන කැළෑ මාර්ගයේ ගසක් මුල වැඩ සිටිනවා. ඡත්ත බුදුරජාණන් වහන්සේ සමීපයට එනවා. තුනුරුවන් ගැන ඡත්ත මුකුත්ම දන්නේ නැහැ. මිථ්‍යාදෘෂ්ඨික පවුලක දරුවෙක් වුනත් පෙර කුසල් ශක්තියත් නිසාම ඡත්ත මුලින්ම බුදුරජාණන් වහන්සේ දකින මොහොතේම උන්වහන්සේ කෙරෙහි පහදිනවා.

බුදුරජාණන් වහන්සේ විමසනවා ඡත්ත ඔබ බුද්ධ රත්නය, ධම්ම රත්නය, සංඝ රත්නය ගැන දන්නවාද කියල. ඡත්ත කියනවා නැහැය කියළා. බුදුරජාණන් වහන්සේ විමසනවා ඔබ කැමතිද තෙරුවන්ගේ ගුණයන් දැනගන්න කියලා. තෙරුවන් සරණ පිහිටන්න කියලා. මේ මිථ්‍යාදෘෂ්ඨික බමුණු තරුණයා කැමති වෙනවා. තෙරුවන්ගේ ගුණ ගැන දැනගන්න. බුදුරජාණන්

වහන්සේ අර්ථ වශයෙන් තෙරුවන්ගේ ගුණ ගැන දේශනාකර තෙරුවන් සරණ පිහිටවනවා. ඡත්ත තරුණයාගේ සංසාරික කුසලයක් නිසාම මේ මොහොතේ තෙරුවන් සරණ කෙරෙහි ශ්‍රද්ධාව ඇතිකර ගන්නවා. බුදුරජාණන් වහනසේ පෙරළා වඩිනවා. ඡත්ත තරුණයා කැළය මැදින් ගුරුගෙදරට යනවා. බුදුරජාණන් වහන්සේ හොඳින්ම දන්නවා කැළය තුළදී ඡත්ත තරුණයාව අනතුරට පත්වෙනවා කියලා. නමුත් ඡත්තගේ ගමන බුදුරජාණන් වහන්සේ වැළැක්වුවේ නැහැ. අවශ්‍ය නම් බුදුරජාණන් වහන්සේට තිබුනා 'ඡත්ත ඔබ දැන් ඔය ගමන කැළය මැදින් යන්න එපා. එය ඔබේ ජීවිතයට අවදානම පිණිස පවතිනවා. ඒ නිසා මා පසුපස ඔබ නැවත ගමට යන්න එන්න' කියලා කියන්න. බුදුරජාණන් වහන්සේ තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවට පැමිණි ඡත්ත තරුණයාගෙන් එහෙම ඉල්ලීමක් කළා නම් ඡත්ත එම අවවාදය පිළි ගන්නවා. නමුත් බුදුරජාණන් වහන්සේ ඡත්ත තරුණයාගේ ගමන වැළැක්කුවේ නැහැ. ඡත්ත තරුණයා කැළය තුළදී සොරුන් අතින් මරණයට පත්වෙනවා. ඡත්ත තෙරුවන් කෙරෙහි ඇතිකර ගත් ශ්‍රද්ධාව නිසාම මරණයෙන් පසු සග්‍රීක දිව්‍ය තලයක විශාල දිව්‍ය විමානයක පිරිවර සහිත අසිරිමත් දෙවියෙක් ලෙස උපත ලබනවා.

මෙහෙම අවස්ථාවකදී ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ මහා කරුණා ඥානයේ හැඩතල හොඳින් ප්‍රකට වෙනවා. බුදුරජාණන් වහන්සේ යමෙකුට පාර පෙන්වන්නේ වඩාත් සැප ඇති තැනට යන්නමයි. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ මරණය පෙනි පෙනී කැළයට යන ගමන නැවත්තුවේ නැත්තේ ඇයි? ඒ ගමන වැළැක්කුවා නම් ඡත්ත තරුණයාගේ ජීවිතය ආරක්‍ෂා වෙන්න තිබුණා. අවම වශයෙන් මරණය ප්‍රමාදවෙන්න හෝ තිබුනා. නමුත් ඡත්ත තරුණයාගේ ජීවිතය ආරක්‍ෂාවුනා නම් මොකද වෙන්නේ. මරණයෙන් බේරුණ ඡත්ත නැවත බමුණු ගෙදරට ගිහිල්ලා ජීවිතය පවත්වාගෙන යන්න දුක් විඳින්න ඕන. රාජ්‍ය සේවයට යන්න ඕන. ගොවිතැන් බත් කරන්න ඕන. විවාහයක්

වෙන්න, බිරිඳ දරුවන් පෝෂණය කරන්න ඕන. මේ කය ලෙඩ වනවිට බෙහෙත් කරන්නට ඕනේ. දෙමාපියන් රැකබලාගන්න ඕනේ. මේ කය මහළුවෙන විට දුකට පත්වෙන්ට ඕන. බුදුරජාණන් වහන්සේ ඡත්ත තරුණයාට ගෙදර යන්න අවස්ථාව සලසා දුන්නා නම් ඉහත දුක තමයි ඡත්තට අත්විඳින්න වෙන්නේ. වැඩිම වුනොත් අවුරුදු සියයක් ජීවත්වෙයි. ඡත්ත තරුණයාට ඒ දුකට යන්න බුදුරජාණන් වහන්සේ පාර පෙන්නුවේ නැහැ. කොතනට යන පාර ද පෙන්නුවේ කල්ප ගණනාවක් දිග, අප්‍රමාණ දිව්‍ය සශ්‍රික දිව්‍ය සැපයක් අත්විඳීමට ලැබෙන පාරයි පෙන්නුවේ. නින්දෙන් පිබිදියාක් මෙන් ඡත්ත තරුණයා සොරු අතින් මියයන මොහොතේ බුදුරජාණන් වහන්සේ පෙන්වූ පාර ඔස්සේ සශ්‍රික දිව්‍ය විමානයක යස ඉසුරු හිමිකර ගත්තා. මිථ්‍යාදෘෂ්ඨික තරුණයෙක්ව සිටි ඡත්ත බුදුරජාණන් වහන්සේව සැකකළේ නැහැ. සොරු විසින් මරාදමන මොහොතේ සිත කිලිටිකර ගත්තේ නැහැ. තෙරුවන් කෙරෙහිම විශ්වාසය තහවුරු කර ගත්තා.

නමුත් ඔබ කල්පනා කර බලන්න. ඔබට පාර පෙන්වන, ඔබ පාර අසාගන්නා වැඩිහිටියන්, ගුරුවරුන් ඔබට පාර පෙන්වන්නේ කොතැනකට යන්නද කියන වග.

උපාධියක්, රැකියාවක්, විවාහයක්, ගෙයක් දොරක්, බැංකු ගිණුමක්, දරු මුණුබුරන්, ව්‍යාපාරයක්, කොටින්ම විශ්‍රාමයක් නොමැති ගෞරවනීය විශ්‍රාමිකයෙක් වීමට නේද? උපරිම වසර 100 ක මේ කසල ජීවිතයකට නේද?

'කසල' කියන වචනය පාවිච්චි කළේ ඡත්ත තරුණයා ලැබූ සශ්‍රික දිව්‍ය ජීවිතය සමග මනුෂ්‍ය ජීවිතය සසඳලයි. ඒ දිව්‍ය සැපයන් සමග ඕනෑම ප්‍රමාදී මනුෂ්‍ය ජීවිතයක් කියන්නේ කසල ගොඩක්ම තමයි.

ලොව්තුරා බුදුරජාණන් වහන්සේලා ලෝකයට පාර පෙන්වන්නේ ඔබව උපරිම සැපයට ඔසවා තැබීමටයි. ඒ නිසා එම උත්තම

ධර්ම මාර්ගය ඔබ ඔබේ මාර්ගය කරගැනීමට දක්ෂවෙන්න. මිථ්‍යාදෘෂ්ඨික ඡත්ත තරුණයා තෙරුවන් කෙරෙහි යම් ශ්‍රද්ධාවක් ඇතිකරගත්තා නම්, විශ්වාසයක් ඇති කරගත්තා නම් ඔබද ජීවිතය ඉදිරියට එන ඕනෑම අභියෝගයක් හමුවේ එම විශ්වාසයෙන් නොමිදෙන්න. ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ මහා කරුණා ගුණය ඔබ ඔබේ ආරක්ෂකයා කරගන්න. රැකවරණය කරගන්න. වැරදි ආරක්ෂාවන්, රැකවලුන් සොයාගෙන නොයන්න. ජීවිතයේ එකම ආරක්ෂාව යැයි සිතා දෙදෙනා, දෙදෙනාගේ ආරක්ෂකයින් වන බවට සපථ වෙමින්, රන් නූලෙන් ඔබලාගේ දෑගිලි බැඳුනත්, එම බන්ධනය දෙදෙනාටම භව අනාරක්ෂිත වීමටම හේතුවන බව දකින්න.

# බුදුරජුන්ගෙන් පාර නෑසූ අවාසනාවන්තිය

අපි ඉකුත් සටහනක සඳහන් කළා ආදරය ගැන. ආදරයත් මාරයාත් මොනතරම් සමීප දෙදෙනෙක්ද කියලා පැහැදිලි කිරීමක් කළා. මාරයා ඔබව ලෝකය තුළ බැඳ තබන රන් නූල තමයි ආදරය. ආදරයට පුළුවන් සත්වයෙක්ව උම්මත්තකයෙක්, මිනීමරුවෙක්, සියදිවි නසා ගන්නෙක්, යහපත් මනුෂ්‍යයෙක් කියන ඕනෑම චරිතකයකට ආරෝපණය කරන්න. රූපය හැටියට ගත්තත්, පංචඋපාදනස්කන්ධය හැටියට ගත්තත් මේ හේතුන් ප්‍රමාණවත් මාරයත්, ආදරයත් අතර තිබෙන සම්බන්ධය දැක ගන්න.

රූපයට ද්වේෂ කරලා වගේම රූපයට මෛත්‍රිය කරලත් වැඩක් නැහැ. රූපය කියන්නේ ඇස් බැන්දුමක්. රූපය තිබෙන්නේ විඳීමට නොවේ. අවබෝධ කරගන්නයි. යමෙක් රූපය සතුටින් ගනී නම්, ඒ ඔහු සතුටින් ගන්නේ අනවබෝධයයි. සමාජය දෙස බැලීමේදී පේනවා මේ අනවබෝධය කිරුළු පළඳවාගත් අප්‍රමාණ පිරිස්. මේ අයව අපට විවේචනය කරන්න බැහැ. මොකද කවදත් එය ලෝකයේ ස්වභාවයක්. ඒ කියන්නේ ධර්මතාවයක්.

ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා සත්ත්වයා බැඳුනොත් බැඳෙන්නේ පංචඋපාදානස්කන්ධයටය කියලා. සත්ත්වයා නිදහස් වුනොත් ඒ නිදහස් වෙන්නෙත් පංචඋපදාන ස්කන්ධයෙන්මය කියලා. රූප දෙකක් එකට තියලා මාරයා බඳින බැඳීම තමයි පංචඋපදානස්කන්ධය කියලා කියන්නේ. ඔබ රැවටෙන්න පුළුවන් බඳින රන් නූලට. දැනෙන උණුසුමට. 'අහා...

ආදරයේ චමත්කාරය' කියලා. නමුත් මේ චමත්කාරය පසුපස සැඟවුණු සෙවනැල්ලක් තිබෙනවා. එයා ඉන්නේ නිතරම සැඟවිලා. රූපලාවන්‍යයෙන් මුහුණේ තිබෙන ලප, කැළැල් වසා දමනවා වගේ, මෙයා ඉන්නේ යටපත් වෙලා. ඒ තමයි ද්වේෂය. නන්නාඳුනන බවක් පෙන්වුවද ආදරයත්, ද්වේශයත් මොන තරම් සමීපද. මේ සමීපභාවය හඳුනානොගත් නිසා මනුෂ්‍යයා මොනතරම් පීඩාවන් අත්විඳිනවාද. අයාලයේ යන අකීකරු සිත ඔබ ධර්මයෙන් නතුකර ගැනීමට අදක්ෂ වුවහොත් ආදරය නිසාම ඔබතුළ ද්වේශයද සකස්වනු ඇත.

ආදරය නිසා ද්වේශය සකස්වී තම සුන්දර පාසල් ජීවිතය. නිරයේ ගිනි ජාලාවක් මතට පත්කොට ගත්, ලොව්තුරා බුදුරජාණන් වහන්සේගෙන් පාර අසා නොගත්, අවාසනාවන්තියකගේ කථාවක්, ඉහත සටහනේ අර්ථය ඔබට අවබෝධ කර ගැනීම පිණිස සඳහන් කරනවා.

මේ තබන සටහන, පින්වත් තරුණ ඔබට ආදරයේ නාමයෙන් යම් තීරණයක් ගැනීමට ප්‍රථම, ධර්මයේ නාමයෙන් එම තීරණය ගැන දෙවරක් සිතා බලන්නට පොළඹවාවී.

ජීවිතයේ අතිදුෂ්කර අවස්ථාවකදී, තීරණාත්මක අවස්ථාවකදී, ඔබේ අකීකරු සිතට ඉඩ නොදී, බුදුරජාණන් වහන්සේ ඡත්ත තරුණයාට පිහිටවූ ඒ මහා කරුණා ගුණයේ ආශ්චර්යමත් රැකවරණය, පිළිසරණ ලැබීමට ධර්ම මනසිකාරයක්ම සිහිපත් කරගන්නට ඔබව පොළඹවාවී.

සිත කියන්නේ අංක එකේ රස්තියාදුකාරයෙක් කීවොත් එය වරදක් නැහැ. මේ ජීවිතයේදී පමණක් නොවේ. අතීත, අනාගත භවයන්හිදී, සත්ත්වයාට දුකත් සැපත් උරුමකොට දෙමින් ඇවිද්දවන්නේ අවිද්‍යාවෙන් පෝෂණය වූ සිත විසින්මය. නොසන්සුන් සිතක ස්වභාවය ඔබ අත්විඳලා තිබෙනවනේ. එවැනි අවස්ථාවක ඔබට මොනතරම් ආවේගශීලී අදහස්ද ඇතිවන්නේ. අතීතයේදී තම සිතේ ක්‍රියාකාරීත්වය සකස්වූ ස්වභාවය මතකයට

නැගෙන කොට, මෙය සටහන් තබන භික්ෂුවට හිතෙනවා, මේ අකීකරු, රස්තියාදුකාර, මාන්නක්කාර නැහැදිච්ච සිත දමනය කරගත්තේ කොහොමද කියලා. එය මොනතරම් ආශ්චර්යයක්ද කියලා. ඒ උදෙසා කළ කැපකිරීම කොතරම්ද කියලා. මෙහෙම හිතෙනකොට ලොව්තුරා බුදුරජාණන් වහන්සේට අප්‍රමාණ වාරයක් හදවතින් වන්දනා කරනවා. උන්වහන්සේමයි මාර්ගය වුනේ. උන්වහන්සේමයි පිළිසරණ වුනේ. උන්වහන්සේමයි රැකවරණය වුනේ. අන්න ඒ විශ්වාසය ජීවිතය තුළ ඇතිකර නොගත් සමහරක් දෙමව්පියන්ගේත්, එවැනි දෙමව්පියන්ගේ වරදින් විනාශය ඇතිකරගත් දරුවන්ගේත් කථාවක් දූන් පහත සටහන් තබනවා.

ග්‍රාමීය ප්‍රදේශයක ජීවත්වුණ පවුලක් සිටියා. පවුලේ සාමාජිකයන් හතරදෙනයි. මෙම කථාවේ ප්‍රධාන චරිතය තමයි පවුලේ බාල දියණිය. මේ දියණිය කුඩා වයසේදීම තම පියා මියයනවා. පියා මියයන්නේ වස පානය කර සියදිවි නසා ගැනීමෙන්. මේ නිසා ළදරු වයසේදීම මේ දියණියට පිය සෙනෙහස අහිමිවෙනවා. ස්වාමියාගේ වියෝවෙන් පසුව මව දැඩි ලෙස වෙහෙසක් ගෙන දරුවන් ලොකු මහත් කරගන්නවා. මෙහෙම කාලයක් ගතවෙන කොට මවට විදේශ රටක ගෘහ සේවිකා රැකියාවක් ලැබී විදේශගත වෙනවා. පහළොස් හැවිරිදි දියණියත්, ඇයගේ සොයුරාත් මිත්තනියගේ භාරයේ තබා මව විදේශයට යනවා. මවගේ විදේශගත වීමෙන් මෙම පහළොස් හැවිරිදි දියණියට මව් සෙනෙහසද අහිමිවෙනවා. ආච්චිගේ නිවසේ සිට පාසල් යන දියණියට අවශ්‍ය සියළු වියහියදම් විදේශ රැකියාවේ නියුතු මව මාස්පතා එවනවා. නමුත් දියණියගේ මව විදේශ රැකියාව කෙරෙහි ඇතිකරගත් දැඩි තෘෂ්ණාව නිසාම, දීර්ඝ කාලයක් පුරා නැවත නැවත විදේශගත වෙනවා. මේ හේතුවෙන්ව කුඩා කාලයේදීම පිය සෙනෙහස සහමුළින්ම අහිමිවූ දියණියට මව් සෙනෙහසද ඈත්වම යනවා. මව්පිය සෙනෙහස අහිමිවීමෙන් මානසික පීඩනයට පත්වෙන මේ දියණිය පාසලේ සමවයසේ ශිෂ්‍යයෙක් සමග ප්‍රේම සම්බන්ධතාවකට මුල පුරනවා.

දූන් දෙදෙනා හොඳ පෙම්වතුන්. මේ යොවුන් පාසල් වයසේ ප්‍රේමය පළමුව පාසලේ අයත් දෙවැනුව ගමේ අයත් දැනගන්නවා. හොර රහසේ කරගෙන ගිය මේ ආදරය හෙළිවීමෙන් ගැහැණු දරුවාට වඩා වත්පොහොසත්කම්වලින් වැඩි පිරිමි දරුවාගේ දෙමාපියන්, ඥාතීන් පිරිමි දරුවාට මේ සම්බන්ධය නවතා දමන ලෙස අවවාද කරනවා. මේ බලපෑම් ඉවසාගත නොහැකි තැන මේ පාසල් ශිෂ්‍යයා සියදිවි නසාගන්නවා. මේ ළාබාල පාසල් ශිෂ්‍යයාගේ සියදිවි නසාගැනීම ගැන ගමත්, පාසලත් දැඩි ලෙස කම්පාවෙනවා. මියගිය පිරිමි දරුවාගේ ඥාතීන් සැම දෙනාම තම පුතාගේ දිවිනසා ගැනීමට හේතුව වශයෙන් දකින්නේ, දෙමාපියන්ගේ රැකවරණය අහිමිවූ, වයෝවෘද්ධ මිත්තනිය භාරයේ සිටි යොවුන් පෙම්වතියවයි. මේ හේතුව නිසා පාසල් වයසේ පසුවූ මේ දියණියට පිරිමි දරුවාගේ පාර්ශ්වයෙන් දැඩි ලෙස විරෝධය, ඇනුම් බැනුම් එල්ලවෙනවා. පහළොස් හැවිරිදි වියේ පසුවූ පාසල් ශිෂ්‍යාවක වන ඇයට දරාගැනීමට නොහැකි ආකාරයෙන් චෝදනා එල්ලවෙද්දී, දෙමාපිය හවුහරණද නොමැති ඇය දැඩිව තීරණය කරනවා තමාද සියදිවි නසාගෙන තම පෙම්වතා ගිය ලෝකයටම යනවා කියලා.

මේ වනවිට ඇය සිය පාසල් මිතුරියන්ට පවසා තිබුණා, මියගිය තම පෙම්වතා රාත්‍රියේ සිහිනෙන් ඇවිත් තමන්ට කථා කරන බව. නිරතුරුවම ඔහු සිටින ලෝකයට එන්න කියලා අඬගසන බව. මේ මනෝභාවය නිසාත්, පෙම්වතාගේ පාර්ශ්වයෙන් එල්ලවන ඇනුම් බැනුම් විවේචන නිසාත්, සියදිවි නසාගැනීමේ තීරණය ඇය ඉක්මන් කරනවා. ආදරය කියන වචනයේ අර්ථයවත් නොදන, හුදෙකලා භාවය නිසාම, දෙමව්පිය සෙනෙහස නොලැබුණු නිසාම, බොළඳ ප්‍රේමයක කටුකබව අත්විඳින මෙම පහළොස් හැවිරිදි දියණිය එක්තරා මොහොතක තීරණයක් ගන්නවා. ඒ තමා දැඩි ලෙස ආදරය කළ, තම ආදරය නිසාම සියදිවි නසා ගත් තම පෙම්වතා වෙනුවෙන් ඔහුගේ ලෝකයට යන්නට. තමන් නොකළ වරදකට 'අපේ පුතා මරාගත්ත පව්කාරී' යැයි

දැඩි ආකාරයෙන් ඇනුම් බැනුම් එල්ල කරන ලෝකයාගෙන් මිදිය යුතුයැයි සියදිවි හානිකර ගැනීමට ඇය ස්ථිරවම තීරණයකට එළඹියා.

ඇය පෑනක් කොළයක් ගෙන බොහොම සංවේදීව ලිපියක් ලියනවා. මගේ ආදරණීය පෙම්වතා නිතරම සිහිනෙන් ඇවිත් මට එයාගේ ලෝකයට එන්න කියලා අඬගසනවා. මේ ලෝකයේ මා වෙනුවෙන් සිටියේ ඔහු පමණයි. ඒ නිසා මම ඔහුගේ ලෝකයට යනවා. මේ විෂම මිනිසුන්ගෙන් මිදිලා ඔහු සමග සතුටින් ජීවත්වීමට.

දෙවැනුව ඇය සටහන් කරනවා, නොකළ වරදකට මට චෝදනා කරන මේ සමාජයේ තවදුරටත් ජීවත්වෙන්න බෑ. මම මගේ පෙම්වතා ළඟට යනවා. මම මැරුණට පසුව මගේ දේහය සහිත පෙට්ටිය මත මල්වට්ටි දෙකක් තබන්න. ඉන් එකක් මට. අනික මගේ පෙම්වතාට. මගේ දේහය වළ දැමූ පසු එම වළ මත සුදු මල්ගස් දෙකක් සිටුවන්න. එකක් මගේ නමින්. අනික මගේ පෙම්වතාගේ නමින්.

බොහෝම සංයමයෙන්, කලබලකාරී බවකින් තොරව, තමාට චෝදනා කරන මිනිසුන් කෙරෙහි දැඩි කලකිරීමකින්, තම මියගිය පිංවතා සිටින ලෝකය කෙරෙහි දැඩි උපාදානයක් සකස්කරගෙන, ඉහත සටහන කොළයක ලියා සුරැකිව මේසයක් මත තබා, මව විදේශගතවීම හේතුවෙන් වසාදමා තිබූ තම නිවසට ඇතුළුවී බාල්කයකට ලණුපොටක් දමා සිය දිවි නසාගන්නවා. මේ සියල්ල සිද්ධවෙද්දී මෙම දියණියගේ මව සිටියේ විදේශගතව. ඉහත සිද්ධිය රටේ යම් ප්‍රදේශයක සිදුවූ අතිශයින් අවාසනාවන්ත, සත්‍ය සිදුවීමක්. මේ සිද්ධිය දැනගත් සෑම මනුෂ්‍යයෙක්ම අතිශය කම්පාවට පත්වුනා මේ යොවුන් වියේ දරුවෝ අකාලයේ මියයෑම ගැන.

දැන් ඔබට සිතෙන ආකාරයට, ඔබ කර්මය කර්ම ඵලය ගලපා ගන්නා ආකාරයට දකින්න උත්සාහගන්න මේ සියදිවි නසාගත් දියණිය කුමන ප්‍රතිසන්ධියක් ලබන්න ඇතිද කියලා.

ඇය සියදිවි නසාගැනීමට පෙර බොහෝම සංයමයෙන්, කලබලකාරී බවකින් තොරවයි අවසන් ලියුම ලියන්නේ. එම ලිපියෙන් ඇය කියනවා, ඇයට මියගිය පෙම්වතා සිහිනෙන් ඇවිත් අඬගහන බව. සුදුමල් වට්ටි, සුදුමල් ගස් ගැන කියනවා. ඇය කාටවත් දැඩි ආකාරයෙන් ද්වේශ කරන අයුරක් එම ලිපියෙන් හැඟෙන්නේ නැහැ. ඉහත කරුණු කාරණා ගලපා ගැනීමෙන් ඔබ සිතන්නේ ඇය මරණින් මතු කුමන තැනක උපත ලබන්න ඇතැයි කියලාද?

දැන් පින්වත් ඔබ ඔබට දැනෙන ආකාරයට පිළිතුරක් සිතාගත්තාද?

ඔබ පිළිතුරක් සිතුවා නම් පහත සටහන කියවා එම පිළිතුර නිවැරදිදැයි දැනගන්න. ඔබේ පිළිතුර නිවැරදි නම් ඔබේ කර්මය, කර්මඵලය ගැන දැනීම නිවැරදි බව දැනගන්න. එහෙත් ඔබ ඔබට ලකුණු දෙන්න යන්න එපා. ලකුණු ගැනීමට ඇති කැමැත්ත අඩුකොට, ගුණාත්මක අවබෝධය දෙසටම යන්න. මෙම සටහනේ කරුණු පින්වත් ඔබ පිළිනොගන්නේ නම් එය ප්‍රතික්ෂේප කරන්න. පිළිගැනීමත් ප්‍රතික්ෂේප කිරීමත් ලෝක ධර්මයක් බව දකින්න.

එක් භික්ෂුවක් උතුම් සමාධියෙන් පසුවෙද්දී මේ මියගිය දියණියගේ නැවත උපත කිනම් ස්ථානයක සිදුවූවාදැයි අරමුණු කර බලනවා. එවිට භික්ෂුවට දර්ශනය වෙනවා හරි හතරැස් ගිණි ජාලාවක්. මේ ගිනිජාලාවේ ප්‍රමාණය ස්ථිරව කියන්න බැහැ. එය අඩි 10ක් දිගයි, අඩි 10ක් පළලයි කියලා ගත්තොත් ඒ ප්‍රමාණයටමම පෙනෙනවා. එම ගිණි ජාලාව අඩි 100ක් දිගයි, අඩි 100ක් පළලයි කියලා ගත්තොත් එම ප්‍රමාණයට පෙනෙනවා. ඒ ස්වභාවය ආශ්චර්යයක්. දිගක්, පළලක් ප්‍රමාණය කරන්න බැහැ. මේ ගින්න තැඹිලිපාට සහ කහපාට මිශ්‍ර ගින්නක්. කිසිම දුමක්, අඟුරු කැබැල්ලක්, අළු ටිකක්, ඉතාමත් සියුම් වශයෙන් හෝ එම ගිනි ජාලාවේ පෙනෙන්නට නැහැ. කළු පැහැයත්, රතු පැහැයත්, නිල් පැහැයත් එම ගිනි ජාලාවේ පෙනෙන්නට නැහැ. ප්‍රභාශ්වර, ඉතාමත් ආලෝකමත් පිරිසිදු කහ සහ තැඹිලි පැහැති ගිනි දළු

පමණයි. මේ ගිනිදළු අපිරිසිදු දේ පෙරාගත් පිරිසිදු ගිනිදළුයි. භික්‍ෂුව උතුම් සමාධියෙන් මේ දකින්නේ එක් ස්වභාවයක්.

ඒ කියන්නේ සියදිවි නසාගත් දියණිය මරණින් මතු නිරයේ ගිනි ජාලා මත උපත ලබා ඇති බවයි. මෙම සිද්ධියෙන් පැහැදිලිවන්නේ ඇය එම ගිනිදළු නිරයේ උපත ලබා අතිශය වේදනාත්මක දුකකට වැටී ඇති බවයි.

පින්වත් ඔබට දැන් ප්‍රශ්නයක් මතුවෙන්න පුළුවන් මෙම පාසල් දියණිය සියදිවි නසා ගැනීමට පෙරාතුව බොහොම සංයමයෙන් සිය අවසාන ලිපිය ලියාපු කෙනෙක්. ඒ ලියන මොහොතේත් දරුණු ද්වේශයක් සිතේ තිබුණු බවක් ලිපියේ අදහස් තුළින් පෙනෙන්නේ නැහැ. එම ලිපියේ මල්වට්ටි ගැන, මල්ගස් ගැන සඳහන්ව තිබුණා. එහෙම සිතුවිලි සකස්වුණ කෙනෙක්ව කොහොමද මේ සා දරුණු නිරයකට වැටුනේ කියලා.

එම කාරණය පින්වත් ඔබ සතියෙන් සිහියෙන් යුතුව මෙහෙම තේරුම් ගන්න අවශ්‍යයි. ඇය අදාළ ලිපිය ලියන මොහොතේ තම මියගිය පෙම්වතා, තමාට ඔහුගේ ලෝකයට එන්න කියලා කථා කරනවා කියන තෘෂ්ණාව තුළ ඇතිවූ සතුටින් තමයි සියදිවි නසාගැනීමට සූදානම් වෙන්නේ. තීරණය ගත්තාට පසුව පාළු ගෙදර වහලයට ලණුව දමලා තොණ්ඩුව සකස් කරන්නෙත් බොහොම කැමැත්තෙන්. පෙම්වතාගේ ලෝකය කෙරෙහි ඇති ඡන්ද රාගය නිසාමයි.  ගමේ මිනිසුන්ගෙන් එල්ල වන චෝදනා නිසා ඇතිවන කලකිරීම මතින් තම පෙම්වතා සිටින එම ලෝකය කෙරෙහි ඇති ඡන්ද රාගය තවත් වැඩිවෙනවා. ඒ එම චෝදනා අභියස ඇය තව තවත් හුදෙකලා වූ නිසයි. මෙන්න මේ මනෝභාවයෙන් තමයි සිය කැමැත්තෙන්ම තොණ්ඩුව ගෙලට දමාගන්නෙත්. තොණ්ඩුව ගෙලට දාගන්නෙත් සිය පෙම්වතා සිටින ලෝකයට යෑමේ තෘෂ්ණාවෙන්. නමුත් බෙල්ලට තොණ්ඩුව හිරවෙනකොට, එක් ක්‍ෂණයකින් මියයන්නේ නැහැ. ඇය දඟලලා උගුරු දණ්ඩ කඩාගෙන ඕනේ මියයන්න.

තොන්ඩුව බෙල්ලට දමා පහළට පැනීමත්, අවසන් හුස්ම පොද නික්මීමත් අතර තිබෙන කාල පරාසය තුළ ඇය අත්විඳින්නේ මරණීය දරුණු වේදනාවක්. එම දැඩි මරණ වේදනාවේදී ඇයට මියගිය සිය පෙම්වතා පිළිබඳව තෘෂ්ණාවක් නොවෙයි සකස්වෙන්නේ. මරණීය වේදනාවෙන් තොණ්ඩුවේ එල්ලී වියරුවෙන් දඟලනකොට තමා කෙරෙහිම තමාට ද්වේශයකුයි සකස්වෙන්නේ. තමාව එතැනට ඇද දැමූ තමාට වෛර කළ ඥාතීන්, ගම්වැසියන් ගැන ද්වේශයකුයි සකස්වෙන්නේ. ඒ වෙලාවට මල් වට්ටි, සුදුමල් ගස්, සුරංගනා ලොවක සිටිනවායැයි සිතූ තම පෙම්වතා මතක් වෙන්නේ නැහැ. තමා කරගත් මෝහ මූලික ක්‍රියාව නිසා, තමා තුළම තමා කෙරෙහි ඇතිවන්නා වූ ද්වේශය බොහොම භයානක අකුසලයක්. මෙන්න මේ ද්වේශ සහගත අවසාන චුති සිත නිසාමයි මරණින් මතු ඇය නිරයේ ගිනිජාලාව මත උපත ලබන්නට ඇත්තේ.

ඉහත පිළිතුර සමග දැන් පින්වත් ඔබ දැන් ඔබ මුලින් අනුමාන කළ පිළිතුර හරිදැයි ගලපා බලන්න. පින්වත් ඔබ මෙවැනි යෞවන වයසේ අයෙකුගේ මරණයකදී හුඟක් වේලාවට ඒ අය සුගතිගාමී ජීවිත ලබන බවයි විශ්වාස කරන්නේ. එම සිතුවිල්ල ඔබතුළ ඇතිවන්නේ මැරෙන අයගේත්, මැරෙන්න භාවිතා කරන ක්‍රමවේදයේත්, මරණයට හේතුවන අහිංසක භාවයත් නිසාමයි. නමුත් මෙම සිද්ධියෙන් පින්වත් ඔබට හොඳින් පැහැදිළියි එම මතය නිවැරදි නොවන බව.

භික්ෂුව එම දියණිය ස්ථිර වශයෙන්ම නිරයේ ගිනිදැල් මත අපාදුක් විඳින බව දැනගත් පසුව මෙවැනි දරුණු, වියරු අපා දුකක් අත්විඳීමට හේතුවූ, එවැනි දුකකට වැටීමට හේතුවූ කරුණු ඇගේ ජීවිතයට ඇතුළුවූයේ, ඇය අතීතයේ කුමන අකුසල කර්මයක් කළ නිසාද යන්න දැනගැනීමට ඇයගේ පෙර ජීවිතය, ඒ කියන්නේ පාසල් දියණියක්ව ඉපදීමට පෙර ජීවිතය කුමක්ද කියලා අරමුණු කර බලනවා.

එහෙම අරමුණුකර බලන්න භික්ෂුවට අවශ්‍ය වුණේ ඇය පාසල් දියණියක්ව ඉපදුණු ජීවිතයේදී, ඇයට ඉතා දරුණු ආකාරයේ අකුසල කර්මයන් තම ජීවිතය තුළින් විපාක දීමට සිදුවීම නිසයි. පළවෙනි කාරණය තමයි දුප්පත් පවුලක ඉපදීම, කුඩා කාලයේදීම තම පියා සියදිවි නසා ගැනීම නිසා අහිමි වීම, ඒ කියන්නේ පිය සෙනෙහස අහිමි වීම, පාසල් වයසේදීම මවද විදේශගත වීම නිසා මව් සෙනෙහසද අහිමි වීම, ලාබාල වයසේදීම ප්‍රේම සම්බන්ධතාවක් ඇතිකර ගැනීම, කෙටි කලකින් එම පෙම්වතාද සියදිවි නසාගැනීම, සමාජයෙන්, ඥාතීන්ගෙන්, ගුරුවරුන්ගෙන් චෝදනා අපවාද එල්ලවීම, අවසානයේදී තමාගේ ජීවිතය තමා අතින්ම නැතිකර ගැනීම පිණිස කරුණු කාරණා සකස්වීම ආදී මේ සියලු කාරණා අහම්බයෙන් ඇයගේ ජීවිතයට පැමිණි දේවල් නොවේ.

ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා සත්ත්වයා කර්මය දායාද කොටගෙන උපදී කියලා. කර්මය මගේ කොට ගෙන ජීවත්වෙයි කියලා. මේ කාරණයෙන් ඉතා පැහැදිළියි, ඉහත ඇය මුහුණ දුන් සියලු ජීවිත බාධක ඇගේ පෙර ජීවිතවල සිදුවූ අකුසලයන් බවට. ඒ නිසාමයි භික්ෂුව ඇයගේ පෙර ජීවිතය අරමුණුකර බලන්නේ. භික්ෂුවට අරමුණු වෙන්නේ ඇය පෙර ජීවිතයේදී භූත ස්වභාවයේ සත්ත්වයෙක් ලෙස උපත ලබා සිටි බවයි. භික්ෂුවට ඉතා හොඳින්ම සමාධිය තුළදී දර්ශනය වෙනවා, අඩි 2 ක් පමණ දිගැති ශරීරයක් ඇති කුඩා බෝනික්කකුගේ ස්වරූපය සහිත කොණ්ඩය කරල් දෙකකට ඉතා හොඳින් ගොතා බැඳ ඇති ගැහැණු ළමා රූපයක් හිස් අවකාශයේ පාවෙමිනුයි මෙම භූත ගැහැණු දරුවා සිටින්නේ. ඇය ඇස, කන, නාසය, දිව, මන, කය කියන ආයතන හය සහිත සත්ත්වයෙක්. නමුත් දෙපා බිම තබාගෙන නොවේ ඇය සිටින්නේ. භූත ස්වභාවයේම පාවෙන ළමා ගැහැණු ස්වරූපයේ සත්ත්වයෙක්. එම භූත ස්වභාවයේ සිඟිති දැරිය අරමුණුවීමෙන් පසුව භික්ෂුව ඇගේ ඊටත් පෙර ජීවිතය අරමුණුකර බලනවා. මොකද මෙතෙක් භික්ෂුවට

අරමුණු වුනේ නැහැ ඇය අතීතයේ කරන ලද අකුසල් විපාකය කුමක්ද කියලා. එම නිසාමයි භූත ස්වභාවයට පෙර ජීවිතය අරමුණු කර බලන්නේ.

එම අවස්ථාවේ උතුම් සමාධියේදී භික්ෂුවට අරමුණු වෙනවා වයස අවුරුදු හතේ පමණ ගැහැණු දූරියක්. දැන් පින්වත් ඔබ හොඳින් සිතන්න මේ මොහොතේ ඇය අපායේ ගිණිදළු අතර දුක් විඳින නිරි සතෙක්. ඊට පෙර ජීවිතය භූත ස්වභාවයේ පාවෙන ළදූරියක්. ඊටත් පෙර ජීවිතයේදී ඇය වයස අවුරුදු හතක පමණ වන මනුෂ්‍ය දියණියක්. තවමත් මුලින් සඳහන් කළ විපාකයන්ට හේතුවූ බරපතළ අකුසල කර්මය හෙළිවුනේ නැහැ. මෙම දියණියගේ ජීවිත හතරක් අරමුණුවෙලාත්... නැවතත් භික්ෂුව අරමුණුකර බලනවා වයස අවුරුදු හතක පමණ දූරියක්ව සිට මියයෑමට පෙර ජීවිතයේදී ඇය ලබා තිබූ ජීවිතය කුමක්ද කියලා. ඒ කියන්නේ ඇය පිළිබඳව පස් වැනි ආත්මභාවයත්.. අන්න එතැනදී තමයි භික්ෂුවට ඉහත සියදිවි නසාගැනීමට හේතු සකස්වූ, දෙමාපියන් අහිමිවීමට හේතු සකස්වූ, පෙම්වතා සියදිවි නසාගැනීමට හේතු සකස්වූ අකුසල් කර්මය අරමුණු වෙන්නේ.

ඇගේ එම ජීවිතයේදී වයස අවුරුදු විසිපහක පමණ කාන්තාවක් ලෙසින් භික්ෂුවට අරමුණු වෙනවා. සමාධියේදී දුටු එම කාන්තාවක් දරුගැබක් කුසේ දරාගෙන සිටින කාන්තාවක්. ඇය සිය දෑතින් කුස මිරිකමින් තම කුසේ සිටින දරුවා ගබ්සා කරනවා. භික්ෂුවට හොඳින් දර්ශනය වෙනවා ඇය ගර්භාෂය දෑතින් පොඩි කරන ආකාරය. මෙතැන තමයි මේ දරුණු අකුසලයේ ආරම්භය.

දැන් අපි එතැන ඉඳලා පහළට එමු.

මනුෂ්‍ය ලෝකයේ කාන්තාවක්ව ඉපිද තමාගේම කුසේ ඇතිවූ කලල රූපය ගබ්සා කර, මරා දමනවා. එම අකුසලය නිසා නැවත මනුෂ්‍ය ලෝකයේම මිනිස් දියණියක්ව ඉපිද වයස අවුරුදු හතේදී පමණ අඩු වයසින් මියයනවා. වයස අවුරුදු හතේදී අඩු ආයුෂින් මිය යෑමේදී ශක්තිමත් කුසල් අකුසල් සිතක් සකස් නොවීම

නිසාම භූත ස්වභාවයේ පාවෙන භූත දූරියක්ව ඉපදෙනවා. එම භූත දූරිය කුමක් හෝ පිනක් අනුමෝදන්ව නැවත දුප්පත් මව්කුසක දූරියක්ව උපත ලබනවා. මේ ලැබූ උපත තමයි පාසල් දූරියක් ලෙසින් දිවි නසාගත් දියණිය.

ඉහත සටහනේ ජීවිත පහක් පිළිබඳ කථාවක් කියවෙනවා. ඒ කියන්නේ මෙයට ජීවිත හතරකට පෙර ඇය ලැබූ ඒ කාන්තා ජීවිතයේදී තමාගේ දරුගැබ තමා විසින්ම විනාශ කර මරාදැමීම නිසා එහි අකුසල් විපාකය, ප්‍රාණඝාත අකුසලය ජීවිත හතරක් පසුවටත් විපාක දෙමින් පැමිණ අවසානයේ එම අකුසලය විසින්ම ඇති කරන විපාක හේතුවෙන් ඇයව නිරයේ ගිණිදළු මතට ඇද දමනවා. තමගේ කුසේ සිටින හයක් හතරක් නොදන්නා ලේ කැටි දරුවා තමා විසින්ම ගබ්සා කිරීමට ගැලපෙන ආකාරයටමයි ඇයට කර්මය විපාක දෙන්නේ. අකුසලයේ ප්‍රතිබිම්බයමයි. විපාකයේ වෙනසක් නැහැ. සම්බුදු වදන ඉතා හොඳින් අර්ථවත් වෙනවා. තම කුස උන් දරුවා මරාදැමීම නිසා ඊළඟ ජීවිතයේදී වයස අවුරුදු හතක් තරම් අඩු ආයුෂින් මියයනවා. නැවත භූත ස්වභාවයේ සත්ත්වයෙක්ව උපදිනවා. ඊළඟට මේ රටේ දුෂ්කර පෙදෙසක දුප්පත් අම්මා කෙනෙකුගේ මව් කුසේ ඉපදෙනවා. පුංචිකාලෙම තාත්තා සියදිවි නසා ගන්නවා. අම්මා ඈත් වෙනවා. පෙම්වතාද දිවි නසා ගන්නවා. සමාජයේ අපවාද, චෝදනා නැගෙනවා. අවසානයේ තමාත් සියදිවි නසාගෙන අපායේ ගිණිදළු මත අකුසල් විපාකය විඳිනවා. බලන්න, මෙයට ජීවිත හතරකට පෙර තම දරුගැබේ සිටි දරුවා මරාදැමුවා වගේම පියාත්, පෙම්වතාත්, අවසානයේ තමාත් සියදිවි නසා ගන්නා ඉරණමකට ලක්වෙනවා. මේ සිදුවීම්වල දුක පීඩනය තමා විසින් දරා ගන්නවා.

දැන් පින්වත් ඔබට පේනවාද අකුසල් විපාකවල බරපතළ භාවය. එය විපාකදෙමින් පැමිණෙන දුර. පින්වත් ඔබ ජීවත්වන සමාජයේ ගබ්සාව කියන අති අමානුෂික මනුෂ්‍ය ඝාතනය නීතිගත කරන්න කියලා රාවයන් ඇසෙනවා නේද? ගබ්සාවක් සිදුකරන

ආයතන අප්‍රමාණව රට තුළ ක්‍රියාත්මක වෙනවා නේද? මේවා නැති කරන්න පුළුවන් දේවල් නොවේ. මාරයාගේ ලෝකයේ කාමයේ, රාගයේ අස්වැන්න තමයි මේ ගබ්සාව. මනුෂ්‍යයාගේ සිත කාමයෙන් රාගයෙන් මත්වෙන්න මත්වෙන්න අස්වැන්න බහුල වෙනවා. සක්‍රිය වෙනවා. ඒකයි මේවා ලෝක ධර්මයන් කියලා සටහන් කළේ. මෙම සටහන කියවන ඔබ හික්මෙන්න. ජීවිතයේ කවදාවක්වත් ඉහත අකුසලය සිදු නොකරන බවට සිතාගන්න. අසම්මත දරුගැබක් ඔබට ලැබුණොත් එය මරා නොදමන්න. ලෝකයා අවමන් කරපුවාවේ. නින්දා කරපුවාවේ. ගල් ගැසුවාවේ. තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන් එම දරුවා ඔබ හදාවඩා ගන්න. එම දරුවාට මෛත්‍රිය කරන්න. එහෙම කළොත් ඔබට ලෝකයාගෙන් අපවාද නින්දා පැමිණේවී. නමුත් එසේ කිරීමෙන් ඔබව නිරයට නොවැටෙන බවට ලොව්තුරා බුදුරජාණන් වහන්සේ සහතිකයක් දෙනවා.

පින්වත් ඔබ ලොව්තුරා බුදුරජාණන් වහන්සේ පෙන්වූ පාර අමතක කොට, තෙරුවන් කෙරෙහි ඇති විශ්වාසයෙන් තොරව, ලෝකයාගෙන් නැගෙන අපවාද නින්දාවලට බියෙන් එම දරුගැබ මරාදැමුවොත් යම් දවසක නිරයේ වියරු ගිනිදැල් මතට පතිතවන බවට හොඳම උදාහරණය ඉහත සටහන තුළ තිබෙනවා. කැමති දේ ඔබ තෝරාගන්න. ශීලයේ අර්ථය ජීවිතයට එකතු කොට ගෙන ඉහත අවදානමින් පින්වත් ඔබ මිදෙන්න. තෙරුවන් කෙරෙහි ඇතිකරගන්නා අචල ශ්‍රද්ධාවත්, දන්දීම තුළින් ඇති කරගන්නා අත්හැරීමේ ශක්තියෙන් මෙන්ම මේ සියල්ල තුළින් මෝදුවන මෛත්‍රී ශක්තියෙන් ඉහත සතර අපායේ අවදානමින් ඔබව මුදවන ලොව්තුරා බුදුරජාණන් වහන්සේ පෙන්වා දුන් මාර්ගයට පින්වත් ඔබ පිය නගන්න.

# බෞද්ධ පින්වතුන්ගේ 'ජනප්‍රිය පැනය'

## (මස් මාංශ අනුභවය 1)

වර්තමාන සමාජය තුළ බෞද්ධ ජනතාවට ගැටලුවක් තියෙනවා. ඒ තමයි මාංශ, නිර්මාංශ ප්‍රශ්නය. මේ ප්‍රශ්නය දැඩි දෘෂ්ටියකට ගෙන සමහර පින්වතුන් තම මතයට විරුද්ධ කාණ්ඩයට එරෙහිව හැසිරෙනවා. කොහොම වුනත් සත්ත්ව හිංසාවත්, සත්ත්ව ඝාතනයත් නැවතිලා, මස් අනුභවය නිසා සෑදෙන සමහරක් රෝගවලිනුත් තොරවෙලා, සමාජයේ මෛත්‍රී කරුණාව නිරෝගී භාවය පිරී ඉතිරී ගියොත්, එය මොන තරම් සුන්දර දෙයක්ද?.

එවැනි පරිසරයකදී ඔබට වටලප්පමක්, කේක් කැබැල්ලක්, කට්ලට් එකක් අනුභව කරන්න පුළුවන් බියෙන් සැකෙන් තොරව.

ඒ වගේම රටේ සිටින, හරක්, එළුවෝ, ඌරෝ, කුකුලෝ ගහණය වැඩිවෙලා ඒ හේතුවෙන් හටගත් රෝග කාරක වසංගතයන් මිනිස් ප්‍රජාව විනාශ කොට දමන්නත් පුළුවන්. මෙවැනි සමාජයක් සිහිනයක් මිස යථාර්ථයක් නම් වෙන්න බෑ.

ලෝකය ගොඩනැගිලා තිබෙන්නේ හේතු ධර්ම තාවයන් අනුව. ඒ නිසා පැවැත්ම සකස් වෙන්නේ මෝහ මූලික ලෝකය තව තවත් පුළුල් වෙන දිශාවටමය. අවිද්‍යාව තුළම උපන් අධ්‍යාපනය තම සුවච කීකරු ගෝලයන් හැඩගස් වන්නේද, අවිද්‍යා ගුරුකුලයේ ස්ථිර පැවැත්ම උදෙසාය. මෙතැනදි තිරිසන් සත්ත්වයාද, මනුෂ්‍යයාද යන්න ප්‍රශ්නයක් නොවේ. වැදගත් වන්නේ තම ගුරුකුලයේ පැවැත්මයි. සංවර්ධනයයි. අවිද්‍යා ගුරුකුලයේ ඉලක්කය, අරමුණ යනු උපදින හැම මනුෂ්‍යයෙකුම මරණින්

මතු, මිථ්‍යාදෘෂ්ටික මනුෂ්‍යයෙක්, ප්‍රේතයෙක්, තිරිසන් සතෙක්, තිරිසතෙක්, අසුරයෙක් කිරීමය. මෙතෙක් ඔවුන්ගේ ප්‍රගති වාර්තාව, ඉලක්ක ඉක්මවා අනපේක්ෂිත ප්‍රගතියක් වාර්තාකොට ඇත.

සැබෑ ධර්ම මාර්ගය කොන්වී යන අනාගතයේදී, අවිද්‍යා ගුරුකුලයේ සැලසුම්කරුවන්, ලෝකය සැලසුම් කරන්නේ මනුෂ්‍යයාත්, තිරිසන් සතාත් සත්ත්වයින් දෙදෙනෙක් වශයෙන් සිතා නොව, එක සත්වයෙක් වශයෙන් සලකමින්ය. බුද්ධෝත්පත්ති කාලයක ලබන මනුෂ්‍ය ජීවිතයත්, තිරිසන් සත්ත්වයාත් අතර වෙනස ඔවුන් නොහඳුනයි. එහෙයින් අනාගත ලෝකයේ උපදින මනුෂ්‍යයා තිරිසන් සතාසේම, තම අම්මා, තාත්තා, පුතා, දුව නොහඳුනන පිරිසක් වනු ඇත. කර්මය, කර්මඵල හඳුනන්නේ නැති පිරිසක් වනු ඇත. ධර්මය, අධර්මය නොහඳුනන පිරිසක් වනු ඇත. ඔවුන් හඳුනනු ඇත්තේ තිරිසන් සත්ත්වයා සේම, කාමය, ආහාර සහ ආරක්ෂාව පමණක්ම වනු ඇත. මේ බිහිවන ලෝකය අවිද්‍යා ගුරුකුලයේ ඉලක්ක ගත ලෝකයයි. ඔවුන් එම ලෝකයට 'නිදහස් ලෝකය' යන නම්බු නාමයද පටබඳිනු ඇත.

එවිට ඔබ සීමා මායිම් නැති 'නිදහස් ලෝකයේ' නිදහසේ ජීවත්වන මිනිසුන්ය. සිරිත් විරිත්, චාරිත්‍ර අවශ්‍ය නැත. ඒවායින් නිදහස්ය. අවිද්‍යා ගුරුකුලයේ මේ ඊනියා නිදහස යනු ඔබව සතර අපායට වේගයෙන් පියමං කරවන නිදහසයි. දුක තීව්‍ර කරවන මාර්ගයේ නිදහසයි. අනාගත ලෝකයේ කවදාහරි දිනක සිදුවන කල්ප විනාශයන්, ලෝක විනාශයන් හා ඊට පෙර සිදුවන අතුරු විනාශයන් සඳහා මනුෂ්‍යයා විකෘතියක් විය යුතුය. විකෘතිය යනු, ගුණධර්ම පිරිහී ගිය, එකිනෙකා ඇන කොටා ගන්නා පිරිසක් විය යුතුය. තණ්හා, මාන, දිට්ඨියෙන් පිරී ගිය පිරිසක් විය යුතුය. රාග, ද්වේෂ, මෝහයෙන් පිරිගිය පිරිසක් විය යුතුය. අවිද්‍යා ගුරුකුලය මේ ගොඩ නගමින් පවතින්නේ එම සමාජ පසුබිමයි. අවිද්‍යා ගුරුකුලය යනු මෝහයෙන් බරිත,'ලෝකය සැපය' 'ලෝකය නිත්‍යය' යන මුලාවෙන් ඇතිවන මනුෂ්‍ය සිතමය. ඒ සිත නිසා අපි සැවොම මේ ගුරුකුලයේ ඒජන්තවරුය. සාමාජිකයෝය.

එහෙයින් සද්ධර්මය පවතින වර්තමානය ඔබ කළ යුත්තේ අනාගතයේදී බිහිවන විෂම, දුක පිරි ලෝකයෙන් ඉක්මනින්ම නිදහස්වීමය. මේ මොහොතේ ඔබට විවරව ඇති එම නිදහස්වීම අහුරන එක් මාර්ගයකි මේ මාංෂ නිර්මාංශ ප්‍රශ්නය.

සැබැවින්ම මේ ප්‍රශ්නය සුන්දරය. ශීලය පැත්තෙන්, කැපී පෙනීමෙන් ඉහළය. ඉලක්කගත පිරිසේ ආකර්ෂණය ප්‍රබලය. එහෙත් කණගාටුවෙන් වුවද කිව යුත්තේ ඔබ අල්ලාගෙන සිටිනුයේ සම්මා සම්බුද්ධ දේශනාවට පටහැණි අන්තයක් බවය. ආමගන්ධ යනු මස් මාළුවල පිළීගඳ නොව, තම කෙළෙස්වල ගඳ බව ආමගන්ධ සූත්‍රයේදී ලොව්තුරා බුදුරජාණන් වහනසේ පැහැදිලිව දේශනා කර ඇත. ඔබ තවමත් ලොව්තුරා බුදුරජාණන්වහන්සේ දෙශනාකොට වදාළ ධර්මයක් නොපිළිගන්නේ නම්, ඊට විරුද්ධ අර්ථයන් සපයන්නේ නම්, තවමත් ඔබ තෙරුවන් සරණ නොගිය අයෙකි.

භික්ෂුව මේ සටහන ලියන මොහොතේ වැඩ සිටින්නේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ කුටියකයි. මේ ප්‍රදේශයේ විශාල වශයෙන් හරක් ගාල් ඇත. එක් රංචුවක හරකුන් සියය දෙසීය සිටිනවා. මේ හරක් වැව් පිටිවල, වෙල් ලියැදිවල රංචු වශයෙන් හැසිරෙන කොට, එක රංචුවට වැතිරී ගිමන් හරිනකොට, මේ පාරේ එහා මෙහා යන දේශීය, විදේශීය සංචාරකයන් ඒ දර්ශනය දැකලා හරි තෘප්තියක් ලබනවා, ආශ්වාදයක් ලබනවා. වාහන නවතා ගෙන බලා සිටිනවා. නමුත් ඔබ මේ දැකලා තෘප්තිමත් වන, ආශ්වාදය ලබන දර්ශනය යටින්, ඔබට නොපෙනෙන ඛේදවාචකයක් තිබෙනවා. ඔය හරක් රංචුවල වයසට ගිය එළදෙනුන් සහ සාමාන්‍ය තරුණ වයස ඉක්මවූ පිරිමි සතුන් නැහැ. රංචුවේ බෝවීම උදෙසා පිරිමි සතුන් දෙතුන් දෙනෙක් විතරයි සිටින්නේ. ඔය හරක් රංචුවල ඔබ දකින්නේ තරුණ, මධ්‍යම වයසේ පසුවන එළදෙනුන් සහ පැටවුන් පමණයි. වැඩිහිටි, පැටවුන් නොලබන එළදෙනුන් සහ පිරිමි සතුන් මසට විකුණනවා. හැබැයි සමහර කෙනෙක් එහෙම නොකරනවාත් වෙන්න පුළුවන්.

බලන්න ඔබ ආශ්වාදය ලබන දර්ශනය යට මොන තරම් දුක්ඛිත කථාවක් සැඟවිලා තිබෙනවාද කියලා. ඔබ ඔය දැකලා ආශ්වාදය ලබන හැම සතෙක්ම වගේ අනාගතයේ දවසක මසට විකිණෙනවා. මෙන්න මේ සිද්ධියට සමානයි ඔය මස් මාංශ ප්‍රශ්නයත්. බාහිරින් මේ ප්‍රශ්නය හොඳ ඉල්ලුමක් ඇති, ආකර්ෂණීය, ජනප්‍රිය මාතෘකාවක් වුවද, මේ මස් මාංශ ප්‍රශ්නය තුළ, ඔබට නොපෙනෙන අති භයානක බේදවාචකයක් සැඟවී පවතිනවා. ඒ බේදවාචකය තමයි, සතර අපායෙන් ඔබ නිදහස ලබන තීරණාත්මක ධර්මතාවය වන, සක්කාය දිට්ඨිය, මමත්වයේ දැඩි භාවය, මේ මස් මාංශ ප්‍රශ්නය නිසා, ක්ෂය වීමේ පැත්තට නොගොස්, වර්ධනය වීමේ ස්වභාවයට පත්වීමයි. ‘මම නිර්මාංශයි’ ‘මම සිල්වත්’ ‘අනෙක් අය දුසිල්වත්’ ‘මගේ කුස සුසාන භූමියක් නොවේ’ මේ ආදී දෘෂ්ටීන් නිසා තණ්හාවත්, මාන්නයත්, තමා කෙරෙහි නිරතුරුවම වර්ධනය කරගන්නවා. ධර්ම මාර්ගයට පටහැණි දෘෂ්ටීන් මගේ කරගන්නවා. මේවා තුළින් වැඩෙන්නේ මමත්වයේ දැඩි භාවයමයි. ඔබ නිහතමානීව හොඳින් සිතන්න. ඔබට තේරුම් ගන්න බැරි වෙන්නේ නැහැ. ඔබ දක්ෂයි.

# මෛත්‍රිය දෘෂ්ටිය අනුභව කර මස් මාංශ නොකෑමෙන් පළක් වේද?

## (මස් මාංශ අනුභවය 2)

එක්තරා ගිහි පින්වතෙක් භික්ෂුවගෙන් ඇහුවා 'හාමුදුරුවෝ මස් මාංශ අනුභවය ගැන ඔබ වහන්සේ දරන අදහස මොකක්ද?' කියලා. එම පින්වතාට භික්ෂුව දුන්න පිළිතුර මෙහි සඳහන් කරනවා. ඔබ ගිහි පින්වතෙක් නිසයි භික්ෂුව මෙහෙම පිළිතුරක් දෙන්නේ. හැබැයි මේ පිළිතුර සමාජයේ සැමටම එකග නැහැ. එම පුද්ගලයා ලබා ඇති ධර්මාවබෝධය මත, පිළිතුරේ ස්වභාවය වෙනස් වෙනවා. භික්ෂුව ගිහි කාලයේදී පැවිදිවීමට පෙරාතුව වසර පහක් පමණ මස් මාළු අනුභව කළේ නැහැ. ඒ කාලයේ මස් මාළු අනුභව කරන කොට ඒ සතා මැවිලා පෙනෙනවා. උදාහරණයක් කීවොත්, කුකුල් මස් අනුභව කරනකොට කුකුලා මැවිලා පෙනෙනවා. ඒ නිසා මස් මාළු අනුභවයෙන් වැළකී සිටියේ බොහොම කැමැත්තෙන්. හැබැයි මාංශ අනුභව කරන අය විවේචනය කරන්න ගියේ නැහැ. නිර්මාංශ බව ලෝකයට පෙන්වීමට ගියේ නැහැ. කෑමට ගත්ත ආහාර පිඟානේ මස් මාළු බෙදලා තිබ්බොත්, එය පිඟානේ පැත්තකට කර ආහාර අනුභව කළා. ගිහි කාලයේදී, මහා සංඝරත්නය උදෙසා දන් දෙන අවස්ථාවලදී දානයට මස් මාංශ පූජා කළා. නිර්මාංශ වුවද ඒ හේතුවෙන් දෘෂ්ටියක් හෝ අන්‍යයන්ගේ කැමැත්ත හෙළා දැක්කේ නැහැ.

භික්ෂුව පැවිදිවීමෙන් යම් කලකට පසුව මේ තත්ත්වය වෙනස් වුනා. මේ මොහොතේ මේ ප්‍රශ්නය අසන්නේ පින්වත් ගිහි

මහත්තයෙක්. කවුරුන් හෝ ධර්ම මාර්ගයේ ගමන් කිරීමට අවතීර්ණ වනවිට මුලින්ම සිටින්නේ පෘථග්ජන ස්වභාවයේ. දෙවැනිව සෝවාන් මාර්ගය තුළ. මේ ප්‍රශ්න අහන පිංවතා ඉහත ස්වභාවය නියෝජනය කරන නිර්මාංශ පුද්ගලයෙක්. එහෙම ස්වභාවයේ අයෙකුට අපි අවවාද කළොත් 'ඔබ මාස් මාළු බිත්තර අනුභව කළ යුතුයි. ඒවා නොකෑම වැරදියි' කියලා, අපි එම පින්වතාට කරන්නේ ලොකු වරදක්. ඔහු කෙරෙහි අනුකම්පාවෙන් තොරවීමක්මයි. ඒ වගේම එම පින්වතා, තමා නිර්මාංශව ජීවත්වෙමින්, අනුනටද ඒ ගැන දේශනා කිරීම, පෙළඹවීම වරදක් නැහැ. මොකද තවම ඒ පින්වතුන්ගේ ස්වභාවය සෝවාන් මාර්ගයේ පෙරට යන ස්වභාවයයි. අනාගතයේ යම් දිනෙක මේ පින්වතුන් සෝවාන් ඵලය අවබෝධ කරගැනීමට නම් තෙරුවන් කෙරෙහි අචල ශ්‍රද්ධාව, ආර්යකාන්ත ශීලය තම ජීවිතවලට ගලපා ගැනීම අත්‍යවශ්‍ය සාධකයක් වෙනවා.

තමාට සිතෙනවා නම්, මස් මාංශ අනුභව නොකිරීම නිසා තමා තුළ මෛත්‍රිය කරුණාව වර්ධනය වන බව, එම පින්වතා නිර්මාංශව සිටීම වරදක්යැයි භික්ෂුව මොනව හේතුවක් නිසාවත් කියන්නේ නැහැ. හැබැයි මෙතැනදී නිර්මාංශභාවය රකින පින්වතුන් සමහරෙක්ගෙන් නොදනුවත්භාවය නිසා ලොකු වරදක් වෙනවා. තමාට නිර්මාංශ වීමට අවශ්‍ය නම්, එය කළ යුත්තේ තමා තුළ මෛත්‍රිය කරුණාව වැනි ධර්මයන් තව තවත් ශක්තිමත් කරගැනීමටත්, ඒ තුළින් තෙරුවන් කෙරෙහි අචල ශ්‍රද්ධාව, ශීලය ශක්තිමත් කරගැනීමේත් පරමාර්ථයෙන්මය. එසේ නොමැතිව, තමා වර්ණනා කරගැනීම උදෙසා අනුන්ව හෙළාදැකීමට නොවේ. මෙතැනදී ඔබ තුළ වැඩෙන්නේ මෛත්‍රිය කරුණාව නොවේ. තමා කෙරෙහි මාන්නය, තණ්හාව, දිට්ඨියයි. මේ නිසා ඔබ විරුද්ධ මතය සමග ගැටෙනවා. එතකොට ඔබේ මෛත්‍රියට මොකද වෙන්නේ. සියළු සත්ත්වයෝ සුවපත්වේවා කියන සම්බුදු වදනට මොකද වෙන්නේ. ඔබ තිරිසන් සතුන්ව සුවපත් කරගැනීමට ගිහින්, තිරිසන් ලෝකයෙන් මිදී, මේ බුද්ධෝත්පාද කාලයේ උතුම් මිනිසත් බවක් ලැබූ පින්වත්

මනුෂ්‍යයින්ව, ගිහි පැවිදි උතුමන්ව විවේචනය කරනවා. ගැටෙනවා. තිරිසන් සතුන්ගේ නිදහස උදෙසා පෙනී සිටින ඔබ, උතුම් මනුෂ්‍යයාගේ නිදහස සීමා කරනවා. මෙවැනි තත්ත්වයක් තුළ ඔබ මේ ධර්ම මාර්ගයේ කෙසේ නම් පෙරට යන්නද?

ඔබට ලෝකය හදන්න බැහැ. ලෝකයාව දුකෙන් මුදවන්නත් බැහැ. තිරිසන් ලෝකයේ සතෙකුව ඉපදීමට හේතුව, එම කර්මය කර්මඵලයන් විඳීම වළක්වන්න අපිට බැහැ. ඔබ නිර්මාංශව සිටිමින් ඉන් ලබන ශක්තිය, තණ්හාව, මාන්නය සහ දිට්ඨිය හීන කිරීමට ඉඩදී ධර්ම මාර්ගයේ පෙරට යන්න. මෙයින් අදහස් වෙන්නේ නැහැ, මස් මාංශ අනුභව කරන අයට ධර්ම මාර්ගයේ ඉදිරියට යන්න බැහැය කියලා. මස් මාංශවලට ඇලුන කෙනෙකුට වඩා, වේගවත් ගමනක් දෘෂ්ටිගත නොවූ නිර්මාංශ කෙනෙකුට ධර්ම මාර්ගයේ තිබෙනවා. ඒ වගේ ම දෘෂ්ටිගත නිර්මාංශ පුද්ගලයෙකුට වඩා, මස් මාංශ අනුභව කරන මධ්‍යස්ථ පුද්ගලයෙකුගේ ධර්ම මාර්ගයේ ගමන වේගවත් වෙන්න පුළුවන්. මෙය බලපාන්නේ පුද්ගලයාගේ ඇලීමේ ගැටීමේ ස්වභාවය මතයි.

පින්වත් ඔබ වැරදි අර්ථකථන ගන්න එපා. මස් මාංශ කෑමත්, නොකෑමත්, ධර්මාවබෝධය ලැබීමත් අතර සම්බන්ධයක් තිබෙනවා කියලා. භික්ෂුව මේ සටහන පුරාවට කියන්න උත්සාහ කළේ, සෝවාන් මාර්ගය තුළ ගමන් කරන පින්වතුන් අහිංසක සතුන් කෙරෙහි මෙන්ම, මස් මාංශ අනුභව කරන මනුෂ්‍යයන් කෙරෙහිත් මෛත්‍රිය කරුණාව පෙරදැරි කරගෙන කටයුතු කළහොත්, ඔබේ ධර්ම මාර්ගයේ ගමන ඉක්මන් වන බව පමණයි.

පින්වත් ඔබ මස් මාංශ අතහැරීම තුළින්, ඊට වඩා ශක්තිමත් යමක් අල්ලාගන්නේ නම්, මස් මාංශ සම්බන්ධයෙන් කළ ඒ අතහැරීම දුක පිණිසම හේතුවන්නේය. භික්ෂුව මෙහිදී පැහැදිලි කරන්නේ මස් මාංශ කැපද, අකැපද කියන කාරණය නොවේ. භික්ෂුවට මේ සම්බන්ධව මතයක් නැහැ. මතයක් කියන්නේ දෘෂ්ටියක්. සියල්ල අනිත්‍යවූ ලෝකයේ එක මතයක ඉන්න කාටවත්ම බැහැ. අපි යමක් දැඩිව අල්ලාගත්තා නම් එතැන තියෙන්නේ අවිද්‍යාවයි.

භික්ෂුවගේ පාත්‍රයට කුමන තරාතිරමේ දායකයෙක්, ආහාරයක් පූජාකළත් එය මස්, මාළු, එළවළු, බත් වශයෙන් භික්ෂුව වර්ග කරන්නෙ නැහැ. එය භික්ෂුවගේ කය පවත්වාගැනීමට ලැබුණු ආහාරයක් වශයෙනුයි භික්ෂුව දකින්නේ. භික්ෂුව අවබෝධයෙන් දකිනවා කුමන ආහරයක් වුවත් අයිති වමනයට, රුධිරයට බව. ආහාරයත්, වමනයත්, රුධිරයත් අයිති සතර මහා ධාතූන්ට බව. ඕනෑම පින්වතෙක් ධර්මාවබෝධයෙන් පෙරට යනකොට, ඔබ ලබන අවබෝධය තුළින්ම ඔබට මේ ස්වභාවයන් පසක්කොට දේවී. නිරවුල්කර දේවී. ධර්ම මාර්ගය උත්සාහවන්තව වඩා, ඔබ සතර අපායෙන් මිදුන අවස්ථාවක, ඔබේ වැඩෙන ප්‍රඥාව විසින්ම මේ ප්‍රශ්නය ඔබට විසඳලා දේවී. ඒ පිළිබඳව අමුතුවෙන් ආයාසයක් ගැනීමට, අනුන්ගේ උපදෙස් ගැනීමට ඔබට අවශ්‍ය නැහැ. නමුත් ඉන් මෙහා මේ ප්‍රශ්නය ඇතිවීම සාධාරණයි. මන්ද මෙවැනි ප්‍රශ්න මෛත්‍රියේ, කරුණාවේ, ශීලයේ වේශයෙන් ඔබ ඉදිරියට එන, ඔබව සතර අපායෙන් මිදීම වළක්වන, පමා කරන මාර බලවේග හෙයිනි. ඔබගේ ජීවිතය මෛත්‍රිය කරුණාවෙන් සීලයෙන් ශක්තිමත් නම් ඔබ නිර්මාංශවීම හේතුවෙන් ඔබගේ අදහසට විරුද්ධ අය සමග ගැටීමේ ස්වභාවයට ඔබ යන්නේ නැහැ. එහෙම කළොත් එතැන මෛත්‍රියක් නැහැ. තිරිසන් යෝනියේ ඉපදෙන සතෙක් ඔබ මරණයෙන් බේරුවා කියලා, එම සතාගේ කර්ම විපායකයන්ගෙන් බේරාගන්න ඔබට බැහැ.

මෙසේ ඔබ ඔබේ අදහස දිනවීමට, සීමාව ඉක්මවා දෘෂ්ටිගත වුනොත්, ඔබ මස් මාළු බිත්තර කෑමෙන් වැළකුණත්, ඵස්ස ආහාර, මනෝ සංචේතනා ආහාර, විඤ්ඤාණ ආහාර කියන තුන් ආකාරය ආහාර බුදින අයෙක් බවට පත්වුවහොත්, ඔබට ලෙහෙසියෙන් පහසුවෙන් පෙරට යාහැකිව ඇති මේ ධර්ම මාර්ගයේ ඔබ ආපස්සටමයි ගමන් කරන්නේ. ඔබ කැමති මස් මාංශ අනුභවයටද, නිර්මාංශව සිටීමටද, ඔබ ඔබේ ස්වභාවයෙන් සිටින්න. ලද දෙයින් සතුටුවන්න.

# මස් මාංශ අනුභව කරන කුස සුසානයක් නම්...

පින්වත් ඔබ මෙහෙම හිතන්න. මෙය සටහන් කරන භික්ෂුව දන් වළඳනවා. භික්ෂුවගේ පාත්‍රයේ තිබෙනවා පිසින ලද මාළු කැබැල්ලක්. දායක මහත්මයෙක් මේ මාළු කෑල්ල දැක භික්ෂුවට කියනවා 'හාමුදුරුවනේ ඔබ වහන්සේ ඔය මාළු වළඳන එක පාපයක් නේද?' කියලා. මෙන්න මේ ගැටලුවට භික්ෂුව දෙන පිළිතුර ධර්මයට අනුව මෙහි සඳහන් කරනවා.

භික්ෂුවගේ පාත්‍රයේ තිබෙන පිසින ලද මාළුවා, මේ මොහොතේ කොහේ හරි උපත ලබලයි තිබෙන්නේ. සමහර විටෙක මනුෂ්‍යයෙක්, දෙවියෙක්, එසේත් නැති නම් නැවත මාළුවෙක් වෙලාද ඉපදිලා ඉන්න පුළුවන්. එය ධර්මතාවයක්. භික්ෂුව දකින්නේ පාත්‍රය තුළ තිබෙන්නේ සතර මහා ධාතූන්ගෙන් සැදුන මාළු නැමැති සංයුතියෙන් හැඳින්වෙන රූපයක් පමණයි. භික්ෂුව පරිප්පු, පොළොස්, මැල්ලුම් දකින්නේ යම්සේද මාළු කැබැල්ලත් භික්ෂුව දකින්නේ එම අර්ථයෙන්මය.

පින්වත් ඔබ මාළු කැබැල්ල තුළ මාළුවෙක් දකිනවා නම්, මස් කැබැල්ල තුළ කුකුලෙක් දකිනවා නම් එය දැඩි ආත්මීය දෘෂ්ටියකි. අපි මේ ධර්ම මාර්ගයේ වීර්යයෙන් ගමන් කරන්නේ තමා තුළත් සත්ත්වයෙක් පුද්ගලයෙක් නැහැය කියන කාරණය අවබෝධයෙන් හේතුඵල ධර්මයන්ට අනුව දැකීමටය.

එමනිසා භවයේ කොතැනක හෝ නැවත උපත ලබා ජීවත්වන සත්ත්වයකුගේ, අතීත රූපය මගේ කොටගෙන දෘෂ්ටි කාන්තාරවල

අතරමං වීම ඔබ නැවත නැවත උනන්දුවෙන් මෙනෙහි කළ යුතු කරුණකි. භික්ෂුවගේ පාත්‍රයේ තිබෙන මාළුවා කවුරුන් හෝ ධීවර මහතෙක් විසින් මරණ ලද මාළුවෙකි. එම මාළුවා මරපු අයට එම සත්ත්ව ඝාතන, සත්ත්ව හිංසා අකුසලය අනිවාර්යයෙන්ම විපාක දෙනු ඇත. ඔය ආකාරයට සත්තු මරන අයමයි නැවත මාළු වෙලා උපදින්නේ. පින්වත් ඔබ ඔය නොදනුවත් කම නිසා පෙනී සිටින්නේ, පෙර ජීවිතයේ මාළු මරලා එහි කර්ම විපාකයෙන් මේ ජීවිතයේ මාළුවෙක්ව ඉපදුනු සතෙක් වෙනුවෙන්. ඒ විදිහට මැරුම්කන්නයි ඒ සතා මාළුවෙක්ව ඉපදෙන්නේ. එම සතා දැළට හසු නොවුනා නම්, ලොකු මාළුවෙක්ට අසුවෙලා, ගොදුරුවෙලා ජීවිතය පූජා කරාවී. සත්ත්වයාගේ කුසල් පාලනය කරන්න ඔබට මට බැහැ. ඒවා ධර්මතාවයන්. හෙට පටන් රජය නීතියක් පනවලා මුහුදු තීරයේ මාළු ඇල්ලීම තහනම් කළොත් මුහුදේ මාළු ගහනය සීග්‍රයෙන් වැඩිවේවි. තෝරු, මෝරු, තල්මසුන් වැනි විශාල මාළු සුවසේ සැපසේ පහසුවෙන් එම මාළු ගොදුරු කරගනීවි. පින්වත් ඔබ මාළු නොඇල්ලුවත්, පෙර කර්මය නිසා ආයුෂ අහවර වුණු මාළුවා, තව සතෙක්ට ගොදුරු වී මියයාවී.

පින්වත් ඔබට ඉන් පසුව සිදුවන්නේ තොරු, මෝරු, තල්මසුන්ට නිර්මාංශ වීමට කියා බලකිරීමටයි. එය කළ හැකිද් නොහැකිද යන්න පින්වත් ඔබම තීරණය කරන්න. භික්ෂුව සමග විරසක වෙන්න එපා. මම අතීත අකුසල් සංස්කාර හේතුවෙන් තව මොහොතකින් මාවත් කව්රුහරි මරාදමන්න පුළුවන්. එම නිසා ඉහත අදහසට පින්වත් ඔබ එකඟ නැතිනම්, එම අදහස අත්හැර දමන්න.

පින්වත් ඔබට නැවතත් මතක් කරමි. ඔබ කැමතිනම් නිර්මාංශව ජීවත් වෙන්න. කැමතිනම් මස් මාංශ අනුභව කරන්න. ඔබේ කැමැත්තට පටහැණි අයව විවේචනය කරන්න යන්න එපා. එසේ කොට අකුසල් රැස්කරගන්න එපා.

පින්වතුන්ලාගේ ඉන්ද්‍රිය ධර්මයන්ගේ වැඩීමේ ස්වභාවය විවිධයි. ඒ නිසා දෘෂ්ටි, මතවාද, පරස්පර අදහස් ඇතිවීම ධර්මතාවයක්.

එහෙම නොවුනොත් තමයි පුදුමය. මතවාද දෘෂ්ටිවලින් ගහන ලෝකයේ පින්වත් ඔය ධර්මයේ විවෘත ස්වභාවයට එන්න. ආත්මීය ස්වභාවයෙන් බැහැරව පටිච්ඡ සමුප්පන්නව ලෝකය දකින්න. දූලට හසුවී මැරෙන මාළුවා මනුෂ්‍යයෙක්, දෙවියෙක්..... එසේත් නැතිනම් නැවත තිරිසන් ලෝකයේම උපත ලබනවා. ඒ මාළුවාගේ අතීත රූපය බදාගෙන අපි සන්ධුවෙනවා.

ඊළඟ කාරණය තමයි, මස් මාළු අනුභව කරන අයගේ කුස සුසාන භූමියක්ය කියලා නගන චෝදනා. ඒ කියන්නේ පින්වතුනේ නිර්මාංශව ජීවත්වෙන පින්වතුන්ලාගේ කුස, සුවඳ දුම් සුගන්ධය වහනය වන රත්තරන් ගුහාවක්ද? මස් මාළු කෑවත් නොකෑවත් පින්වතුනේ මේ කුස සුසාන භූමියක්ම තමයි. නිර්මංශ පින්වතාගේ කුසත් ලේ, සැරව, මේදය, වමනය, අසූචි, මුත්‍ර බොකු බඩවැල්වලින්මයි පිරිලා තිබෙන්නේ. නිර්මාංශ පින්වතුන් ඔබ සිතනවා නම් ඔබගේ කුස සුසාන භූමියක් නොවේය, එය රත්තරන් ගුහාවක්ය කියලා පින්වත් ඔබලාට කවදා නම් සතර සතිපට්ඨාන ධර්මයක්, අසුභයක් පිළිබඳ දැනීමක් සකස්වෙන්නද? මන්ද ඔබ සුබ සංඥාවෙන්මයි මේ ජීවිතය දකින්නේ. මේ කය දකින්නේ. මගේ ශරීරය පිරිසිදුයි කියන නිත්‍ය සංඥාවමයි ඔබට වැඩෙන්නේ. අකුසල් සංස්කාර හේතුවෙන් මියයන සත්වයෙක් නිසා, පින්වත් ඔබ අහිමි කරගන්නා වූ ශාසනයේ අර්ථය මොන තරම් විශාලද.

ලොව්තුරා බුදු සමිඳුන් දේශනා කළ ධර්මය ඉක්මවා යන්න එපා. එසේ වුවහොත් නිර්මාංශ වුවද, මස් මාළුවලට කෑදර වුවද එය ප්‍රමාදයක්මය. නිර්මාංශ වීම තුළත්, මස් මාළු අනුභවය තුළත් නිත්‍ය සැප ආත්මීය වශයෙන් දෘෂ්ටිගත වෙන්න එපා.

කෙනෙක් මාස් මාලු කනවා ශරීරය නිරෝගී, ශක්තිමත් කරගන්න. තව කෙනෙක් නිර්මාංශ වෙනවා ශරිරය නිරෝගී, ශක්තිමත් කරගන්න. මේ කාරණා දෙකේදීම ඔබ තුළ වැඩෙන්නේ ආත්මීය දෘෂ්ටියක්. මේ සා ශ්‍රේෂ්ඨ බුදුදහමක් අභියස දෘෂ්ටි කාන්තාරවල අතරමං වෙන්න එපා. පින්වත් ඔබ කල්ප සියක්කෝටි ගණනාවක

සිට, මස් මාංශ අනුභව කරලා ඇති. සිංහයෝ, කොටි, කිඹුල්ලු, මාළු වෙලා අනුන්ගේ මස් අපි කොච්චර කන්න ඇතිද? ඔබේ මස් අනුන් කොච්චර කන්න ඇතිද? මස් මාංශ නිසා දෘෂ්ටිගත වෙලා කොච්චර සතර අපායන්ට වැටෙන්න ඇතිද? බත්, පරිප්පු, පොලොස්, මැල්ලුම්, තණකොල මොන තරම් කන්දරාවක් අතීතයේ අපි කන්න ඇතිද?

ඒත් අපි දෙගොල්ලන්ටම තවම සුගතියක් නම් වෙලා නැහැ. මැරෙන ලෙඩවෙන නැවත ඉපදෙන ස්වභාවයෙන්මයි සිටින්නේ. කෙනෙක් මාස් මංශවලට කැමතියි. තව කෙනෙක් මස් මාංශවලට අකමැතියි. කැමැත්තත්, අකමැතත්තත් විඳීම කියන ධර්මතාවයේ කාසියේ දෙපැත්ත වගේ. මේ දෙපැත්ත තුළින්ම ඔබ අල්ලාගන්නේ සංස්කාරමයි. සංස්කාර ඔබව රැගෙන යන්නේ භවයටමයි. මාළු කැබැල්ලක්, පරිප්පු හොද්දක් කරන විකාරයක හැටි බලන්නකෝ. මනුෂ්‍යයාව ඇද දමන මුලාව දෙස බලන්නකෝ. එමනිසා මින්පසු මාළු කැබැල්ල දෙස, පරිප්පු ව්‍යංජනය දෙස නොව, ඒවා කෙරෙහි ඔබ තුළ සකස්වෙන තෘෂ්ණාව දෙස බලන්න. තෘෂ්ණාවමයි දුක සකස් කරන්නේ. මේ ලැබුණු උතුම් ජීවිතයේදී ධර්මාවබෝධය, සම්මාදිට්ඨිය උදෙසා ගමන් කිරීමට අවශ්‍ය ජවය ශක්තිය ශරීරයට ලබාගැනීම උදෙසාම ආහාර අනුභව කරන්න. මාළු කැබැල්ල තුළ මාළුවෙක් නොව, පරිප්පු ව්‍යංජනය තුළ පරිප්පු නොව, ඒවා අසුචියක්, වමනයක්, මුත්‍රා කෝප්පයක්, රුධිරය කෝප්පයක් වශයෙන් දකින්න. ආහාරය කුමක් වුවද එහි ඵලය ආයුෂ, වර්ණය, සැපය, බලය, අනිත්‍ය බව සිතමින්ම, දකිමින්ම ඒවා ආහාරයට ගන්න. නිත්‍ය සංඥා, සැප සංඥා, ආත්මීය සංඥා මාළු නිසා ඇතිවුවද, පරිප්පු නිසා ඇතිවුද ඒවා පිළිගඳ ඇති කෙළෙස්ම බව දකින්න.

# මාංශයට ඇලී, මාංශයට ගැටී තවත් මස් ගොඩක් දරාගෙනම ඉපදෙමුද?

මෙය සටහන් කරන භික්ෂුව හෙටත් උදෑසන පාත්‍රය රැගෙන ගමට පිණ්ඩපාතය වඩිනු ඇත. එහිදී පාත්‍රයට බත් ටිකකුයි පොල් සම්බෝල ස්වල්පයකුයි ලැබුනොත් ඇති. එය භික්ෂුවට හොඳටම ප්‍රමාණවත් පහුවදා උදෑසන දක්වාම. එය භික්ෂුව දකින්නේ බත් හෝ පොල් සම්බෝල හැටියට නොවේ. කය පවත්වාගැනීමට ලැබුණු පිළිකුල සහිතවූ ආහාරයක් ලෙසය.

මස්, මාළු, බත්, පරිප්පු, පොලොස්.... මේවා මුලාවූ ලෝකයාට බඩ පිරෙන්න දෘෂ්ටි සපයන මාර කෑම වට්ටෝරුවයි. මාරයාගේ වේටර්ලා රිදී බන්දේසියක තබා ඔබට පිළිගන්වන මාරයාගේ කෑම වට්ටෝරුව, විඳීමෙන් බැහැරකොට ප්‍රත්‍යාවේක්ෂාවෙන් ආහාරයට ගන්න. ප්‍රත්‍යාවේක්ෂාව යනු මේ ශරීරයත්, ආහාරයත් දෙකම පිළිකුල් බව දකිමින්, ධර්ම මාර්ගයේ ගමන් කිරීම උදෙසා කය පවත්වාගැනීම අරමුණු කොට ආහාර ගැනීමයි.

පින්වත් ඔබගේ දිවට ඵස්සය වන ආහාරය මස් මාංශ වුවද, පරිප්පු වුවද, රසය-ගුණය පින්-පව් කියන සංඥාවන්ගෙන් මිදී අනිත්‍යයි කියන සංඥාවෙන් දකින්නට උත්සාහ ගන්න. පින්වත් ඔබ ඒවා කෙරෙහි ඒවා කෙරෙහි ඇතිවන කැමැත්ත අකමැත්ත ඔබේ කර නොගෙන, ධම්මානුපස්සනාවට භාරදෙන්න. එවිට ඵස්සය නිත්‍යභාවයෙන් ගැනීම නිසා, දෘෂ්ටියෙන් කිළිටිවුන සිත විදර්ශනාවෙන් විනිවිද දකින්නට හැකිවේවි.

කොහොම ගත්තත් තිරිසන් සංඥා අනතුරුදායකයි. තිරිසන් ලෝකය යනු අකුසල කර්මයන්ගේ මව්බිමයි. අකුසල් මව්බිමේ ඉපදෙන සෑම තිරිසන් සතෙක්ම, පෙර ජීවිතයේ සත්ව ඝාතකයෙක්මයි. පාපකාරී ජීවිත ගතකළ එම සත්ත්වයින්ට තම අකුසල් සංස්කාර විපාක දෙන ධර්මතාවය අපට නවත්වන්න බැහැ. අපි සංස්කාරවලින් මිදෙන දිශාවටම ගමන් කරමු. පින්වත් ඔබ ව්‍යාපාර, රැකිරක්ෂා කරමින් පංචශීලය තම නිත්‍ය ශීලය හැටියට සමාදන්ව ජීවත්වෙන්න. ශීලයක් සමාදන් වීමට පෙර එම ශීලයේ ඇති වටිනාකම මෙනෙහි කොට ශීලය කෙරෙහි ගෞරවය සකස්කොට ගන්න. කිසිම අවස්ථාවක සිල්පදයක අර්ථයට අඩු තක්සේරුවක් දෙන්න එපා. ඔබට සිතෙනවා නම් අද දවසේ අදාළ සිල්පදය කිළුටුවේය කියලා, සමාදන් වන සිල්පද කිළුටු කරගන්නවාට වඩා, ශීලයට ඇති ගෞරවයෙන්ම එම ශිල්පදය සමාදන් නොවී සිටීම යෙහෙකි. නිර්මංශ වීම හෝ මාංශ අනුභවය ශිල්පදයක් නොවන බව විශ්වාස කරන්න. බුදුරජාණන් වහන්සේ දේශනාකර වදාළ ධර්මය අකීකරු ආකාරයෙන් ගලපා නොගන්න. එසේ වුවහොත් නිරතුරුවම දෘෂ්ටි මතවාදවල හිමිකරුවෙකු වීමට ඔබට සිදුවනු ඇත.

ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා මස් මාංශ වෙළඳාම, මිනිසුන් ඇතුළු සත්ත්ව වෙළඳාම, අවි ආයුධ වෙළඳාමෙ, සුරා වෙළඳාම සහ වස විෂ වෙළඳාම මිච්ඡා ආජීවය වශයෙන්. ඉහත කාරණයේදී අනිවාර්යයෙන්ම මස් මාළු වෙළඳාම මිච්ඡා ආජීවයට අසුවෙනවා. ඒ ගැන කිසිම සැකයක් නැහැ. හංදියේ හෝටලයේ මුදලාලි මහත්මයා මස් පීරිසියක්, මාළු පීරිසියක් විකිණීමේදී, බුරියානි එකක්, කොත්තු රොටියක් විකිණීමේදී පවා මිච්ඡා ආජීවයක් සිද්ධ වෙනවා. නමුත් ව්‍යාපාර, රැකිරක්ෂා කරන, වගකීම් බහුල පින්වතුන්ලාගේ නිත්‍ය ශීලය පංචශීලයයි. එම නිසා ඔබේ ජීවිතය තුළින් පංචශීලය අර්ථවත් කරගන්න. එවිට ඔබ හෝටලයක, මාළු ලෑල්ලක, ශීතකරණයක බහා මස් මංශ වෙළඳාම කරන විට සිල්පදයක් බිඳගැනීමක් වෙන්නේ නැහැ.

මොකද ඔබ සමාදන්ව සිටින්නේ පංචශීලයයි. නමුත් මිච්ඡා ආජීවයක් ඔබ අතින් සිද්ධවෙනවා. එය බුදුරජාණන් වහන්සේ ඔබට එපා යැයි දේශනා කළ කාරණයක්. නමුත් ගිහි පිංවතුන් පංචශීලය සමාදන්වීමේදී මිච්ඡා ආජීව කියලා ශිල්පදයක් සමාදන් වෙන්නේ නැහැ. පින්වත් ඔබ උපක්‍රමශීලීව ධර්මය ජීවිතයට ගලපාගන්න.

බුදුරජාණන් වහන්සේ ධර්මය දේශනා කර ඇත්තේ සියලුම සත්ත්වයන් කෙරෙහි මහා කරුණාවෙනි. අපේ ඉන්ද්‍රිය ධර්මයන්ගේ වැඩීමේ නොවැඩීමේ ස්වභාවය විවිධයි. ඒ නිසා හැමෝටම එකම තැන සිට ධර්මය දකින්න බැහැ. හෝටල් ව්‍යාපාරයක් කරන කෙනෙකුට, මාළු ලෑල්ලක්, ශීතකරණයක මස් මාළු වෙළඳාම කරන පිරිසකට අපි කීවොත් ඔබ මස් මාංශ විකිණීමෙන් කරන්නේ මහා වරදක්, ඔබ මහා දුශ්ශීලයෙක්, ඔබ අනිවාර්යයෙන්ම නිරයට යනවා කියලා, එය මහා ද්‍රෝහිකමක් වෙනවා. සම්බුදු වදනට පටහැණි ප්‍රකාශයක් වෙනවා. එහෙම වුනොත් අනේ ඒ අසරණ වන බෞද්ධයන් අන්‍යාගම්වලට යාවී. මිථ්‍යාදෘෂ්ටිකභාවයට පත්වේවි. ඒ නිසා ඒ අයට කියන්නට තිබෙන්නේ පින්වත් ඔබලා පංචශීලය නිත්‍ය ශීලය හැටියට සමාදන්ව, රැකගෙන ඔබේ ව්‍යාපාරය කරන්න කියලා. එවිට පුළුවන් ඔවුන්ටත් මේ ධර්මයේ සුරක්ෂිතභාවයක් ලබාගන්න. එතැනදී ඔවුන් අතින් සිල්පදයක් බිඳෙන්නේ නැහැ. තමන් සමාදන්වූ පංච ශීලයට අගෞරවයක් වෙන්නේ නැහැ. නමුත් එම පිංවතුන්ට ශක්තිය තිබුණොත් මස් මාංශ විකිණීම මිච්ඡා ආජීවයක් නිසා, ඉන් මිදී ජීවත්වෙනවා කියලා තීරණයක් ගන්න, එය ඔහුගේ ජයග්‍රහණයක්.

එහෙම නොවුනා කියලා ඔහු දුස්ශීලයෙක් නොවේ. මොකද ඔහු තෙරුවන් සරණ ගිය පංචශීලය රැකගෙන ජීවත්වන සිල්වතෙක් නිසා. ඔහුද ධර්මය තුළ සුරක්ෂිතභාවය ලැබුවෙක්. වගකීම්වලින් බැඳුන ගිහි පිංවතුන්ලාගේ නිත්‍ය ශීලය පංචශීලය කියලයි බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ. ඒ නිසා බුදුරජාණන්

වහන්සේ ඉක්මවා ගොස් තෙරුවන් සරණ ගිය පංචශීලය ආරක්ෂාකරගෙන ජීවත්වෙන මනුෂ්‍යයෙකුට දුස්ශීලයි කියන චෝදනාව නගන්න හොඳ නැහැ. පින්වත් ඔහුට තවදුරටත් ධර්මය ගැන සිතමින්, තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාව ඇතිකරග නිමින්, ශීලයෙන් ශක්තිමත් වෙමින් ඉදිරියට පැමිණීමට, ඒ පැමිණීම තුළින්ම මිච්ඡා ආජීවයෙන් මිදීමට අවශ්‍ය රැකවරණය සත්පුරුෂභාවයෙන් යුතුව ලබාදෙන්නට අපි පාර පෙන්විය යුතු වෙනවා.

අවසාන වශයෙන්ද කියමි. පින්වත් ඔබ කැමතිනම් නිර්මාංශව ජීවත්වෙන්න. කැමතිනම් මස් මාංශ අනුභව කරන්න. මස් මාංශ කෑම, නොකෑම කෙනෙකුට ශීලයක් නොවන නමුත් මස් මාංශ කෑම, නොකෑම නිසා ඔබ තණ්හාව, මාන්නය, දිට්ඨි සකස් කොට ගතහොත් එය බලවත් මනෝ කර්මයක් බව හොඳින් සිහිපත් කර ගතයුතු වෙනවා. මස්, මාංශ, නිර්මාංශ ලෝකයට අයිති දේවල්. ලෝකයට අයිති දේවල් ලෝකයේම තිබීමට ඉඩහැර, ලෝකයට ඔබ බැඳෙන, රූපය කෙරෙහි ඔබ ඇතිකර ගන්නා, ඔබ තුළ සකස්වෙන තෘෂ්ණාවෙන් මිදෙන්න. මස් මාංශ කෙරෙහි සකස්වුවද, නිර්මාංශ කෙරෙහි සකස්වුවද තෘෂ්ණාව යනු දුකෙහි නිර්මාණ කරුවාම බව දකින්න. ඔබ දරාගෙන සිටින ශරීරය නැමැති මස් ගොඩේ හිමිකාරීත්වය ඔබට ලබාදෙන්නේ සංස්කාර කෙරෙහි සකස් කොටගන්නා තෘෂ්ණාව නිසාම බව දකින්න.

තිරිසන් සතුන්ගේ මස අතහැර, පරිප්පු ව්‍යංජනයේ රස අතහැර ශරීරය නැමැති ඔබේ මස් ගොඩෙන් මිදීමේ මාර්ගය දකින්න.

එවිට මෙතැන ඇත්තේ මස්, මාළු, පරිප්පු ප්‍රශ්නයක් නොව ඒවා කෙරෙහි ඇතිකරගන්නා ඇලීමේ ගැටීමේ ප්‍රශ්නයක් බව ඔබ දකිනු ඇත.

ලොව්තුරා බුදුරජාණන් වහන්සේගෙන් දේවදත්ත හිමියන් මස් මංශ වැළඳීම තහනම් කරන ලෙස කළ ඉල්ලීමේදී බුදුරජාණන්

වහන්සේ දේශනා කළේ කැමැති කෙනෙක් තමන්ට පූජාකරන මස් වැළඳුවාවේ, කැමති කෙනෙක් නිර්මාංශව පිණ්ඩපාතය වැළඳුවාවේ යන්නයි.

එතැනයි ඇලීමේ, ගැටීමේ ස්වභාවයෙන් මිදුණු උපේක්ෂාව. මධ්‍යම ප්‍රතිපදාව. අපි ඒ සම්මා සම්බුද්ධ වදන ඉක්මවා යා යුතු නැහැ. එහෙම වුනොත් අපිට කවදාකවත් බුදුරජාණන් වහන්සේ කෙරෙහි, ධර්මරත්නය, සංඝරත්නය කෙරෙහි අචල ශ්‍රද්ධාවට එන්න බැහැ. ලෝකය ලෝකයේ ස්වභාවයෙන් තිබුණාවේ. පින්වත් ඔබ ධර්මයේ ස්වභාවයට එන්න. මස් මාංශ නිසා, හේතුඵල ධර්මයන්ට අනුව නැවත මස් ගොඩකට බැසගන්න, ඵස්ස ආහාර, මනෝ සංචේතනා ආහාර, විඤ්ඤාණ ආහාර යන ආහාර තුනක් බුදින ධර්මයේ රැකවරණය අහිමිකරගත් පිංවතෙක් වෙන්න එපා. අපි සියළුම දෙනා බුදුරජාණන් වහන්සේගේ දරුවෝ. එමනිසා බුදුරජාණන් වහන්සේ දේශනා කළ ධර්මයේ ඇසෙන් ලෝකය දකින්න. තමාගේ කැමැත්ත, අකමැත්ත තමාට අයිති නැති කොට, අනුන්ගේ කැමැත්ත අකමැත්ත ඔබ ඔබේ කරගන්න එපා. ඒ ඔබ ඔබේ කරගන්නේ දුකයි.

# භාවනාවට පෙර

## භාවනාවට පෙර පළමු කොටස

# ඔබ නැවත නැවතත් 'අ' යන්නම ඉගෙන ගන්නේ ද

භාවනාව වර්තමානයේ බොහෝ ජනප්‍රිය මාතෘකාවක්. වයස් භේදයකින් තොරව දෙස් විදෙස් පින්වතුන් විශාල පිරිසක් මේ ජනප්‍රිය මාතෘකාව තුළින් සැනසුම සොයනවා. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ ජීවමානව වැඩ සිටින කාලයේදී දඹදිව මිනිසාගේ විමුක්තිය අරමුණු කොට ගොඩ නගාගත් මිථ්‍යා දෘෂ්ටි හැට දෙකක් තිබුණු බව ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. මේ සෑම දෘෂ්ටියක්ම ඇති වූයේ, වර්ධනය වුණේ, මනුෂ්‍යයාගේ ජීවිතවල සංකීර්ණභාවය වැඩි වුණ නිසා.

සංකීර්ණභාවය කියන්නේ දුක වැඩිවීම කියන කාරණයයි. වර්තමාන සමාජය තුළද මනුෂ්‍යයාගේ ජීවිතවල සංකීර්ණභාවය වැඩි වන්න, වැඩිවන්න සකස් වෙන විකෘති සමාජීය අධ්‍යාත්මික පාරිසරික ස්වභාවයන් හේතුවෙන් මනුෂ්‍යයා නිරතුරුවම අසහනයට පත් වෙනවා. මේ අසහනයෙන් මිදීමටත්, පින්වතුන්ලා වැඩි වැඩියෙන් භාවනාවට යොමුවෙනවා. ඉහත කාරණය නිසා ඔබ භාවනාවට යොමු වනවා නම්, එම හේතුව සකස්වීම සඳහා බලපෑ සාධකයන්, ගැන පින්වත් ඔබ භාවනා කිරීමට පෙර දැනුවත් වෙන්න අවශ්‍යයි. ජීවිතයට බලපාන අසහනය නැමති ඵලය සකස්වීමට හේතු කාරණා වූ ධර්මතාවය කමටහනක් කොට ගත්තොත්, පමණක්මයි, භාවනාවක් තුළින් ඔබට සාර්ථක ප්‍රතිඵල ලබාගන්න පුළුවන් වෙන්නේ. අප ජීවත්වන සමාජය ඉබේ

සංකීර්ණභාවයට පත්වන්නේ නැහැ. සමාජයේ සංකීර්ණභාවය කියන්නේ මනුෂ්‍යයාගේ අධිවේගී සිතුවිලිවල ඵලයකි. සඳ පායා ඇති එක්තරා සුන්දර රාත්‍රියකදී අජාසත්ත රජතුමාට සිතිවිල්ලක් පහළවෙනවා. මේ සුන්දර රාත්‍රිය වඩාත් අර්ථවත් වෙන්න නම්, ධර්ම සාකච්ඡාවක් කළොත් හොඳයි කියලා රජතුමා ඇමැතිවරුන් කැඳවලා විමසනවා. ඒ සුන්දර රාත්‍රියේ අර්ථවත් ධර්මයක් කිනම් ශාස්තෘවරයකුගෙන් ඇසුවොත් යහපත් වේවිද කියලා. ඇමතිවරුන් තම තමන්ගේ මතයන් ප්‍රකාශ කරන අතරේ එක සිහිනුවණ තිබෙන ඇමැතිවරයෙක් ප්‍රකාශ කරනවා. මගේ අඹ වනයෙහි ලොව්තුරා බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ පන්සියයක් ස්වාමීන් වහන්සේලා වැඩ සිටිනවා. භාග්‍යවතුන් වහන්සේ, පින්වත් මහ රජතුමාගේ මේ සුන්දර රාත්‍රිය අර්ථවත් කරගැනීමට උතුම් හමුවක්ම වේය කියලා.

ඇමැතිවරයාගේ පැහැදිළි කිරීම ගැන රජතුමා සතුටුවෙලා. තම පිරිවර සමග අඹ වනයට ගමන් කරනවා. අඹ වනය තුළට පැමිණීයත්, කිසිවකුගේ කිව්සුමක් පමණකුදු හඬක් නොඇසෙන නිසා රජතුමා බියට පත් වෙනවා. තම ඇමතිවරයා මේ රාත්‍රියේ තමා මරා දැමීම සඳහා සැලසුමක් කළාද කියලා. පන්සියයක් දෙනා සිටින තැනක අඩු වශයෙන් කුඩා හෝ ශබ්දයක් නැගෙන්න ඕනේ. 'ඔබ මට වංචා කළා නේද?' කියලා රජතුමා විමසනවා. ඇමැතිවරයා ප්‍රකාශ කරනවා අර පෙනෙන ශාලාවේ බුදු රජාණන් වහන්සේ ප්‍රමුඛ මහා සංඝරත්නය වැඩ සිටිනවා කියලා. රජතුමා සතුට ප්‍රකාශ කරනවා. පන්සියයක් මහා සංඝරත්නය වැඩ සිටින ස්ථානයක් කෙසේ නම් මේසා නිහඬතාවයක් ඇති වන්නද කියලා. මේ උතුම් නිහඬතාවය ඒ උතුම් ජීවිතවල ගොඩනැගුණු සරලභාවය නිසාම හටගත් ස්වභාවයක්. පංච නීවරණ ජීවිතය තුළින් යටපත් වෙන්න, යටපත් වෙන්න ජීවිතය සරලභාවයට පත් වෙනවා. මේ සියල්ල හේතුඵල ධර්මයන්. මේ හේතුඵල ධර්මයන් දකිමින් ඕනේ අපි භාවනාවට යොමු වන්න. මනුෂ්‍යයා රූපයක් කෙරෙහි ඇති කරගත්, තෘෂ්ණාව වැඩි වන්න, වැඩිවන්න ඒවා

අයිතිකර ගැනීමට උපක්‍රම යොදනවා. වෙහෙස ගන්නවා. අර්බුද, ගැටලු, තරගය... මේ හේතු නේද, සමාජයේ සංකීර්ණභාවය හැටියට අපි දකින්නේ. මනුෂ්‍යයා තෘෂ්ණාව පසු පස හඹා යන්න හඹා යන්න දුක වැඩි වෙනවා. සැප සොයන්නයි හඹා යන්නේ, නමුත් සකස් වෙන්නේ දුක? අප්‍රමාණ කැපවීම් කරලා සැපයක් ලැබුණත්, එය බොහෝම කෙටි ආශ්වාදයක්. ඒ ආශ්වාදය අභිබවා ජරා ව්‍යාධි, මරණ, ශෝක පරිදේව නැගී සිටිනවා. පින්වත් ඔබ සිහිනුවනින් බලන්න. ලෝකය මොන තරම් අසාධාරණද කියලා. ප්‍රශ්නය තිබෙන්නේ මෙතරම් අසාධාරණ ලෝකයකට ඔබ මෙතරම් ආදරය කරන්නේ ඇයිද කියලා. පින්වත් ඔබට යමෙක් අසාධාරණයක් කරනකොට ඔහුගෙන් මිදීයාමටයි ඔබ උත්සාහ ගන්නේ. නමුත් ඔබ මෙතනදි ලෝකයේ කොටස්කරුවෙක් වෙමිනුයි විසඳුම් සොයන්න උත්සාහ ගන්නේ. මෙය හරියට වැරැද්ද තමා තුළ තබාගෙන අනුන් තුළින් වැරැදි සොයනවා වගේ වැඩක්. ඔබ තුළින්ම සකස් වෙන තෘෂ්ණාව විසින්මයි මේ අසහනය, අසාධාරණය සකස්කොට තිබෙන්නේ.

පින්වත් ඔබ මොන භාවනා ක්‍රමවේදයකට යොමු වුණත්, දුක සකස් කරන තෘෂ්ණාව පිළිබඳව නිරතුරුව අවදියෙන් සිටින්න ඕනේ. මොකද පින්වත් ඔබ මේ ජීවිතයේදී පුරුදු වෙන්න භාවනා කරනවා නොවේ, අතීත සංසාරික භව ගමනේදී, පින්වත් ඔබ සැවොම සමථ භාවනාව පුරුදු පුහුණු කොට, ධ්‍යානලාභීන්ව අහසින් ගමන් කළ, පිරිසක්මයි. අතීතයේ ඔබලා රූපී අරූපී බ්‍රහ්මතලවල ඉපදිලා අප්‍රමාණ සමාධියේ ආශ්වාදය කල්ප ගණන් විඳි පිරිසක්මයි. පින්වත් ඔබත් මමත් මනුෂ්‍ය ජීවිතවලදී මෛත්‍රී භාවනා වඩලා මරණින් මතු කල්ප ගණන් බ්‍රහ්ම සම්පත් ලැබූ පිරිසක්මයි. අපි සැමගේම යථාර්ථය මේක තමයි. අතීතයේ සමාධි භාවනාවන්ගේ ආශ්වාදයේ අසිරියෙන්, සමාධියේ ලෝකය ජයගත් ඔබට, තමා තුළම දුක සකස් කිරීමට හේතු වන තෘෂ්ණාව හඳුනාගැනීමට තවම පුළුවන් වෙලා නැහැ. ඒ නිසාම පින්වත් ඔබ වර්තමානයේ නැවතත්, ස්වාමීන් වහන්සේ නමකගෙන්,

ගුරුවරයෙක්ගෙන්, පතපොතින්, සොයනවා. විමසනවා. කොහොමද ආශ්වාස ප්‍රාශ්වාසයට හිත යොමු කරන්නේ. කොහොමද විචාර විතර්ක සංසිඳෙන්නේ. කොහොමද හුස්ම දෙස බලා සිටින්නේ. කුමක්ද ධ්‍යාන කියන්නේ කියලා. බලන්නකෝ. අවාසනාවක මහත, අතීත භවයන්හිද රූපී අරූපී බ්‍රහ්මතල ස්පර්ශ කළ අපි, තෘෂ්ණාව ගැන, නොතකා හැරීම නිසාම, මේ නිමේෂයේත් නැවතත් ආනාපානසති භාවනාව වඩන හැටි 'අ' යන්නේ සිට සොයනවා.

## භාවනාවට පෙර දෙවන කොටස

# අතීත ශක්තීන් අවබෝධයෙන් ආයෝජනයට ගන්න

අතීත භව කාන්තාරයේ ඔබ අයිති කොටගත්, දේ ගැන නැවත නැවත කමටහනක් කොට මෙනෙහි කරන්න. ඔබ අතීතයේ ධ්‍යාන ලාභීන් ලෙස, අහසින් ගමන් කළ හැටි, දියමත ගමන් කළ හැටි, මෛත්‍රී ධ්‍යාන ලබා මනුෂ්‍යයින් දෙවියන් බ්‍රාහ්මණයින් වසඟයට ගත් හැටි, මෙනෙහි කරන්න. මේ අතීත භවයන්හිදී ඔබ කළ දේවල් ගැනයි මෙනෙහි කරන්නේ. අතීතයේ එහෙව් අසිරිමත් කෙනෙක් ඔබ, ආත්ම විශ්වාසය, ආත්ම ශක්තිය, මේවා මෙනෙහි කරමින් වර්ධනය කරගන්න. ඔබ කවුද කියන කාරණය අතිශයෝක්තියෙන් තොරව ඔබ දකින්න. ඔබ අතීත භවයන්හිදී නවත්වපු තැන මෙනෙහි කරන්න. ඔබ තුළ සැඟවුණු අයෝමය ශක්තිය මෙනෙහි කරමින් මතු කොට ගන්න. වර්තමානයේ ජීවමාන ලොව්තුරා බුදුරජාණන් වහන්සේ නමක් නැහැ. පින්වත් ඔබට සූනීතට, සෝපාකට, කිසාගෝතමියට පිහිට වූවා සේ ඔබව ආශ්චර්යමත් පෙළහර මතුකොට දී සත්‍ය පසක් කොට දෙන්න. ඒ නිසා ඔබ කවුද කියන කාරණය ඔබ තුළින්ම මතු කොට ගන්න. මාන්නයෙන් තොර වූ අයෝමය ආත්මශක්තියත් ඔබ තුළින්ම මතු කොටගෙන, භාවනාවට යොමු වෙන්න. සමාධියේ ආශ්වාදය උදෙසා නොව, වේදනාවේ නිරෝධය සඳහා ඉලක්කය යොමු කරන්න. අතීතයේ ඔබ දිග්විජය කළ ධ්‍යාන ඵලයන් ගැන නැවත වර්තමානයේ මොහොතක් හෝ, තෘෂ්ණාව ඇති නොකරගන්න. එවැනි සිතුවිල්ලක් සකස් වෙන මොහොතේම එය තෘෂ්ණාව

බව හඳුනාගන්න දුක සකස්කරන සැබෑම සතුරා තෘෂ්ණාව නිසා අරමුණු වන, සෑම රූපයක්ම අනිත්‍ය සංඥාවෙන්ම මෙනෙහි කරන්න. කොතනකවත් තෘෂ්ණාවට ඉඩක් සකස් කරන්න එපා. තෘෂ්ණාවට ඉඩක් සකස් කළොත් එහි ඵලය, දුක බව දකින්න. අතීත භවයන්හිදී රූපී අරූපී බ්‍රහ්මතල ස්පර්ශ කිරීමට සමත් ශක්තිය ඔබ ලැබූවත් එම සංස්කාරයෝ අනිත්‍ය බව මේ මොහොතේ ඔබේ ජීවිතය තුළින් දකින්න.

යමක් අනිත්‍ය නම්, එය දුකයි නේද? එසේ නම් එම දුක පසුපස පරණ පුරුද්දට නැවත නොයන්න. මෙය සටහන් කරන භික්ෂුව එක තත්පරයකදීහෝ ධ්‍යාන අවස්ථාවක් පිළිබඳ තෘෂ්ණාවක් සකස්කොට නොගත් බව කියමි. අනිත්‍යභාවයට පත්වන ධ්‍යානයන්, ධ්‍යාන ස්වභාවයෙන්ම තිබේවී. නැතිවේවී. ඔබ ඒ දුක කරට ගන්න යන්න එපා. දුක ප්‍රයෝජනයට ගෙන සැබෑම සැපය ලබාදෙන මාර්ගයට අවතීර්ණ වන්න. පින්වත් ඔබ භාවනාවට යොමුවෙන්නේ හුදු කායික මානසික විවේකයක් සකස්කොට ගැනීමට නම් ඉහත අදහස් ඔබට නොගැලපෙනවා වෙන්න පුළුවන්. නමුත් එවැනි පින්වතුන් සිතන්න ඕනේ, අනිත්‍යභාවයට පත්වෙන විවේකයක් උදෙසා, අනිත්‍යභාවයට පත්වෙන සමාධියක් පසුපස යෑම අර්ථයක් නොවන බව.

සමාජය සංකීර්ණභාවයට පත්කර ඇත්තේ තෘෂ්ණාව විසින්මයි. එම සංකීර්ණභාවයෙන් ඔබ තුළ සකස්වෙන මානසික පීඩනයෙන් මිදීම සඳහා, ඔබ සමාධි භාවනාවක් කෙරෙහි තෘෂ්ණාව සකස් කොට ගෙන භාවනාවට යොමුවෙනවා. එය බොහොම හොඳ දෙයක්. නමුත් මෙතැනදි ඔබ දක්ෂ නම්, ඔබ තුළ ඇතිවන මානසික පීඩනය සකස් කළෙත් තෘෂ්ණාවයි, ඉන් මිදීමට සමාධි භාවනාවන් කෙරෙහි සකස් වුනෙත් තෘෂ්ණාවමයි කියලා හිතන්න, ඒ ඔබ දකින්නේ තෘෂ්ණාවෙන් මිදීමේ ආර්ය අෂ්ටාංගික මාර්ගයයි. ඔබ එක සිතිවිල්ලක් නුවණින් සකස් කොට ගත් සැනින්, අර්ථවත් ලෙස මාර්ගයට අවතීර්ණ වෙනවා. මොකද ඔබ අතීතයේ රූපී, අරූපී සංඥා ස්පර්ශ කර අත්දැකීම් තියෙන

නිසා. ඒවා අනිත්‍යයි කියන සංඥාව මතුකරගැනීමට ඔබට අපහසු නැහැ. එසේ නොවුනහොත් ඔබ අතීත භවයන්හිදී පටලවාගත් සේ, මෙවරද පටලවාගනු ඇත. භාවනා කිරීමට කැමැත්ත අත්‍යවශ්‍යය. එහෙත් ඔබගේ සිත සමාධිමත් භාවයට පත්වූ සැනින්, එම කැමැත්ත අනිත්‍ය සංඥාවට යොමුකිරීමට ඔබ දක්ෂ විය යුතුය. කැමැත්තෙත්, අකමැත්තෙත් අනිත්‍යභාවය ඔබ විදර්ශනාවට ලක්කළ යුතුය. ඒ නිසා අනිත්‍යභාවයට පත්වෙන සමාධිමත් සිත උපයෝගි කරගෙන ප්‍රඥාවේ ඇත්ත සොයා යෑමයි ඔබ කළ යුත්තේ. ඔබ අතීතයේ නොකළ එකම දෙයත් එයමයි. එම නිසා අතීතයේ නොකළ එකම දෙය වර්තමානයේ කරන්න. තමා තමාව කමටහනක් කරගන්න.

දුර බලන්න අවශ්‍ය නැහැ. ළඟ බලන්න අවශ්‍යත් නැහැ. තමා තමා දෙස බලන්න. මොකද ඔබ ගොඩනගාගත් ලෝකය තිබෙන්නේ තමා තුළ නිසා. තෘෂ්ණාව නිසා තමා තුළ තමා සකස් කොට ගෙන ඇති ලෝකය දෙස බලන්න. ඒ ලෝකය තුළ ඇස, කන, නාසය, දිව, මනස, කය තිබෙනවා. ඒ ලෝකය තුළ ඉර, හඳ, තරු, අම්මා, තාත්තා, දරුවා සිටිනවා. ඔබ මේ සියල්ල මගේ ලෝකය තුළ බැඳගෙන සිටින්නේ තෘෂ්ණාව නැමැති යදමින්. තෘෂ්ණාව නැමැති සංසාරයක් පුරාවට ශක්තිමත්ව වැඩුණු යදම ආර්ය අෂ්ටාංගික මාර්ගයේ ගමන්කර සිඳ දමා ගතහොත් ඔබට ඉහත ලෝකය අතහැරෙනවා.

නමුත් රහතන් වහන්සේටත් ඇසක්, කනක්, දිවක්, නාසයක්, මනසක්, කයක් තිබෙනවා. අහස, පොළොව, අම්මා, තාත්තා ඉන්නවා. නමුත් මේවා මගේ කරගත් තෘෂ්ණාව ක්ෂයවෙලා. ලෝකයට අයිති දුකෙන් නිදහස් වෙලා. ඔබ භාවනා කිරීමට පෙර, දුකත්, දුකට හේතුවත් වෙනකොට හඳුනාගන්න. මේ දෙවල් මෙනෙහි කරන්න පින්වත් ඔබට එරමිනියා ගොතාගෙන ඉන්න අවශ්‍යම නැහැ. විවේක සෑම මොහොතකම මේ කාරණා ගැන මෙනෙහි කරන්න.

## භාවනාවට පෙර තෙවන කොටස

# සිත තැන්පත් නොවීමත් භාවනාවට ආයෝජනයක් කරගන්න

ආනාපාන සති භාවනාව කරන්න සුදුසු ඉරියව්වකින් වාඩිවුනාට පස්සේ පින්වතුන් විශාල පිරිසකට තිබෙන ප්‍රශ්නයක් තමයි ආශ්වාස ප්‍රාශ්වාසයේ සිත නොපිහිටා බාහිර අරමුණක් ඔස්සේ සිත දිවයෑම. මෙතැනදී ඔබ නොසන්සුන් වෙන්න පුළුවන්. අලසවෙන්න පුළුවන්. භාවනාව කෙරෙහි උදාසීන වෙන්න පුළුවන්. මේ සියල්ල ඔබ තුළ සකස් වෙන්නේ පංච නීවරණ වශයෙන්. අරමුණු වේගයෙන් සකස් වෙනවාය කියන්නේ, ඔබතුළ ඇලීම් ගැටීම්වල ස්වභාවය වැඩිය කියන කාරණයයි.

මෙතැනදී ඔබ ඇලෙන්නේ හෝ ගැටෙන්නේ රූපයකට. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා සිත මාරයාය කියලා. එහෙමනම් ඔබ දක්ෂ වෙන්න ඕනේ තැනපත් භාවයෙන් තොර ඔබේ සිත මාරයා වශයෙන් දකින්න. දැන් මේ මාරයා තමයි ඔබට බාධා කරන්නේ, සිත සමාධිමත් භාවයට පත්වන්නට ඉඩ නොදී. මේ හඳුනාගැනීම ඔබ කළාට පස්සේ ආනාපානසති භාවනාවෙන් සිත බැහැර කරලා විවේකීව, වේගවත් සිතිවිලි දෙස බලාසිටින්න.

ඔබට ධර්ම මාර්ගයේ අවබෝධය කරා යෑම වැළැක්වීමට මාරයා උපක්‍රමශීලී වෙනකොට ඔබ දක්ෂ වෙන්න ඕනේ මාරයාට වඩා උපක්‍රමශීලීවීමට. මාරයාට මාර ධර්මයෙන්ම විරුද්ධ දිශාවට යෑමට මාර සිත රැවැට්ටීමට ඔබ දක්ෂ විය යුතුයි. විවේකීව වාඩිවෙලා වේගයෙන් අරමුණු ගලාගෙන එන සැටි බලාසිටින්න. ඒවයේ

ඇතිවීමත්, වැනසීමත්, එම සිතිවිලි සකස්වෙන වේගවත්භාවයත් දකිමින් ඔබ ඔබට චෝදනා කරගන්න, ගැටෙන්න එපා. ඔබ තව තව ප්‍රබෝධමත්ව සිතිවිලි දෙස බලන්න. සිතිවිලි සකස්වීමේ වේගවත් භාවය කියන්නේ මාරයාගේ වේගය බව දකින්න. මේ වේගවත් භාවයේ වේගයට සමාන වේගයකින් මාරයාගේ ලෝකයේ නැවත උපතකට අවශ්‍ය සංස්කාර ධර්මයන් තමන් රැස්කොට ගන්නා බව දකින්න. ඔබේ සිතිවිලි ඇලීම්, ගැටීම් ඔස්සේ වේගවත් වෙනවාය කියන්නේ අනාගත දුක් උදෙසා වේගවත්ව සංස්කාර රැස්කිරීම බව දකින්න. ඔබ මුළින්ම භාවනාවට වාඩිවුනේ ආනාපාන සති භාවනාව කරන්නයි. සිත තැන්පත් කරගන්න බැරිව ගියා. නමුත් ඔබේ දක්‍ෂභාවය නිසා දැන් කුමක්ද සිද්ධවෙන්නේ. ධම්මානු පස්සනාවයි, වේදනානු පස්සනාවයි, චිත්තානු පස්සනාවයි වැඩෙන්නේ.

ඔබ සිතේ සකස්වෙන ගොරහැඩි චංචල සිතිවිලි දෙස බලාසිටියදී එම සිතිවිලිවල චපල බව, රාගික බව, තෘෂ්ණාධික බව, මෛත්‍රී සහගත බව ආදී ස්වභාවයන් පෙනේවි. මේවා දෙයාකාරයක සිතිවිලි. ඒවායේ ඇතිවීම, නැතිවීම දකිනකොට ඔබ තුළ වැඩෙන්නේ විදර්ශනාවයි. ඔබ විනිවිද දකිනවා, සිත විමර්ශනයට ලක්කරනවා. මෙහෙම තමයි ඔබ මාර ධර්මයන්ට පහරදිය යුත්තේ.

මුළින්ම ඔබ ආනාපාන සති භාවනාව කරන්න ගිහින් පංච නීවරණ නිසා එයට අවස්ථාව ලැබුණේ නැහැ. ඔබ දක්‍ෂ වුනා එම බාධකය වඩාත් ඉහළ ජයග්‍රහණයක් කරා ඔසවා ගන්න. ඒ කියන්නේ විදර්ශනාවට සිත යොමු කරන්න. මේ දක්‍ෂ භාවය ඔබ ලබන්න නම්, සිත කියන්නේ මාරයාය කියන කාරණය කමටහනක් ලෙස ජීවිතයට එකතු කර ගන්න ඕනේ. එහෙම එකතුකර ගත හොත් ඔබට පුළුවන් භාවනාවට එරෙහිව එන පංච නීවරණයන් ලෙහෙසියෙන් යටපත්කොට දමන්න.

ඔබ උදාහරණයක් හැටියට හිතන්න, භාවනාව කියන්නේ ක්‍රීඩාවක්ය කියලා. ඔබේ ප්‍රතිවාදියා තමයි මාරයා. ප්‍රතිවාදියා

නිරතුරුවම උපක්‍රම යොදන්නේ ඔබව පරාජය කොට, තමා ජයගන්න. මෙතැනදී ප්‍රතිවාදියා ඔබට එල්ල කරන උපක්‍රමය තමයි පංච නීවරණ. පංච නීවරණවලින් මාරයා ඔබට දමා ගසද්දී, ඔබට තිබෙන්නේ සංසුන් ඉරියව්වෙන් මාරයාගේ ඉරියව් දෙස බලා සිටීම පමණයි. ඔබේ දැවීයෑම ගැන ඔබ සිතන්න එපා. පරාජය ජයග්‍රහණය ගැන ඔබ සිතිය යුතු නැහැ. මොකද පරාජයත්, ජයග්‍රහණයත් යන දෙකම අනිත්‍යභාවයට පත්වන ධර්මතාවයන්. ඒවා අයිති මාරයාටයි. ඔබ මේ උත්සාහ ගන්නේ ජය පරාජය දෙකින්ම මිදී අවබෝධයෙන් නිදහස ලබාගැනීමටය. අවබෝධයෙන් නිදහස් වීම යනු ධර්මයේ අර්ථයයි.

ඔබ මේ ක්‍රමවේදය යොදාගනිමින් ආරක්ෂා වෙන තරමට, මාරයාට හති වැටෙන බව ඔබ දැනගත යුතුය. පින්වත් ඔබ වේගවත්ව ඇතිවන අරමුණු දෙස, ඒවා ඇතිවීම, නැතිවීම දෙස බලාසිටින්න. මඳ සිනහ පහළකරමින් දකින්න. ප්‍රබෝධමත්ව දකින්න. මාර ධර්මයන් හේතුවෙන් මොහොතක් හෝ කම්පා නොවන්න. පසුතැවිලි නොවන්න. කෙළෙස් විඩාවට පත්කොට, තැන්පත් සිතක් සකස් කොටගෙන නැවත අවශ්‍ය භාවනාවට යොමුවන්න.

මොනම හේතුවකින්වත් මෙය මෙසේ විය යුතුයි කියා දෘෂ්ටිගත වන්න එපා. කාලසටහන් සාදාගෙන භාවනාවට යොමුවෙන්න එපා. සියළු සංස්කාරයෝ අනිත්‍යයි කියමින්, දකිමින් භාවනාවට යොමුවන්න. පින්වත් ඔබ භාවනා කරන විට ඉදිරියට එන පංච නීවරණයන්ගේ ස්වභාවය මත ඔබේ ක්‍රමවේදයන් වෙනස් කරගැනීමට දක්ෂවෙන්න. එහෙම ක්‍රමවේදයන් වෙනස් කරගැනීමට ඔබ අදක්ෂ වුවහොත් ඔබ තුළ ඇතිවන ගැටළුවලදී ඔබ ගැටෙනවා. එය හරිම අවාසනාවක්. ඔබ මේ ඇලීම හැටියටත්, ගැටීම හැටියටත් අත්දකින්නේ ධම්මානුපස්සනාවයි. වේදනානුපස්සනාවයි. නමුත් ඔබ මේ උතුම් විදර්ශනා දැක්ම අතහැරලා, මගහැරලා ධර්මයත් සමග ගැටෙන දිශාවට යොමුවෙනවා. ධර්මය ඔබට ස්පර්ශ වෙන්නේ ගැටෙන්න නෙවෙයි. අවබෝධ කරගන්නයි.

මෙම සටහන් තබන භික්ෂුව ලැබූ යම් අවබෝධයක් වෙත්නම්, ඒ අවබෝධයට මහෝපකාරී වූයේ සිතේ ඇතිවූ ඇලීම්, ගැටීම් ස්වභාවයන්ගේ තීව්‍ර භාවයන්මය. මාරධර්මයන් නිසා භික්ෂුවගේ සිතේ ඇතිවූ ඇලීමේ, ගැටීමේ ස්වභාවයන් දෙස ධර්මානුකූලව විදර්ශනා ඥාණයෙන් බලමින් එම ඇලීම් ගැටීම් මගේ කර නොගෙන, ඒවායේ නිර්මාතෘවරයා දෙසටම එල්ල කිරීමට භික්ෂුව දක්ෂවිය. එම ක්‍රියාවලිය කොතෙක් සුක්ෂම, දක්ෂ ආකාරයට භික්ෂුව කළාද කිවහොත් අවසානයේදී, මාරයාගේම ඇලීමේ ගැටීමේ ස්වභාවය තීව්‍ර වී, මාරයා අමතක නොවන පාඩමක් භික්ෂුව වෙතින් ඉගෙන ගත්තේය. ඔහු දූන් බියට පත්වී හමාරය. ඔහු බියට පත් කළේ ඔහුගේ ධර්මතාවයන් තමාගේ කර නොගෙන, ඔහුටම පෙරළා යැවීම නිසාය. පෙරළා ගැසීම නොවේ. පෙරළා යැවීම නිසාය. පෙරළා ගැසීම යනු මාරයා සතුටුවන දෙයයි. මොකද එතැන ඇත්තේ ගැටීමයි, ව්‍යාපාදයයි. මාර ධර්මයන් පැමිණි විලසින්ම පෙරළා යැවීම මාරයා ගැටෙන ස්වභාවයයි. මාරයා පීඩාවට පත්කරන ස්වභාවයයි.

## භාවනාවට පෙර සිව්වන කොටස

# අකුසලය යටපත් කරන්න

# අමනුෂ්‍යයා අනිත්‍ය ලෙස දකින්න

භික්ෂුව හමුවීමට පැමිණි වයෝවෘද්ධ යුවලක් ප්‍රකාශ කළේ තමන් තරුණ කාලයේ කර්මය, කර්මඵලය ගැන නොදැනීම නිසා, විවාහ වූ අළුත අනවශ්‍ය පිළිසිඳගැනීමක් යැයි සිතා, දරුවෙක් ගබ්සා කළ බවත්, එම සිද්ධිය දැන් නිරතුරුවම මතකයට නැගෙන බවත්ය.

එවිට භික්ෂුව ප්‍රකාශ කළේ, එම සිද්ධිය ඔබලාගේ මනසට නිතර පැමිණෙනවා නම් එය භයානක බවයි. මොකද යම් දවසක තමන් මියයන මොහොතේ, එවැනි ප්‍රබල අකුසලයක් මතකයට පැමිණීමේ ප්‍රවනතාවය වැඩි නිසා. භික්ෂුව එම වයෝවෘද්ධ දෙපලට ප්‍රකාශ කළේ, ඔබ දෙපළ වර්තමානයේ හොඳින් තෙරුවන් සරණ පිහිටා ශිල්පද ආරක්ෂා කරගෙන ජීවත්වන නිසා, එම ශක්තිය උපයෝගී කරගෙන අතීත අකුසලය යටපත්කොට දමන ලෙසයි.

එහෙත් එම යුවල ප්‍රකාශ කරනවා, කොතෙක් අමතක කරන්න උත්සාහ කළත් එය මතකයට එනවා කියලා. එවිට භික්ෂුව ප්‍රකාශ කළේ, එසේනම් ඔබලා එම අකුසලය යටපත් කිරීම සඳහා ඊට වඩා ශක්තිමත් කුසලයක් සිදුකරගන්නා ලෙසයි. ඔබ දෙදෙනා ළමා රෝහලට ගොස් එහි නේවාසිකව ප්‍රතිකාර ගන්නා මරණාසන්න තත්ත්වයේ දරුවන් කිහිපදෙනෙක් වරින් වර තෝරාගෙන, එම දරුවන් මරණයෙන් බේරාගැනීමට අවශ්‍ය බෙහෙත්, ප්‍රතිකාර, සියළු වියහියදම් දරන්න කියලා. ඔබේ උත්සාහයෙන් එම දරුවන්

මරණයෙන් බේරාගත්තාට පසුව, තමන් මරණයට පත්වීමට ගිය දරුවෙක් බේරාගත්තාය කියලා ඔබ තුළ ඇතිවන ශක්තිමත් කුසල් සිත ප්‍රයෝජනයට ගෙන, දරුවෙක් ගබ්සා කළාය කියලා ඔබේ මතකයට නැගෙන අතීතයේ සිදුවූ කර්මය යටපත්කර අමතක කර දමන්නය කියලා.

චේතනාවයි කර්මයට මුල්වෙන්නේ. අතීත අකුසල් කර්මය, වර්තමාන කුසල් කර්මයෙන් යටපත් කළාය කියනා චේතනාව ඇති කර ගැනීමට ඔබ දක්ෂ වෙන්න කියලා. එවැනි මරණාසන්න දරුවන් මරණයෙන් බේරාගෙන ඔබ අදාළ පින්කම කළාට පස්සෙත්, ඔබලා අතින් සිදුවූ එම අකුසලය නැවත, නැවත මතකයට ගන්නවා නම් ඒ ඔබේ අදක්ෂ භාවයයි. එමනිසා අතීත අකුසල්, වර්තමාන කුසල් ධර්මයන්ගෙන් යටපත් කොට නැගී සිටීමට ඔබ දක්ෂ විය යුතුයි. සෑම විටම චේතනාවේ හැඩරුව අනුවයි විඤ්ඤාණය සකස් වෙන්නේ කියන කාරණය පැහැදිලි කර දෙන්නයි ඉහත කාරණය සඳහන් කළේ.

සමහර පින්වතුන් සිටිනවා අතීතයේ තමන් අතින් සිදුවූ වැරදි ගැන පසුතැවෙන අය. අතීතයේ කළ වැරදි ගැන පසුතැවීමෙන් තව තවත් අකුසල්මයි සිදුවන්නේ. එනිසා ඔබ දක්ෂ වෙන්න, හැකිතාක් කුසල් සිදුකරමින් අතීත අකුසල් යටපත්කොට දමන්න. මෙතැනදී ආනන්තරීය පාපකර්ම ඇතුළුව යටපත් කිරීමට නොහැකි අකුසල් තිබෙනවා. ඔබ අතින් සිදුවූ කුමන අකුසල් කර්ම තිබුණද, දැනුවත්ව හෝ අනවබෝධය නිසා ඇතිවූ ඇතිවූ වරදවල් තිබුණද, වෙච්ච දේ ගැන, අතීතයට ගිය දේ ගැන පසුතැවිලි නොවී වර්තමානයේ නිවැරදිව ජීවත්වෙන්න දක්ෂ වෙන්න.

භාවනා කිරීමට යොමුවන පින්වතුන් අතීතයේ සිදුවූ සිදුවීම්, ක්‍රියාකාරකම් නිරතුරුවම මතකයට ගලා ඒමෙන් සිත විසිරෙනවා. පින්වත් ඔබ ශීලයෙන් ශක්තිමත් නම්, ඒ කියන්නේ ඔබ තුළ ඉන්ද්‍රිය සංවරය තිබෙනවා. හිරි ඔතප් දෙක තිබෙනවා. මෙතැනදි

'හිරි ඔතප්' කියන්නේ ඔබ සතර අපායට වැටෙන්නට තිබෙන ලැජ්ජා බය දෙක. භාවනාවක් සාර්ථක කරගැනීමට ඉහත කාරණය අත්‍යවශ්‍ය වෙනවා. මෙතැනින් තමයි සංසාර බය සකස්කර දෙන්නේ, භවයෙන් ගැලවිලා යන්නට. සතර අපායේ නැවත උපතක් ලැබුවොත්, එය මොනතරම් දුකක්ද, ලැජ්ජාවක්ද, කුමන ගැලවීමක්ද?

මේ දුක ගැන නුවණින් මෙනෙහි කරමින් අසංවර ඔබේ සිත භාවනාවට පෙර නිශ්චල කරගන්න. අතීතයේ ඔබ හරකෙක්, ඌරෙක් ලෙස ඉපදිලා, අනුන් ඔබව මරාගෙන කෑ හැටි, ප්‍රේතයින් හැටියට උපත ලබලා, නිර්වස්ත්‍රව, කුසට අහරක් නැතිව, ශරීරය කුණුවෙලා, වනවෙලා..., ඉඩකඩම්වලට තෘෂ්ණාවෙන් බැඳිලා, මරණින් මතු එම ඉඩමේම ගල් ප්‍රේතයින්, බහිරවයින්, භූත ගෙම්බන් ලෙස ඔබත් මමත් ගතකළ ජීවිත ගැන මෙනෙහි කරන්න. නිරයට වැටී, ගින්දර, ලෝධිය, ගිණි අඟුරු මතින් ඔබව දැවුණු පිච්චුණු හැටි මෙනෙහි කරන්න. මේවා ගැන ඔබ ලැජ්ජාවෙන්න එපා. එහෙම ලජ්ජාවක් ඔබට සකස් වුණ හොත් එයට කියන වචනය, ලැජ්ජාව නොව 'සක්කාය දිට්ඨිය' බව හොඳින් නුවණින් දකින්න. යමෙක් තුළ සක්කාය දිට්ඨිය සකස්වෙනවා නම් ඔහු හෝ ඇය, තවම මාරයාගේ අත්සන් සහිත සතර අපායේ බඳු ගිවිසුම අහවර නොකළ කෙනෙක් බව සිතන්න. සතර අපායේ අයිතිය පිළිබඳ බදු ගිවිසුම පස් අවුරුදු හෝ අනූනව අවුරුදු බදු ගිවිසුම් නොව, කල්ප ගණන් දීර්ඝ කාලයක් සඳහා ලියන බදු ගිවිසුම්ය. එහි 'බදුදෙන්නා' වශයෙන් මාරයාත්, 'බදුගන්නා' වශයෙන් ඔබත් අත්සන් කොට ඇත. මෙය තවත් නිරවුල් වශයෙන් කියනවා නම්, මාරයා වශයෙන් ඔබ තුළ ඇති ඡන්ද රාගයත්, එම ඡන්ද රාගය නිසා ඔබ තුළ ඇතිවන සක්කාය දිට්ඨිය බදුකරු වශයෙනුත් දැක්විය හැකිය.

සතර අපායේ සත්ත්වයා විඳින දුක ගැන අවබෝධයකින් තොරව, සතර අපායෙන් මිදීම යනු ප්‍රශ්නාර්ථයකි. තිරිසන්, ප්‍රේත, නිරය, අසුර ලෝකයේ දුක් විඳින සෑම සත්ත්වයෙක්ම,

පෙර ජීවිතයකදී ඔබත් මමත් වැනි මනුෂ්‍යයෙක්ම බව සිහිපත් කරගන්න. ඔබ තිරිසන් සතෙක් දුටුවහොත් එම තිරිසන් සතාගේ රූපය තුළින් දුසිල්වත් මනුෂ්‍යයෙකුගේ රූපයක් සිතින් මවා ගන්න දක්ෂවෙන්න. ඔබ ප්‍රේතයකුගේ රූපයක් දුටුවහොත්, මසුරුබවින් යුත් මිනිසකුගේ රූපයක් එම රූපය තුළින් මතුකරගැනීමට දක්ෂවෙන්න.

මේවා භාවනාව ක්‍රමවත්ව වඩවා ගැනීමට අවශ්‍ය උපක්‍රමය. මේ උපක්‍රම මාරයාට එරෙහිවමය. සාමාධියෙන් ආශ්වාදය නැමැති සුදු පිරුවටයෙන්, මාරයා, සතර අපාය ඔබෙන් වසන්කොට, සතර අපායේ ජීවත්වන ප්‍රේත රූප, අමනුෂ්‍ය රූප පෙන්වා ඔබව නොමග යවනකොට, එම සුදුපිරුවටය විනිවිද සතර අපායේ අනතුර දැකීමට ඔබ දක්ෂ විය යුතුය. සමාධි භාවනාවේදී ඔබට හමුවෙන අමනුෂ්‍ය රූප, රූපයේ අනිත්‍යය දකිමින්, ඇතිවූ ස්වභාවයෙන්ම අනිත්‍යභාවයට පත්වීමට ඉඩහරින්න. එම අමනුෂ්‍ය රූපයන් කෙරෙහි ආශ්වාදයක් සකස් කොට ගන්න එපා. සමහර පිංවතුන් එම අමනුෂ්‍ය රූප දැකගැනීමට හැකිවීම ආශ්වාදයක් ලෙසින් ගෙන එම ආශ්වාදයේ බැඳී, සතර අපායේ ජීවත්වෙන සත්වයෙක් නිසා භාවනාවේ සැබෑ අර්ථය අහිමි කර ගන්නවා.

භාවනා කරන විට ඔබට දර්ශනය වන අමනුෂ්‍ය රූප, බොහෝ අවස්ථාවල ඔබ නොදන්නා වූ අතීත ජීවිතවල ඥාති ප්‍රේතයින්. ඔබ එම ප්‍රේතයින් කව්රුන්දැයි කියා නොදන්නවා වුනත් එම ප්‍රේතයින් ඔබව දන්නවා. ඒ අය සතර අපායේ ජීවත්වන පිං මඳ පිනට අකමැති පිරිසක්. ඒ පිනට අකමැති ප්‍රේතයින් කැමති නැහැ ඔබ භාවනා කරනවට. ඔබ සතර අපායෙන් මිදෙනවට. එම ප්‍රේත පිරිස් උත්සාහ ගන්නේ තම ඥාති පිරිසත් තමන්ගේ ගොඩටම ඇඳා ගන්නයි. ඔබ ඒ අයගෙන් මිදී සුගතියට යනවට ඒ අය කැමති නැහැ. එම නිසා මෙවැනි අමනුෂ්‍ය රූප මාරයා වශයෙන් හඳුනාගෙන, අනිත්‍යය දැකීමට ඔබ දක්ෂ විය යුතුයි. එසේ නොවුන හොත් එම අමනුෂ්‍ය පිරිස් නැවත නැවත විවිධ

ප්‍රේතයන් ඔබ ඉදිරියට පමුණුවනු ඇත. මෙම ක්‍රියාවන් ධර්මය නොදන්නා අමනුෂ්‍යයන්ගේ අසත්පුරුෂභාවයන්ය. පින්වත් ඔබ ශීලයෙන් පරිපූර්ණ නම් අමනුෂ්‍යයෙකුට ඔබට කළහැකි දෙයක් නොමැති බවට ධර්මයේ නාමයෙන් ඔබ තුළ විශ්වාසයක් තිබිය යුතුය. හැබැයි එම ශීලය තණ්හා, මාන්න, දිට්ඨිවලින් අපිරිසිදු නොවිය යුතුය. මෙවැනි කරුණු නිරාකරණය කරගැනීමට අදාළ පින්වතා තුළ නිහතමානීකම අත්‍යවශ්‍යයෙන් තිබිය යුතුය.

## භාවනාවට පෙර පස්වන කොටස

# භවය යනු කඳුළු සාගරයකැයි නුවණින් දකින දා..

සමාධිය ගැන කථා කිරීමේදී කොතැනකින් හෝ මතුවී එන්නේ ශීලයේම ශක්තියයි. ශීලයේ දුර්වලභාවය නිසාමයි සතර අපාය නිර්මානය වී තිබෙන්නේ. ඒ හේතුව නිසාම පින්වත් ඔබ භාවනාවට පෙර ශීලය ගැනත්, සතර අපාය ගැනත් පූර්ව කෘත්‍යයක් ලෙස මතක් කරන්න.

මේ ලෝකයේ යම් මනුෂ්‍යයෙක්, දෙවියෙක්, බ්‍රහ්මයෙක් චතුරාර්ය සත්‍ය, අරහත් ඥානය අවබෝධ කරගැනීමට මොහොතකට පෙරාතුව ඉහළ සමාධි තලයකදී තම අනුදැනුමකින් තොරවම පූර්වේ නිවාසානුස්සති ඥානය ඇතිවෙනවා. ඒ කියන්නේ පෙර ආත්මභාවය දැකීමේ ඥානයයි. තමා ඉපදී සිටි පෙර ආත්මභාවයන් දැකීමේ ඥානය. තමා ඉපදී සිටි පෙර ආත්මභාවයන් සිහිවීමේ ඥානය. එම ඥානය තුළින් අරමුණු වෙනවා. අතීත භවයන් හිදී තමා තිරිසන් සතුන් වශයෙන් ඉපදී හරකුන්, ඌරන්, එළුවන්, කුකුළන් වශයෙන් ඉපදී මිනිසුන් තමාව මරාගෙන කන හැටි, හිස ගසා දමන හැටි, මනුෂ්‍ය ජීවිතවල ඉපදිලා රාජ දඬුවම් නිසා අතපය හිස කපා දමාලා අනතුරු වලට ලක්වෙලා ශරීරය කුඩුවෙලා, යුද්ධවලට මැදිවෙලා කපා කොටාගෙන මියගිය හැටි.

භවය කියන්නේ ලේ සාගරයක්ය, කඳුළු සාගරයක්ය කියන කාරණය මේ ඥාන දර්ශන තුළින් දකිනවා. මෙන්න මේ අතීත බිහිසුණු කථාව පූර්වේ නිවාසානුස්සති ඥානය තුළින්

අරමුණුවෙද්දී තමයි ඔහු තුළ සප්ත බොජ්ජංග ධර්ම සකස් වෙන්නේ. සංසාරය පුරාවට අත්විඳි අතිබිහිසුණු බේදවාචකය අරමුණු වෙනකොට ඔහු තුළ සංසාර ගමනේ මෙතෙක් තමා තුළ ඇති නොවුන සති, ධර්මවිජය, වීර්ය, ප්‍රීති, පස්සද්ධි, සමාධි, උපේක්‍ෂා ධර්මයන් ඇතිවෙනවා. අතීත භවයන්හිදී අත්විඳි අතිබිහිසුණු දුක අරමුණු වෙනකොට තමයි බව නිරෝධය සාක්‍ෂාත් කිරීමට අවශ්‍ය වීර්යය සකස්කොට දෙන්නේ. නමුත් මේ මොහොතේ තමා තුළ වැඩෙන්නේ පූර්වේ නිවාසානුස්සති ඥානය කියලා ඔහුට දැනීමක් නැහැ. එම ඥානය ලැබෙයි කියලා බලාපොරොත්තු වුනෙත් නැහැ. පූර්වේ නිවාසානුස්සති ඥානය ගැන ඔහුට පෙර දැනීමක් තිබුණෙත් නැහැ. එකම අරමුණයි ඒ මොහොතේ තිබෙන්නේ. ඒ භව නිරෝධය පමණමයි. 'ඇලීමකින් ගැටීමකින් තොරව අවසාන හුස්ම පිටවේවා ! ' කියන කාරණය. ඔහු තුළ ඇලීම් ගැටීම්වලින් තොර උපේක්‍ෂාව කියන මට්ටමට සිත සමාධිමත්වයි පවතින්නේ. සතිය සිහිය, අරමුණ කෙරෙහි හොඳින් විවෘතව පවතිනවා.

මේ මොහොත වෙනකොට ඔබ පැහැදිලි තීරණයකට ඇවිත් සිටින්නේ. එක්කෝ භව නිරෝධය, නැතිනම් මරණය කියන කාරණයයි. මේ තීරණයේදීම ඔහුට සියයට අනූවකින් භවය අතහැරිලා. නමුත් කුමක්දෝ තැනකින් තවමත් බැඳීමක් පවතිනවා කියලා ඔහුට දැනෙනවා. කුමක්දෝ කුඩා රැහැනකින් ඔහුගේ ජීවිතය ලෝකයාට බැඳී තිබෙනවාය කියලා. මේ මොහොතේදී ඔහුට ශක්තිමත් විශ්වාසයක් සකස් වෙනවා මේ ව්‍යායාමයේදී දානය නැතිවීම හෝ වෙනත් බාහිර අනතුරකින් ජීවිතය නැති වුනොත් මරණයකට තත්පරයකට හෝ පෙරාතුව නියත වශයෙන්ම භව නිරෝධය සාක්‍ෂාත් කරගන්නා බවට. මේ විශ්වාසය ගොඩ නගන්නේ ඔහු තුළ සකස් වෙන සති ධම්මවිජය බොජ්ජංගයයි. මෙතැනදී තමයි අයෝමය වීර්යය සකස්කොට දෙන්නේ. මේ වීර්යය තුළින් සිද්ධ කරන්නේ භවයට බැඳී ඇති තෘෂ්ණාව සිඳ දැමීමට ඔහුව මෙහෙයවීමයි. ඔහු මනුෂ්‍ය ලෝකය

තුළ දිව්‍ය තල, බ්‍රහ්ම තලවල ස්ථිර වූ නිත්‍ය සැපයක් නොමැති බව ඉතාමත් සියුම්ව නැවත, නැවත මෙනෙහි කොට බලනවා. මනුෂ්‍ය ලෝකයේ කෝටි ප්‍රකෝටිපතියන් රජවරු සිටුවරු ජනනායක වරු කලාකරුවන් දෙස් විදෙස් වශයෙන් ඥාති නොඥාති වශයෙන් ජරා ව්‍යාධි මරණයන්ට පත්වී අසරණව මියයන හැටි විදර්ශනා නුවණින් විනිවිද දකිමින් ඉතා සියුම් ආකාරයට මෙනෙහි කරනවා. අතීත භවයන්හිදී තමාද මේ සැප අත්විඳ දුකට වැටුණ අන්දම සිහිකරනවා. මෙහෙම දකිමින් මනුෂ්‍ය ලෝකය තුළ ඉඳිකටු තුඩක තරම්වත් උපාදානයක් සකස් නොවන තැනට සතිය සිහිය යොමුකොට බලනවා. මොකද මනුෂ්‍ය ලෝකය කෙරෙහි ඉඳිකටු තුඩක තරම්වත් තෘෂ්ණාවක් සකස්වුනොත් ඊට අදාළ උපාදානය සකස්වෙන නිසා. තමා තුළින්ම මනුෂ්‍ය ලෝකය කෙරෙහි ඉඳිකටු තුඩක තරම්වත් උපාදානයක් නැතැයි කියලා අවබෝධයෙන් ප්‍රත්‍යක්ෂව දකිනවා.

දෙවැනිව ඔහු දිව්‍ය තලවල සශ්‍රික බව අත්විඳින දෙවියන්, දිව්‍යාංගනාවන් ගැන මෙනෙහි කරනවා. දිව්‍ය සැපයේ අනිත්‍ය බව, සශ්‍රික දෙවියන් දිව්‍යාංගනාවන් කල්ප ගණන් දිව්‍යතලවල ජීවත් වුවද එම පින අභවර වෙනකොට ඔවුන් අත්විඳින දුක වේදනාව, දිව්‍යලෝකවලින් පින් අභවර වී චුතවන දෙවිවරුන් නගන අඳෝනා විලාපයන් නුවණින් සිහිකරනවා. දිව්‍ය සළු කිළිටි වෙලා පැහැපත් ප්‍රභාශ්වර දඹරන් පැහැ දිව්‍ය ශරීර දහඩියෙන් තෙත්වෙලා, අවපැහැ ගැන්විලා නේක වර්ණ සළුපිළි, නේක වර්ණ මානිකායයන් ඔබ්බවපු ඔටුනු දුර්වර්ණව යන හැටි, කාමච්ඡන්දයන්ගෙන් ප්‍රමාදභාවයට පත්ව සිටි දෙවියන් දිව්‍යතලවලින් චුතවන මොහොතේ ගැටෙන සිතෙන් නැවත සතර අපායන්ට වැටෙන හැටි නුවණින් මෙනෙහි කරනවා. මෙසේ මෙනෙහි කරමින් දිව්‍යතල කෙරෙහි ඇති උපාදානය නැතිකොට ගන්නවා. අවසානයේදී දිව්‍යතලවල සශ්‍රික දෙවියන්, ශක්‍ර දෙවියන්, සුජම්පතී බිසව අරමුණට ගන්නවා. ඔවුන් විඳින්නාවූ අප්‍රමාන සශ්‍රිකභාවය නුවණින් දකිමින් ඒවාද අනිත්‍යභාවයට පත්වී

එම ශක්‍ර දෙවියන්ද, එම පිරිසද නැවත සතර අපායට වැටෙන අයුරු මෙනෙහි කරනවා. නැවත නැවත ඉතා සියුම්ව බලනවා ඉඳිකටු තුඩක තරම්වත් ඉඩක් කෙරෙහි තෘෂ්ණාවක් තමා තුළ දිව්‍ය තල කෙරෙහි බැඳීමක් සකස් වෙනවාද කියලා. මොකද දිව්‍ය සැපයේ අග්‍රම සැපය වන ශක්‍රයා කියන සැපය කෙරෙහි අල්පෙනෙති තුඩක තරම්වත් තෘෂ්ණාවක් තිබුනොත් ඒ කෙරෙහි උපාදානය සකස්වීමට පුළුවන් නිසා.

මේ දේවල් ඔහුට පෙළඹවීමකින් තොරව තමා තුළ වැඩෙන සතිය සිහිය විසිනුයි සිදුකරන්නේ. වීර්යය සතියට උපකාර කරනවා. මේ සිද්ධිය මෙනෙහි කරනකොට ධර්මවිජය බොජ්ජංගයමයි වැඩෙන්නේ. පස්සධිය, සමාධිය සියල්ල විනිවිද දැකීමට උපකාරී වෙනවා. ඊට බාහිර දෙයක් ඔහුට මේ මොහොතේ නැහැ. මොකද නිවීම කියන අරමුණ කෙරෙහි සතිය බලවත්.

ඔහු මනුෂ්‍ය ලෝකය දිව්‍යතල කෙරෙහි අල්පෙනෙත්ති තුඩක තරම්වත් උපාදානයක් තමා තුළ නොමැති බව අවබෝධකරගත් පසු මනුෂ්‍ය දිව්‍යතල කෙරෙහි තෘෂ්ණාව සම්පූර්ණයෙන්ම ඔහුගෙන් ක්‍ෂය වෙලා සප්ත බොජ්ජංග ධර්ම හරහා වැඩෙන ප්‍රඥාව විසින් තමාට ඒ බව තහවුරුකොට දෙනවා. මේවා සියල්ල හේතුඵල ධර්මතාවයන්.

ඊළඟට ඔහු බ්‍රහ්ම තල පීර පීරා බලනවා. රූපී අරූපී මාර්ගඵලලාභී බ්‍රහ්මයින් වැඩ සිටින මේ කොයියම් බ්‍රහ්ම ලෝකයක හෝ ස්ථිර, නිත්‍ය වූ සැපයක් තිබෙනවාද කියලා. එකලාව එරමිනියා ගොතාගෙන සමාධිය වඩන මාර්ගඵල ලාභී බ්‍රහ්මයින් ගැන මෙනෙහි කරනවා. ඉතා සියුම් මීදුමක් සේ ශරීරයක් සහිතව එරමිනියා ගොතාගෙන සමාධිය වඩන අරූපී බ්‍රහ්මයින් මෙනෙහි කරනවා. අරූපී බ්‍රහ්මයින්ගේ කය, ඝන භාවයෙන් තොර සියුම් මීදුමකින් වගෙයි හැදිලා තිබෙන්නේ. රූපයක් නැහැ කීවාට රූපය තිබෙනවා සැඟවිලා. සමාධි සැපය කෙරෙහි ඇති තෘෂ්ණාව නිසා සමාධිය නිත්‍ය, ස්ථිර භාවයෙන් දකින බ්‍රහ්මයින්ගේ

අවිද්‍යා සහගත සිත ඔහු නුවණින් මෙනෙහි කරනවා. බ්‍රහ්මයා මේ සා සමාධියෙන් පරිපූර්ණ වුවත්, තෘෂ්ණාව සත්ත්වයාට අත්කර දෙන ප්‍රමාදී භාවය දකිමින් ආර්ය ආෂ්ටාංගික මාර්ග යෙන් බැහැරවූ සත්ත්වයාගේ ප්‍රමාදය දකිමින් බ්‍රහ්මතල කෙරෙහි ඇති කැමැත්තෙන් මිදෙනවා. සතර අපායෙන් නොමිදුණු රූපී, අරූපී බ්‍රහ්මතලවල බ්‍රහ්මයින් බ්‍රහ්ම සැප අනිත්‍යවී නැවැත සතර අපායට වැටෙන අයුරු ඔහු නුවණින් දකිනවා.

අවසානයේ ඔහු බ්‍රහ්මයා කියන සැපය කෙරෙහි අරමුණු කරනවා. මහා බ්‍රහ්මයා මේ ලෝක ධාතුවේ ලොකුම සැපය ලෙසින් හැඳින්වුවත් ඔහුද අවිද්‍යාව තුළ ජීවත්වන්නෙක් බව මෙනෙහි කරනවා. අවිද්‍යාව යම් තැනකද එතැන දුක බව දකිනවා. මහා බ්‍රහ්මයාද සතර අපායෙන් මිදී නොමැතිනම් බ්‍රහ්ම සැප අවසන්වීමෙන් පසු සතර අපායට වැටීමේ අවදානමෙන් ඔහු මිදී නැති බව නුවණින් දකිනවා. මෙසේ දකිමින් මහා බ්‍රහ්මයා කියන සැපය කෙරෙහි ඇති තෘෂ්ණාවෙන්ද මිදෙනවා. නමුත් නැවත නැවත සියුම්ව අවධානය යොමුකරනවා අල්පෙනෙත්ති තුඩක තරම්වත් තෘෂ්ණාවක් බ්‍රහ්ම තල කෙරෙහි තිබෙනවාද කියලා. ස්ථිර වශයෙන් නිත්‍ය වශයෙන් බ්‍රහ්ම තලවල සැපයක් නොමැති බව අවබෝධයෙන් දකිමින් බ්‍රහ්මතල කෙරෙහි ඇති තෘෂ්ණාවෙන් මිදෙද්දී භික්ෂුවගේ සිත පිහිටන්න වෙන තැනක් මේ ලෝක ධාතුව තුළ නැහැ. මොකද මනුෂ්‍ය, දිව්‍ය, බ්‍රහ්මතල කෙරෙහි ඇති ඡන්දරාගය අවබෝධයෙන්ම සිඳුන නිසා. ඒ සිත පිහිටන්නේ ලෝකයෙන් මිදුන නිවීම තුළයි. භව නිරෝධය තුළයි. භික්ෂුවගේ ඉහත නිවීමේ මෙහෙයුම සිදුවන මුළු රාත්‍රිය පුරාවට එම භික්ෂුව පුද්ගලික අරමුණුවලින් මිදිලයි ඉන්නේ. කොටින්ම භික්ෂුවට තමා ගැන දැනීමක් නැහැ. අනිත්‍ය කියන ධර්මය හැර වෙන ධර්මතාවයක් මෙනෙහි වෙන්නේ නැහැ. භව නිරෝධය නැතහොත් මරණය කියන කාරණා දෙක අතරයි භික්ෂුවගේ සිත දෝලනය වෙන්නේ. මේ ඉහත අර්ථය තමයි, චිත්තය තමයි අරමුණ සාක්ෂාත්කොට දෙන්නේ.

ජීවිතය අතහැරලා භව නිරෝධය කියන අරමුණ පසුපස සප්ත බොජ්ජංග ධර්මයන් වැඩෙද්දී මාරයා බියට පත්වෙනවා. මොකද භික්ෂුව භව නිරෝධය නැතිනම් මරණය කියන කාරණය ස්ථිර අධිෂ්ඨානයක් හැටියටයි සපථ කරගෙන සිටින්නේ. මන්ද තමා තුළින්ම සකස්වෙන පංචඋපාදානස්කන්ධය සමගයි තමා ගනුදෙනු කරන්නේ. ජූරිය, විනිශ්චය තමා තුළමයි තිබෙන්නේ. එම නිසා වංකවෙලා මෙතැනදී මාරධර්මයන් පරාජය කරන්න බැහැ. තමා දන්නවා තමා කරන්නේ බොරුවක් බව. මෙතැන තමයි වර්තමානයේ බොහො දෙනෙක් වරද්ද ගන්නා තැන. එම නිසා අවංකභාවය ඇත්ත වශයෙන්ම තිබිය යුතුයි. මෙය සටහන් කරන භික්ෂුවටත් පින්වත් ඔබටත් භව නිරෝධය සාක්ෂාත් කරගැනීමට නම් නිවීමේ මෙහෙයුමේ අවසාන අදියරේදී 'භව නිරෝධය, නැතිනම් මරණය' කියන අධිෂ්ඨානයට ස්ථිරවම එන්න වෙනවා.

භික්ෂුව මේ මොහොත් නොදන්නවාට භික්ෂුව තුළින් ඉහත වැඩුනේ නිවීම උදෙසා අත්‍යවශ්‍ය සත්තිස්බෝධිපාර්ශ්වික ධර්මයන්ය. නිවීම උදෙසා අරමුණ ශක්තිමත් නම්, අවංකභාවය තිබේනම් රූපයේ අනිත්‍යභාවය ඉහළ සමාධිතලයකදී ඔබ අවබෝධ කර ඇතිනම් මෙම ධර්මතාවයන් හේතුවෙන් ආයාසයකින් තොරවම හේතුඵල ධර්මතාවයන්ට අනුව සත්තිස්බෝධිපාර්ශ්වික ධර්මයන් ඔබ තුළ වැඩෙමින් ඔබව මේ ඝෝර කටුක භයානක සංසාරයෙන් එතෙර කරවනු ඇත.

## භාවනාවට පෙර සයවන කොටස
# දැකිය යුත්තේ සසර බියමය

මේ ධර්ම මාර්ගයේදී ඔබ යම් අවබෝධයක් ලබනවා නම්, ඒ සෑම අවබෝධයක්ම ලබනුයේ ඔබ නොදැනුවත්ව නොවේ. සෑම අවබෝධයක්ම ලැබෙනුයේ ඥාන දර්ශනයන් සමගින්ය. ඥාන දර්ශන යනු උතුම් සමාධි ඵලයකදී දර්ශනයන් දකිමින් ලබන්නාවූ අවබෝධ ඥානයයි. මෙම ඥාන දර්ශනයන් යමෙක් ජීවිතයේ දකින්නේ එක් අවස්ථාවකදී පමණි. එම අවස්ථාවේදී භික්ෂුව එම ඥානය පිළිබඳව අවබෝධය ලබා අවසන්ය. ඉන් අනතුරුව ඕනෑම අවස්ථාවක එම ඥාන දර්ශනය සිහියට නගාගත හැකිය. ඒ ජීවිතයේ කොටසක් බවට පත්වී අවසන්ය. මේ නිවීමේ මෙහෙයුමේදී භික්ෂුවක් තුළ කාම, රූපී, අරූපි භවාත්‍රය පිළිබඳ අනිත්‍ය සංඥාවන් සතර සතිපට්ඨාන ධර්මතාවයන් වශයෙන්මයි වැඩෙන්නේ.

මනුෂ්‍ය ලෝකය, දිව්‍යතල, බ්‍රහ්මතල මනසින් පීර පීරා බලනකොට මුලින්ම රූපයේ අසුභයමයි, මරණානුස්සතියමයි, සත්වයාගේ ජරා, ව්‍යාධි, මරණ ලක්ෂණමයි පෙනෙන්නේ. මිනිස් රූප, ස්ත්‍රී පුරුෂ රූප, විවෘත කොට මනසින් බලමිනුයි නුවණින් මෙනෙහි කරන්නේ. ඕනෑම මිනිස් රූපයක් පමණක් නොව, දිව්‍ය, බ්‍රහ්ම රූපයක් පවා අට්ඨික සංඥාවෙන් දකින්න. අට්ඨික සංඥාව විනිවිදගොස් දුහුවිල්ලක්, ගින්දරක්, සුළඟක් ලෙස රූපයේ අනිත්‍යභාවය දකින්න එම භික්ෂුව තුළ විදර්ශනා ඥානය වැඩිලයි තියෙන්නේ.

අරමුණු වන සෑම රූපයක්ම විදර්ශනා ඥාණයෙන් විනිවිද දකිමින්, එම රූපයට ඇති ඡන්ද රාගයෙන් මිදෙමින් ඉදිරියට යෑම පමණයි භික්ෂුවට තිබෙන්නේ. රූපවාහිනී දර්ශන පථයක රූප එකක් පසුපස, එකක් එන්නේ යම්සේද, නොකඩවා රූපත්, එම රූප විදර්ශන ඥානයෙන් විනිවිද දකිමින් ලබන්නා වූ අවබෝධාත්මක ඥානයත් සමගින් ඉදිරියට ගමන් කරනවා. මේ ක්‍රියාන්විතය පුරාවට සිදුවන්නේ පංච උපාදනස්කන්ධය නැමැති මාරයාට කාය, චිත්ත, ධම්ම, වේදනා කියන සතර ධර්මයන් උපයෝගී කොටගෙන, තෘෂ්ණාවේ සළුවෙන් වසාගෙන සිටින, අනිත්‍යයේ යථාර්ථය විනිවිද දකිමින්, රූපයට ඇති තෘෂ්ණාවෙන් මිදීමය. රූපය ඇසුරින් සකස්වෙන පංච උපාදානස්කන්ධයට ඇති ඡන්දරාගයෙන් මිදීමය.

සතර සතිපට්ඨාන ධර්මතාවයන් උපයෝගී කරගෙන රූපයේ අනිත්‍යභාවය විදර්ශනාවට ලක්කිරීමේදී සිදුවන ආශ්චර්යමත් සිදුවීම නම්, පින්වත් ඔබගේ අවංකවූ භව නිරෝධයේ අරමුණු සාක්ෂාත් කරදීම සඳහා සප්තබොජ්ජංග ධර්මයන් බලමුළු හතක් ලෙසින් එකම දිශාවට අනුපිළිවෙලට ආධාරයට පැමිණෙන්නා සේ, තමා තුළින්ම හේතුඵල ධර්මයන් අනුව මෝදුවීමය. මේ ධර්මතාවයන් මොනවාද යන්න ඒ මොහොතේ සිතීමට, දැකීමට යෑම ඔබට අයත් කාර්යයක් නොවේ. මොකද සිතන්නට එහි නිත්‍ය වූ දෙයක් නොමැති නිසාය. සප්තබොජ්ජංගයන්ට ඇලුනොත් එයද ආශ්වාදයක්මය. වැඩෙන සප්තබොජ්ජංගයන්ගේද අනිත්‍ය භාවය දකිමින්, තමාගේ පිහිටට පැමිණි සහය බලමුළුද විදර්ශනා ඥානයෙන්ම නිරුවත්කොට දැකිය යුතුය. එසේ නොවුනහොත් සප්ත බොජ්ජංග ධර්මයනුත් මාරයා වනවා එකාන්තය. මන්ද පින්වත් ඔබ මේ අවබෝධ කිරීමට යන්නේ ධර්මයයි. ධර්මයේ ස්වභාවයන් දෙකක් නොමැත. ධර්මයේ කාලීන හෝ අතීත කියා දෙයක් නැත. ධර්මයේ ගැඹුරු හෝ නොගැඹුරු කියා දෙකක් නැත. ධර්මය යනු එකම අර්ථයකි. එම අර්ථය නම් අනිත්‍යයයි. එසේනම් සප්තබොජ්ජංග ධර්මයද අනිත්‍ය විය යුතුමය. මන්ද

මේවාද ධර්මයන් නිසාය. පින්වත් ඔබ ඉහත ධර්මථාවයන් අවබෝධ කරගතහොත් එම ධර්මතාවයන් ආයාසයකින් තොරවම ඔබට අත්විඳීමට පුළුවන. එයද ධර්මතාවයක්මය. මේ සියළු ධර්මතාවයන්ගේ වඩාත් ආශ්චර්යමත් සිදුවීම වන්නේ, පංච උපාදානස්කන්ධයේ අනිත්‍යභාවය අවබෝධ කරගැනීමට උපකාරීවූ සතර සතිපට්ඨාන ධර්මයනුත්, එම ධර්මතාවය හේතුවෙන් වැඩුණු සප්ත බොජ්ජංග ධර්මයනුත් අනිත්‍ය වශයෙන් අවබෝධ වෙද්දී ඔහු චතුරාර්ය සත්‍ය අවබෝධය ලැබීමය.

සතර සතිපට්ඨාන ධර්මයන්ද, සප්තබොජ්ජංග ධර්මයන්ද, භික්ෂුව තුළ වැඩෙන්නේ පංච උපාදානස්කන්ධය ලෙසින්මය. භික්ෂුව නැවත ආපසු හැරී බලන විට ඉහත ධර්මයන් සියල්ලම පංච උපාදානස්කන්ධයේම අර්ථය බව මැනවින් ප්‍රකට වෙයි. පංචඋපාදානස්කන්ධය යනු ලෝකය බවත්, පංච උපාදානස්කන්ධයෙන් තොර ලෝකයක් නොමැති බවත් පැහැදිළිය.

ඉහතින් සඳහන් කළ අත්දැකීම කාගේ වුවද එය ඔබගේද, මගේද නිවීමේ මගට ශක්තියක් වනු ඒකාන්තය. ඉකුත් ලිපිවලදී භික්ෂුව කියන්නට උත්සහ කළේ සතර අපායේ බිය හොඳින් දැන භවය කෙරෙහි බියක් සකස්කොට ගන්නා ලෙසය. සසර බිය නොදකින්නා කවදාකවත් සසරින් නොගැලවෙන්නෙකි. සතර අපායට බිය පින්වතාමයි ශීලය තුළ ශක්තිමත් වෙන්නේ. ශීලය තුළ ශක්තිමත් වූ පින්වතා තුළයි සමාධිය සකස්වෙන්නේ. සමාධිමත් පින්වතා තුළයි ප්‍රඥාව සකස්වෙන්නේ.

## භාවනාවට පෙර සත්වන කොටස
## භාවනාවට පෙර මේ ගැනත් සිතන්න
# සතර අපා දුක් නොවින්ද
# කව්රුනම් ලොවේ සිටිත් ද?

වර්තමානයේ ඔබට ඇසෙන දකින දේවල් තුළ සංසාරයේ බිය වසා දමලයි තිබෙන්නේ. ඕනෑම මනුෂ්‍යයෙක් මියගියහම නැවතත් උපදින්නේ දිව්‍යලෝකයේමයි, මනුෂ්‍යයන් අතරමයි කියන දෘෂ්ටිය සමාජයේ මුල් බැසගෙන තිබෙන්නේ. එසේත් නැතිනම් සුදු ඇඳුමක් ඇඳගෙන තම මියගිය ඥාතියාව සිහිනෙන් දැක්කාය කියන දවල් හෝ රාත්‍රී සිහිනයකට මේ උතුම් හේතුඵල ධර්මයේ අර්ථය හීනකොට තිබෙනවා.

අවමංගල්‍ය නිවස ඉදිරිපිට එල්ලා ඇති 'නිවන් සැප ලැබේවා' කියලා සඳහන් බැනර දකිනකොට, නිවන් අවබෝධය කියන කාරණය සමාජය විසින් මොනතරම් සුළුකොට, ළඝුකොට දකිනවාද යන්න පැහැදිළියි. සමාජයේ බහුතරයක් පින්වතුන් තම ඥාතිවරයෙක් මියගිහයම, පාංශකූල පින්කමෙන්, එසේත් නැතිනම් හත් දවසේ පින්කමෙන් තම මියගිය ඥාතියාට ආශ්චර්යමත් උපතක් ලබාදීමට උත්සහ කරනවා. මේ කටයුත්ත වැඩිපුරම සිද්ධවෙන්නේ මළගෙදර ගුණකථනය කරන මහත්වරුන් අතින්. පින්වත් ඔබ, ඔබගේ මියගිය ඥාතිවරයෙක් සුදු ඇඳුමක් ඇඳගෙන ඔබ ඉදිරියේ සිහිනයෙන් පෙනී සිටියහොත් මොන තරම් ආශ්වාදයකින්ද ඒ පිළිබඳව කථා කරන්නේ. එක පැත්තකින් එය ඇත්තෙන්ම සිහිනයක්. අනෙක් පැත්තෙන්, සුදු

ඇඳුමක් ඇඳගෙන සිටියත්, ඉහත ස්වභාවය පරදත්ත රූප ජීවී ප්‍රේතයෙක් හෝ ප්‍රේතියක්. ඒ කියන්නේ සතර අපායෙන් මිදී නොමැති සත්ත්වයෙක්. මොකක් ගැන සතුටුවෙන්නද? පරදත්ත රූප ජීවී ප්‍රේතයෙක්, ප්‍රේතියක් ගැන අප සතුටු වෙනවා නම්, එසේ සතුටුවන කෙනාට ප්‍රේත සංඥාවෙන් ඔබ්බට යන්නට අපහසු වෙනවා. ඒ නිසා පින්වත් ඔබ භාවනාවට පෙර, සතර අපාය කියන කාරණය හොඳින් වෙන්කොට හඳුනාගන්න. එසේ හඳුනාගත් කෙනායි, ඒ මායිමෙන් මිදෙන මාර්ගයට එන්නේ. ඉහත සටහන සම්පූර්ණයෙන් වෙන්කළේ සතර අපාය ගැනත්, කාම, රූපී, අරූපී භවාත්‍රය ගැනත් දැනීමක් සකස්කර ගැනීම භාවනා කරන කෙනෙක්ට අවශ්‍යම කරුණක් බව පැහැදිළි කරදෙන්නයි. ඉහත කාරණා දෙක විනිවිද දකින යෝගාවචරයායි, මින් මිදෙන දිශාවට ගමන් කරන්නේ.

දෙවැනි කාරණය නම් භාවනා කිරීමට පෙර සක්කාය දිට්ඨිය ගැන හොඳින් දැනගැනීමයි. මේ කාරණයේ අර්ථය නොදැන භාවනා කිරීමේ තේරුමක් නැහැ. මෙහි කෙටිම අර්ථය, මමත්වයේ දැඩි ස්වභාවය යන්නයි. සංසාරයක් පුරාවට කැටිකොට ගලාගෙන පැමිණි, තණ්හා මාන්න දිට්ඨීන්ගේ රුව ගුණයයි.

එක පින්වතියකට භික්ෂුව සඳහන් කළා, ඔබත් මමත් අනෙකුත් පින්වතුනුත් සංසාරයේ සග්‍රික දිව්‍යතල, රූපී, අරූපී බ්‍රහ්මතලවල කල්ප ගණන් සැප විඳ ඇති බව. ඇය ගත් කටටම ප්‍රකාශ කළේ, ඇත්තටම හාමුදුරුවනේ මම එහෙම ඉඳලා තිබෙනවාද? කියලා. භික්ෂුව ප්‍රකාශ කළේ, බුදුරජාණන් වහන්සේගේ ධර්මයට අනුව, එය එසේමයි කියලා. ඒ අවස්ථාවේ ඇය දැඩිලෙස සතුට ප්‍රකාශ කළා. නැවත භික්ෂුව ප්‍රකාශ කළා, ඔබත් මමත් කල්ප ගණන් සතර අපායේ, තිරිසන්, ප්‍රේත නිරයේ මෙන්ම අසුරයන් වශයෙන්ද ඉපිද ඇති බව. ඒ මොහොතේ ඇය දැඩි නොරිස්සුම් ස්වභාවයෙන් ප්‍රකාශ කළේ, තමා සතර අපායේ කිසිවිටකත් නොසිටි බවයි. බලන්න මුල් කාරණයේදී ඇය සතුටු වුණා. දෙවැනි කාරණයේදී

ඇය දැඩි විරෝධයක් දැක්වුවා. මේ අවස්ථා දෙකේදීම, ඇය තුළ ඇති සක්කාය දිට්ඨියේ ලක්ෂණයි ප්‍රකාශ වුනේ.

සමහර පින්වතුන් සිටිනවා, අපි සතර අපාය ගැන කථා කරනවාටත් අකමැතියි. ඒ අකමැත්ත තුළ තිබෙන්නේ සක්කායදිට්ඨියමයි. මේ සටහන් කරන භික්ෂුව වැඩියෙන්ම කැමති, සතර අපාය ගැන කථා කරන්නයි. මොකද සතර අපාය කෙරෙහි ඇතිවූ බියමයි, මේ සටහන ලියන්න අවශ්‍ය අවබෝධය භික්ෂුවට ලබාදුන්නේ. භික්ෂුව අභිමානයෙන් කියනවා, අතීත බවයන්හිදී මා සතර අපායන් හී සෑම බිම් අඟලක්ම ස්පර්ශකළ අයෙක්මය කියලා. පින්වත් ඔබ ධර්මය නොදන කෙසේ නම් ධර්මය අවබෝධ කරගන්නද?

පින්වත් ඔබ නිහතමානී වෙන්න. යම් පින්වතෙකුට සිතෙනවා නම්, තමා සතර අපායේ ඉපදී නැතැයි කියලා, ඔහු මෝහයේ ආගාධය තුළ සිටින කෙනෙක් බව සිහිකරන්න. එම සිතිවිල්ලෙන් ඔබ මිදුනොත්, එය මේ ජීවිතයේදී ඔබ සිතූ උතුම්ම සිතිවිල්ල වෙනවා. කරුණු හරියාකාරව නොදන භාවනා කිරීම, සක්කාය දිට්ඨිය වැඩීමට හොඳ තෝතැන්නක් වෙනවා. මේ කාරණය ගැන පරෙස්සම් නොවුනහොත්, භවනාවේ නාමයෙන් අපි වඩවාගෙන ඇත්තේ මමත්වයේ දැඩිභාවයම හෙවත් සක්කාය දිට්ඨියමයි.

භාවනාව තුළින් සිදුවන්නේ යමක් අල්ලාගැනීම නොව, අල්ලාගෙන ඇති දෙය අතහැරීමය. අල්ලාගත් දේවල් අතහැරෙන්න, අතහැරෙන්න ඔබ තුළ සකස්වෙන්න ඕනා නිහතමානීබවමයි. මමත්වය අඩුවෙන්න ඕනේ. මේ ගැන හොඳ අවබෝධයක් භාවනාවට පෙර ඔබට තිබෙන්නට ඕනේ. පින්වත් ඔබ මමත්වයේ දැඩිභාවයෙන් ගන්නේ රූපයයි. වේදනාවයි. සංඥාවයි. චේතනාවයි. විඥානයයි. එම නිසා භාවනා කරන පින්වතා නිරතුරවම ස්වයං පරීක්ෂණයක් කරන්න ඕනේ, ඉහත ධර්මතාවයන් කෙරෙහි ඔබේ තෘෂ්ණාව අඩුවෙනවාද කියලා.

මීළඟට භාවනා කිරීමට පෙර පටිච්ජසමුප්පාද ධර්මය ගැන හොඳින් දැනුවත් විය යුතු වෙනවා. ලොව්තුරු සම්මා සම්බුදු

ඥානයෙන් අවබෝධකොට සත්ත්වයාගේ බව දුක නිවීම සඳහා අර්ථවත්ව, ක්‍රමානුකූලව දේශනාකර ඇති පටිච්ඡසමුප්පාද ධර්මය, අවිද්‍යාවේ පටන් හේතුඵල ධර්මයන්ට අනුව ජාති, ජරා, ව්‍යාධි, මරණ දක්වා සත්වයාගේ භව ගමන හොඳින් පැහැදිළිකොට තිබෙනවා.

මෙතැනදී අවිද්‍යාව සකස්වීමට හේතුව මුළින්ම ඔබ දැනගත යුතුයි. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා, අවිද්‍යාව සකස් වෙන්නේ පංචනීවරණ ධර්මයන් නිසාය කියලා. පංච නීවරණයන් ඇතිවෙන්න හේතුව කාය, වාග්, මනෝ අකුසලයන්ය කියලා. මේ සියල්ලටම හේතුව අයෝනිසෝ මනසිකාරය කියලයි බුදුරජාණන් වහන්සේ දේශනා කරන්නේ. මේවා නැතිකරගැනීමට නම්, කළ්‍යාණ මිත්‍ර ආශ්‍රය, සද්ධර්ම ශ්‍රවණය අවශ්‍ය වෙනවා. අවිද්‍යාවේ පටන්, හේතුඵල ධර්මයන්ට අනුව සකස්වෙන සෑම ධර්මතාවයක්ම, එක හා සමාන වටිනාකමින් දකින්න වෙනවා. මොකද එක ධර්මතාවයක් හේතුවෙනුයි අනෙක සකස් වෙන්නේ. එම නිසා අපට අවශ්‍ය අවශ්‍ය ආකාරයට එක ධර්මතාවයක් හෝ දෙකක් වෙන්ව අරගෙන ප්‍රතිඵල දකින්න යන්න එපා. බුදුරජාණන් වහන්සේ දේශනාකෙට වදාළ පරිදි මුල මැද අග වශයෙන් අර්ථවත්ව දැකීමට ඔබ උත්සාහ ගතයුතුයි. අවිද්‍යාව අමතක කොට වෙන කිසිම ධර්මතාවයක නිරෝධයක් ගැන සිතීම පවා අර්ථ විරහිත ක්‍රියාවක් වෙනවා. පටිච්ඡසමුප්පාදය නොදැන කරන භාවනාව කවදාවත් ඔබට නිවීමේ ඉලක්කය සඳහා යොමුකර ගැනීමට අපහසු වෙනවා. භාවනාව තුළින් අපි සැවොම අරමුණු කරන්නේ චතුරාර්ය සත්‍යය අවබෝධය, ඒ කියන්නේ අවිද්‍යාවේ නිරෝධයයි. එහෙම නම් දුක කුමක්ද? දුකට හේතුව කුමක්ද? කියන කාරණය තමයි පටිච්ඡසමුප්පාද ධර්මයේ අන්තර්ගතය.

මෙතැනදී විශේෂයෙන්ම එක කාරණයක් ගැන සඳහන් කරනවා. ඒ තමයි උපාදානය කියන කාරණය. උපාදානයයි භවය සකස්කරදෙන්නේ. මේ කාරණය භාවනා කරන, නොකරන කාට

වුවද හුඟාක් වටිනවා. මොකද භාවනාව කළත්, පින්කම් සිදුකළත් අපි තුළ බොහෝ වෙලාවට වැඩෙන්නේ තණ්හා, මාන්න, දිට්ඨී කියන කාරණාමයි. මේ කාරණා නිවැරදි කරගන්න පටිච්ඡසමුප්පාද සමුදය, නිරෝධය ක්‍රියාවලිය ජීවිතයේ කොටසක් බවට පත්කර ගන්න. ඔබ බුදුරජාණන් වහන්සේ වන්දනා කරන අවස්ථාවලදී භාවනාවට පෙරාතුව දිනපතා පටිච්ඡසමුප්පාද ධර්මයේ අර්ථය දකිමින් සජ්ජායනා කරන්න. මෙනෙහි කරන්න. භාවනා කරන පින්වතෙකුට සුවඳ දුම්, සුවඳ මල් පූජා කරනවාට වඩා එය ගොඩක් උපකාරී වේවී. මොකද ඔබ යමක් පූජා කිරීමට පෙරාතුව, එම පූජාව අර්ථවත් වෙන්න නම්, ඔබ ඒවා පූජා කරන්නේ කුමන ගුණයන්ටද, ඥාණයන්ටද කියන අවබෝධය ඔබතුළ තිබිය යුතු වෙනවා. එම අවබෝධය මත සිටිමින් බුදුරජාණන් වහන්සේ වන්දනා කිරීම තමයි වඩාත් අර්ථවත් වෙන්නේ. එසේ කිරීමට පින්වත් ඔබට අපහසු නම්, සුපුරුදු පරිදි වන්දනා කටයුතු සිදුකරගන්න. කවදාවත් ඒවා අපතේ යන්නේ නැහැ.

## භාවනාවට පෙර අටවන කොටස
# මෛත්‍රී භාවනාව කියන්නේද අතහැරීමකි

භාවනා කරන බොහෝ දෙනෙක් උපාදානය කියන කාරණයේ බරපතළ බව නොසිතන බව පෙනෙනවා. උපාදානයේ තිබෙන අනතුර තේරුම් ගැනීමට පින්වත් ඔබ සියුම්ව ඔබේ ජීවිතය දෙස බැලිය යුතුවෙනවා.

ඔබ පසළොස්වක පොහොය දවස ගැන සිතන්නකෝ. ලක්ෂ කීයක් පින්වතුන් එදාට සිල් සමාදන් වෙනවාද? විහාරස්ථානවල. නමුත් මේ පිරිසෙන් කීයෙන් කීදෙනාටද පුළුවන් පසුදා උදෑසන දක්වා සිල් පවාරණය නොකොට විහාරස්ථානයේම ගත කරනවා කියල නවතින්න. සවස හතර වෙනවිට ගෙදර පිළිබඳ උපාදානය සකස් වෙනවා. පින්වත් ඔබට පුළුවන්ද එක දවසක් ගෙදර අතහැරලා පිට ප්‍රදේශයකට ගොස් ඉන්න. ඔබට පුළුවන්ද සතියක් ඔබේ ඥාතීන්ගෙන්, ගෙදරින්, ව්‍යාපාරයෙන් මිදිලා වන්දනා ගමනක් යන්න. භාවනා වැඩ සටහනකට යන්න. උත්තරය 'බැහැ'නම් ඔබ සිතන්න ක්ෂණිකව ඔබ මියගියහොත් කෙසේ නම් ඉහත උපාදානයන් අතහැර ගන්නද? කියලා. ඔතැනට තමයි, භවය සකස් කරන උපාදානය කියන්නේ.

වර්තමානයේ වයෝවෘද්ධ අම්මලා තාත්තලා හුග දෙනෙකුට බැහැ නිවසින් බැහැරව දින දෙක තුනක් ගතකරන්න. ගෙදර මතක් වෙනවා. දරුමුණුපුරන් මතක් වෙනවා. 'මගේ තැන' මතක් වෙනවා. එම නිසා භාවනා කිරීමට පෙර උපාදානයේ හැඩරුව හොඳින් හඳුනාගන්න. හැකිතාක් පින්කම් උදෙසා තමන්

අර්ථවත් ලෙස දකින බුදුරජාණන් වහන්සේගේ ධර්මයේ අර්ථයම කියන ගුරුවරුන් වෙතට යන්න. එම ස්ථාන සොයා යන්න. දරුමුණුපුරන් විසින් හැකිතාක් තම දෙමාපියන්, අම්මලා, සීයලා නිවසින් බාහිර පින්කම් සඳහා යොමුකරවන්න. ගෙදර අතහැර සතියක් දෙකක් ගත කිරීමට පුරුදු කරන්න. නමුත් පින්වත් ඔබට ඉහත කාරණා කෙරෙහි බලවත් තෘෂ්ණාවක් නැතිනම් විවේකීව නිවසේම තම භාවනා කටයුතු සිදුකරගන්න. එය වඩාත් ඔබට පහසුවේවි.

සෑම විටම ඔබගේ උපාදානය, ආර්ය අෂ්ටාංගික මාර්ගයේ 'සම්මා වායාමෝ' අර්ථය දිශාවට යොමු කරගන්න දක්ෂ වෙන්න. පටිච්ඡසමුප්පාද ධර්මයේ උපාදානය ගැන මෙහි විශේෂයෙන් සඳහන් කළද අනෙකුත් සියළුම ධර්මතාවයන් එක හා සමාන වැදගත් බව සලකන්න. දුක ඇතිවීමට හේතුවත් දුක නිරුද්ධ වීමට හේතුවත් හේතුඵල ධර්මයන්ට අනුව දකින්න උත්සාහ ගන්න. මෙහෙම දකිනවිට 'අතීතයේ මම සිටියාය. අනාගතයේ මම සිටින්නේය, වර්තමානයේ මම සිටිමි' යන ආත්මීය කාරණය ඔබෙන් බැහැර වේවි. මෙතනදී තමයි සක්කාය දිට්ඨිය ඔබෙන් ගැලවිලා යන්නේ. සක්කාය දිට්ඨිය ඔබ තුළින් පෝෂණය වෙන්නේ නිත්‍යවූ ස්ථිරවූ පාලනය කළ හැකි පුද්ගලයෙක් ආත්මයක් ඉන්නවාය කියන කාරණය නිසා. මේ මුසාවාදයෙන් ඔබ මිදෙන්න ඕනේ. සතර අපායෙන් නොමිදුන පින්වතා තවම ශීලයෙන් පරිපූර්ණ නැතිය කියන්නේ ඉහත කාරණය නිසා. භාවනා කිරීමට පෙර ඇත්ත දැනගන්න. වැරැදි නිවරැදි කරගන්න.

අවිද්‍යාපච්චයා සංඛාරා, සංඛාරනිසයි විඤ්ඤාණය සකස් වෙන්නේ, විඤ්ඤාණය හේතුවෙනුයි නාමරූම සකස් වෙන්නේ. නාමරූප හේතුවෙනුයි සළායතන සකස් වෙන්නේ. මමය කියල ඔබ ගොඩ නගාගත් පුද්ගල සංඥාව පියවරෙන් පියවර ඔතනයි තිබෙන්නේ. එම නිසා වෙඩි තැබීමට පෙර නිවරැදි ඉලක්කය සාදාගන්න. එසේ නොවුන හොත් විරුද්ධවාදීන් වැඩිවීම පමණයි සිදුවන්නේ. එම නිසා දුක ඇතිවීමට හේතුවන ක්‍රියාවලියන්

දුකේ නිරෝධයට හේතුවෙන ක්‍රියාවලියන් ගැන නිරතුරුවම භාවනාවක් වශයෙන් මෙනෙහි කරන්න.

මීළඟ කාරණය පින්වත් ඔබ භාවනා කිරීමට පෙර යහපත් මනුෂ්‍යයෙක් විය යුතුයි. මේ සටහන ලියන්නේ ගිහි පින්වතුන් සඳහාය. දෙමාපියන්ට, ඥාතීන්ට ගරුකරන මනුෂ්‍යයෙක් විය යුතුයි. සංඝයා වහන්සේලාට ගරුකරන මනුෂ්‍යයෙක් විය යුතුයි. සමාජයේ යුතුකම් දන්නා, යුතුකම් ඉටුකරන මනුෂ්‍යයෙක් වන්න. මන්ද යුතුකම් යනු ඔබ ලබාගත් අයිතිවාසිකම්වලට කරන ගෙවීමයි. පින්වත් ඔබ ලෝකය අතහැරීම පිණිස භාවනා කිරීමට පෙර පහත කාරණා ඔබගේ ජීවිතය තුළින් කළ හැකිදැයි විමසා බලන්න.

ඔබ සිතන්න ඔබ කොළඹින් බස්රථයක නැගලා කතරගම යනවා කියලා සෙනග පිරුණු බස්රථය මොරටුවේ බස් නැවතුමේ නවත්තපුවාම කුඩා දරුවෙක් වඩාගත් අම්මා කෙනෙක් එසේත් නැතිනම් ඉතා වයෝවෘද්ධ ආච්චි කෙනෙක් බසයට නගිනවා. දෙපාරක් නොසිතා ඔබගේ ගමනාන්තයට තව ඇති දුරගැන නොසිතා ඔබට කැමත්ත සකස් වෙනවාද සෙනග පිරී ඇති බසයේ ඔබගේ ආසනය ඇයට හෝ ඔහුට පරිත්‍යාග කරන්න. ඔබට මෙය කරන්න බැරිනම්, ඔබට එවැනි පරාර්ථකාමී සිතක් තවම සකස් කරගන්න බැරිනම්, ඔබ කෙසේ නම් ලෝකය අතහරින්නද? පාරේ දුවයන බසයක ප්‍රවේශ පත්‍රයක් මිලදී ගැනීම නිසා පැය කීපයකට ලැබුණු ආසනය අතහැරීමට නොහැකි නම් භාවනා කිරීමට පෙර මෙවැනි පුංචි අතහැරීමක් ජීවිතය තුළින් ක්‍රියාත්මක කරන්න පුරුදු වන්න. තමා ලබන සැප පහසුව තාවකාලිකව හෝ අනුන් උදෙසා පරිත්‍යාග කිරීමට අකමැති නම් කෙසේ මේ නාමරූම ධර්මයන් අතහැරීමට යොමුවන්නද? අවම වශයෙන් මෛත්‍රී භාවනාව අර්ථවත් කරගැනීමට යොමුවන්නද?

මෛත්‍රී භාවනාව කියන්නේ අතහැරීමක්. කුමක්ද අතහැරෙන්නේ ක්‍රෝධය, ද්වේශය, ව්‍යාපාදය. මේවා අත්හැරෙද්දී ඔබ තුළ

අන්‍ය මිනිසුන් කෙරෙහි කරුණාවක් සකස්විය යුතුයි. එහෙම සකස්වුනොත් බස්රථයේ ආසනය පරිත්‍යග කිරීම බෝහෝම සුළුදෙයක්. එහෙම නොවෙනවා නම් මෛත්‍රියේ නාමයෙන් ඔබ තුළ වැඩී ඇත්තේ සක්කාය දිට්ඨියයි.

## භාවනාවට පෙර නවවන කොටස
# කමටහන මගහැර කවරනම් භාවනාවක්ද?

ඔබ දවසේ පැය විසිහතරෙන් පැය විසි දෙකක්ම නිත්‍ය සංඥාවන් වඩල නිත්‍ය සංඥාවන් සමග ජීවත්වෙලා පැය දෙකක් පමණක් අනිත්‍ය සංඥාවට යොමු වෙලා භාවනාවක් කරලා කෙසේ නම් මේ කාරණා දෙක සමබර කරගන්නද?

තරාදියෙ එක පැත්තකට පැය විසිදෙකක් අනෙක් පැත්තට පැය දෙකක් දැම්මොත් ඔබට තේරෙවි එහි පරතරය.

එම නිසා විශේෂයෙන්ම විදර්ශනා භාවනා කිරීමට කැමති පිංවතුන්ලා දවසේ සෑම කාර්යක්ම කමටහනක් කරගැනීමට දක්ෂවිය යුතුයි. වැසිකිළි කැසිකිළි කිරීමේදී ඔබට පුළුවන් ආහාරයේ අනිත්‍ය බව දකින්න. ඔබ සුවඳවත් කරන පිරිසිදු කරන ශරීරයේ අනිත්‍ය බව දකින්න. ඔබ නින්දට යන වෙලාවට ඔබට පුළුවන් ගෙවුන දිනය පුරාවට ඔබ සිදුකළ ක්‍රියාවන්ගේ අනිත්‍ය ස්වභාවය දකින්න. කුමන ඉරියව්වකින් සිටියත් ඔබ ඇස අරමුණු කරගෙන 'ඇස අනිත්‍යයි, අනිත්‍යයි....' වශයෙන් දකිමින් සිටින්න. එවිට ඔබට පුළුවන් බාහිර රූපයන්ගෙන් ඇස හුදකලාකර ගන්න. එහෙම දිගින් දිගටම දකින්න. එවිට ඔබට වැටහෙනවා ඇසත් බාහිර රූපත් ඔබට අයිති නැති ස්වභාවය. කන, නාසය, දිව, මනස, කය යන අනෙක් ආයතන ගැනත් එසේ දකින්න. මෙය කිරීම සඳහා ඔබ එරමිනියා ගොතාගෙන සිටින්නම අවශ්‍ය නැහැ.

බස් රථය තුළ වාඩිවෙලා යන විට ඔබේ ඇස බාහිර රූප කෙරෙහි දුවනවා නම්, මනසේ වේගවත්ව සිතුවිලි ඇතිවෙනවා නම් ඔබට ඉහත අරමුණු දකින්න පුළුවන්. භාවනා කිරීමෙන් අර්ථයක් ලැබීමට නම් ඔබ ජීවිතයේ ලැබෙන සෑම අවස්ථාවකදීම සෑම අත්දැකීමකදීම ඒවා කමටහනක් කර ගැනීමට දක්ෂ විය යුතුයි.

පින්වත් ඔබට උදාහරණයක් පැහැදිලි කරන්නම්. භික්ෂුව ගිහි කාලයේ ප්‍රධාන නගරයක පයින් ගමන් කළා. මහපාර අයිනේ වයෝවෘද්ධ යාචක කාන්තාවක් හිටියා. ඇය අසල අතින් තල්ලු කරන කරත්තයක් තිබුනා. ඒ අසලම බල්ලෙක් සිටියා. මේ වයෝවෘද්ධ කෘශ කාන්තාව දෙකට නැවිලා බුදු අම්මෝ කියමින් විලාප නගමින් තම ගුද මාර්ගයෙන් එළියට ඇවිත් තිබෙන අගල් හයක් පමණ දිගැති ආනමාළු ගෙඩියක ප්‍රමාණයේ මස් දගරයක් ශරීරය ඇතුළට ඔබනවා. මෙය අර්ශස් රෝගයේ දරුණුම අවස්ථාවක්. ප්‍රසිද්ධියේ පාර අයිනේ මේ සිද්ධිය සිද්ධ වුනේ. ඒ වයෝවෘද්ධ යාචක අම්මාට තේරුමක් නැහැ අවට පරිසරය ගැන, මිනිස්සු ඉන්නවාය දකිනවාය කියන කාරණය. ඇයගේ වේදනාව විසින් ඇයට ඉහත කාරණය ඇයට අමතක කරලා. මිනිසුන් සිය ගණනින් ඒ අසල පාර දෙපැත්තේ ගමන් කළත් එකම මනුෂ්‍යයෙක්වත් ඒ සිද්ධිය දෙස බලන්නේ නැහැ. මොකද එය ඒ තරමටම අපුල බියගන්වන දර්ශනයක්. නමුත් ගිහියෙක් වශයෙන් එදා මේ භික්ෂුව ඒ කාන්තාවගේ සෑම ඉරියව්වක් දෙසම හොඳින් බලාගෙන ගියා පමණක් නොව ආපසු හැරී නැවත ඒ දර්ශනය දෙස නුවණින් බැලුවා. ඒ වෙලාවේ ගිහියෙක් වශයෙන් මම ඒ දර්ශනය තුළ කාය, චිත්ත, ධම්ම, වේදනා කියන ධර්මතාවයන් දැක්කා. අසුභය මරණානුස්සතිය දැක්කා. සංස්කාර ධර්මයන්ගේ අමිහිරි උමතු ප්‍රතිපල දැක්කා.

මෙවැනි දර්ශනයක් සිදුවීමක් දකින්න අපුල නම් අමිහිරි නම් ඔහු කෙසේ නම් භාවනාවෙන් ප්‍රතිපල ලබන්නද? මේ ඔබ දකින්නේ ඔබේ ශරීරයේ ස්වභාවයයි. අතීතයේ ඔබද අත් විඳි ස්වභාවයයි. අනාගතයේදී රූපයට උරුම අවස්ථාවයි. අනුන්ගේ දුක ඔබ

ඔබේ ජීවිතයට ගලපා බලන්න දක්ෂවෙන්න. එම දුගී යාචක මව තුළින් ඔබ ඔබව දකින්න දක්ෂ වෙන්න. ඇසට පෙනෙන, කනට ඇසෙන, මනසට දැනෙන ධර්මය මගහැරයාමෙන් වළකින්න.

පින්වත් ඔබ මේ ආකාරයට දිනය පුරාවට දකින සිදුවන සියළු ක්‍රියාකාරකම් කමටහනක් හැටියට හැකිතාක් දකින්න උත්සාහ ගන්න. එහෙම කළොත් ඔබට පුළුවන් වෙනවා පෙර සඳහන් කළ නිත්‍ය, අනිත්‍ය සංඥා කිරා බැලූ තරාදිය යම් ප්‍රමාණයකට සමබර කරගන්න. මෙහෙම පුහුණුවත් ලැබුවොත් ඔබ විවේකීව භාවනාවට යොමුවුනාට පස්සේ පංචනීවරණවලින් ඔබේ මාර්ගය අවහිරවීම හුඟක් දුරට අඩුකරගැනීමට හැකියාව තිබෙනවා. මොකද රූපයක් අභියස එය අනිත්‍යයි කියන කාරණය දකින්න දැන් ඔබ පුහුණුවක් ලබා ඇති නිසා. එය අවබෝධයක් නොවේ මාර්ගය වැඩීමට ලැබෙන පිටුවහලක් වේවී.

මීළඟට භාවනා කිරීමට පෙර ඔබ විසින් අවධාරණය කළ යුතු විශේෂ දෙයක් තමා දසකුසල් කියන කාරණයේ අර්ථය. විශේෂයෙන්ම සුදුවත් දරාගත් පින්වතුන්ලා මේ කාරණයේදී දුර්වලතාවයන් දකිනවා. එම පින්වතුන්ලා අවංකවම තම ශීලය ගැන විශ්වාසයකින් පසුවෙන්නේ. එම විශ්වාසය තුළ පංච ශීලය එසේත් නැතිනම් ආජීවට්ඨමක ශීලය සමාදන් වෙනවා. ඔබ සමාදන් කළ ඉහත ශීලයන් දෙක තුළම දසකුසල්වලට අදාළ වන කාරණ හතක්ම ආවරණයවෙලා තිබෙනවා. කයෙන් සිදුවන්නාවූ අකුසල් තුනක් වචනයෙන් සිදුවන්නාවූ අකුසල් හතරක් ඔබෙන් වැළකෙනවා. නමුත් පිංවතුනි වඩාත්ම ප්‍රබල මනසින් සිදුවෙන්නාවූ අකුසල් තුන ලෝභ, ද්වේශ, මෝහ කියන කාරණා තුන නිරතුරුවම අපිට මඟ හැරෙනවා. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා මනෝ කර්මයන්මයි බලවත් කියලා. පින්වත් ඔබ සතුන් මරන්නෙ නැති වෙන්න පුළුවන්, බොරු නොකියන්න පුළුවන්, ඇතිවන පුංචි ප්‍රශ්නයක් හමුවේ ක්ෂණිකව ලෝභ, ද්වේශ, මෝහ අකුසල චෛතසිකයන් සකස්කර ගන්නවා. මේ කාරණය භාවනාවට බොහෝම අනතුරුදායක තත්ත්වයක්.

ලෝභ, ද්වේශ, මෝහ නමින් පෙනී සිටින්නේ, මේ කාරණ තුනම සකස් වෙන්නේ රූපයට ඇති තෘෂ්ණාව නිසාමයි. මමත්වයේ දැඩිභාවය නිස ඉහත ස්වභාවය වැඩිවෙනවා. මෙහි වඩාත් භයානක කාරණා තිව්ර වෙන්න පුළුවන්. ඒ නිසා ලොව්තුරා බුදු රජාණන් වහන්සේ දේශනා කරනවා කායකර්ම, වචීකර්ම යටපත්කර මනෝ කර්ම නැගී සිටින බව.

සමාජයේදී අපිට පෙනෙනවා සමහරක් පින්වතුන්ලා පුංචි ප්‍රශ්ණයකදී එහෙමත් නැතිනම් ධර්ම අවවාදයකදී ස්වාමීන් වාහන්සේලාගෙන් වුනත් පළිගැනීමට මැලිවන්නේ නැහැ. අවදානම සකස්කර දෙන්නේ දසකුසල් කියන කාරණය ජීවිතයට එකතුකර නොගැනීම නිසා.

## භාවනාවට පෙර අවසාන කොටස

# ඔබ ඔය ද්වේශ කරන්නේ ඔබගේම මෝහයට නොවේද?

පින්වතියක් භික්ෂුවට ප්‍රකාශ කළා 'ස්වාමීන්වහන්ස, මම දිනකට සිය වතාවක් ඉතිපිසෝ භගවා පාඨය සිහිපත් කරනවා. දැනට සිහිපත්කොට ඇති වාර ගණන පනස් දහසකට වැඩියි' යැයි ප්‍රකාශ කළා.

එවිට භික්ෂුව ප්‍රකාශ කළේ 'එය බොහොම වටිනවා. ඔබ මෙනෙහි කරන්නේ බුදුරජානන් වහන්සේගේ උතුම් ගුණයක්. බුදුරජාණන් වහන්සේගේ උතුම් ගුණයක් යමෙක් එක මොහොතක් නමුත් සිහිපත් කරනවා නම්, එය තමාගේ සැපය සඳහාමයි හේතුවෙන්නේ.

නමුත් ඔබ මෙසේ මෙනෙහි කරන ගමන් දක්ෂ වෙන්න ඕනේ, මෙතැනින් ඉදිරියට යන්න. මොකද එම බුදුගුණය සිහිපත් කරන වාර ගණන වැඩි කරගැනීම කියන තෘෂ්ණාව තුළ අවදානමක් තිබෙනවා. ඔබ මෙතැනදි හිතන්න ඕනේ බුදුගුණයේ අර්ථය ගැන. ඇයි බුදුරජාණන් වහන්සේ ඉහත ගුණයන්ගෙන් පරිපූර්ණ වූයේ? උන්වහන්සේ ලෝභ ද්වේෂ මෝහ අවබෝධයෙන් ප්‍රහීන කළ නිසා.

එහෙම නම් වඩාත් අර්ථවත් වෙන්නේ බුදුගුණ මෙනෙහි කරන ගමන්ම, සෑම උදෑසනකම ඔබට පුළුවන් නම් 'අද දවසේ මට ලෝභ සිතක් ඇති නොවේවා! ද්වේෂ, මෝහ සිතක් ඇති නොවේවා! කියලා වීර්යයෙන් යුතුව ඒ සඳහා උත්සාහගන්න,

ඒ තමයි සෑම බුදුගුණයක් කෙරෙහිම ඔබ කරන උතුම්ම පූජාව වෙන්නේ. එවිටයි ඔබ සිහි කරන බුදු ගුණය අර්ථවත් වෙන්නේ. එවැනි පූජාවක් තුළින් වාර ලක්ෂ ගණනක් බුදු ගුණ සිහිකරනවාය කියන ලෝභ සිතිවිල්ල පරාජය කොට, අලෝභය නැමැති කුසල් සිතිවිල්ල ඇතිකරගන්න පුළුවන් වෙනවා. මොකද බුදුගුණ ලක්ෂ ගණනින් සජ්ජායනය කළත් අර්ථවත් ප්‍රතිඵලයක් නැහැ. අපි දවසේ නිතරම ලෝභ, ද්වේශ, මෝහ සිතිවිලි සකස් කර ගන්නවා නම්, අවසානයේදී අපි මුලාවුණා පමණයි. එනිසා ධර්ම මාර්ගයේ අර්ථවත් දිශාවටම ගමන් කරන්න. ලෝභ, ද්වේෂ, මෝහ කියන අකුසල මූලයන්, සැපයේ සතුරන් බව, භාවනාවට බාධාවක් බව, භවනා කිරීමට පෙර හඳුනා ගන්න.

මේ මොහොතේ තවත් එක් කාරණාවක් මතකයට එනවා. එක්තරා වයෝවෘද්ධ කැපකරු මහත්තයෙක් භික්ෂුවට ප්‍රශ්නයක් යොමුකළා. 'මම නිතරම භික්ෂූන් වහන්සේලාව බස්වලට නග්ග වන්න, බෙහෙත් අරන් දෙන්න යනවා. මම මේ කටයුතු කරන්නේ බොහොම ගෞරවයෙන්. මේ කටයුතුවලට මම පාරට ඇවිත් ස්වාමීන් වහන්සේලාව වඩම්ව ගෙන යන්න වාහනවලට අත දිග්කළාට වාහන නවත්වන්නේ නැති වෙලාවල් තිබෙනවා. සමහර බස්රථ නතර කරන්නේ නැහැ. මේ වෙලාවට මට හුගක් කේන්ති යනවා. සමහර දායක පිරිස් තම නියමිත දිනයේදී දානය අරගෙන එන්නේ නැහැ. මේ වෙලාවටත් මට කේන්ති යනවා. මම ඒ මිනිස්සුන්ට බනිනවා. මම මේ කේන්ති ගන්නේ, ද්වේශය සකස් කරගන්නේ ස්වාමීන් වහන්සේලා වෙනුවෙන් නිසා එම කේන්ති ගැනීම අකුසලයක් වෙන්නේ නැහැ නේද?' කියලා.

මේ කැපකරු මහත්තයා අවංකවම සිතාගෙන සිටින්නේ ස්වාමීන් වහන්සේලාගේ අවශ්‍යතාවයන් වලදී, අන්‍යයන් සමග කේන්ති ගැනීම, අන්‍යයන්ට ද්වේශ කිරීම අකුසලයක් සිදුවන කාරණයක් නොවෙයි කියලා. ඒ විධිහට හෝ ස්වාමීන් වහන්සේලා වෙනුවෙන් පෙනී සිටීම කුසලයක් කියලා. බලන්න මෝහය කියන කාරණයේ බරපතළකම.

ඒ මොහොතේ ඒ කැපකරු මහත්තයාට භික්ෂුව කෙටියෙන් ප්‍රකාශ කළේ 'මහත්තයෝ, භික්ෂුවක් උදෙසා නෙමයි, බුදුරජාණන් වහන්සේ උදෙසා හෝ ඔබ අන්‍යයන් සමග ද්වේශයක් ඇතිකර ගත්තොත් එය ද්වේශයක්මයි' කියලා. එය අකුසලයක්මය කියලා.

මේ කැපකරු මහත්තයා ස්වමීන් වහන්සේලාට බොහොම ගෞරව කරන, නිතර බුදුගුණ භාවනාව කරන පින්වතෙක් නිසයි උදාහරණයක් වශයෙන් මෙය සටහන් කළේ. ඔබත් බොහොම පරෙස්සමින්.....

ලෝභ, ද්වේශ, මෝහ සක්කාය දිට්ඨියේ ගජ මිතුරන්මයි.

එමනිසා පින්වත් ඔබ පන්සල, ආරණ්‍යය, පින්කම... මේ කිසිවක් හේතුවෙන් ලෝභ ද්වේෂ මෝහ අකුසල් සිතිවිලි සකස් කරගන්න එපා. ඒවාද අකුසල්මයි. ඔබ එසේ ද්වේශය ඇති කර ගන්නවා නම්, ඒ ඔබ ද්වේශ කරන්නේ ඔබ තුළම ඇති මෝහයට බව සිතන්න. ද්වේශයත්, මෝහයත් ඔබේම නම් ප්‍රතිඵලද ඔබේම බව සිතන්න.

පින්වත් ඔබ, ඉහතින් සඳහන් කළ කරුණු ජීවිතය තුළින් ක්‍රියාත්මක කරන අයෙක් නම්, ඔබට බාධාවකින් තොරව චිත්ත සමාධිය සකස් කොට ගෙන අනිත්‍ය ධර්මයන් වැඩීමට හැකියාව ලැබෙතැයි ඔබටම දැනෙනු ඇත. ඉහත කාරණා, සද්ධර්ම ශ්‍රවණයත්, ශීල සමාධි ප්‍රඥා විමුක්ති මාර්ගය ගැන සාකච්ඡාවත්, කල්‍යාණ මිත්‍ර ඇසුරත් තුළින් අර්ථවත් කරගැනීමත් උදෙසා, නිවන් අවබෝධයෙන් සැනසෙන්නට ලැබුණු මේ උතුම් මොහොතේ පින්වත් ඔබ වීර්යය වඩන්න.

# විශේෂ ලිපි

මෙතැන සිට පළවන ලිපි කිහිපය, පින්වත් ස්වාමීන් වහන්සේ විසින් විශේෂ නිමිති මත තබන ලද සටහන්ය.

# හිංසාවේ රාත්‍රිය

අද ජනවාරි පළවැනිදා. වසරක් ගෙවිල වසරක් ලැබුව දවස. වසරක් ගෙවී ගියාය කියන්නෙ අපි කාටත් ජීවත්වෙන්න තිබෙන කාලයෙන් වසරක් අඩුවුනාය කියන එක. ඒ කියන්නෙ මරණයට වසරකින් ලංවුනාය කියන කාරණය. මේ කොයි පැත්තෙන් බැලුවත් අවංකවම සතුටු වෙන්න දෙයක් මෙතැන නැහැ.

නමුත් ගෙවීගිය වසරේ පින්වත් ඔබ අප්‍රමාදීව ධර්ම මාර්ගයේ ගමන් කළානම් ලැබුවාවූ වසරේ ඊටත් වඩා ශක්තිමත්ව ධර්ම මාර්ගයේ ගමන් කරනවාය කියන අධිෂ්ඨානය ඔබ තුළ ඇතිවුනා නම් එතන තිබෙන්නෙ අර්ථවත් සතුටක්. ඒ වගේමයි ගෙවීගිය වසරේදී දාන, ශීල, භාවනා කටයුතුවලදී ප්‍රමාදභාවයට පත්වුනා, නව වසරේදී මා අප්‍රමාදීව කටයුතු කරනවාය කියන අධිෂ්ඨානයද සතුටට හේතුවක්මයි.

වසරක් ලැබුව අවස්ථාවක පින්වත් ඔබට ජීවිතයේ තැබිය හැකි ලොකුම බලාපොරොත්තුව තමයි මේ වසර තුළදී මා සතර අපායෙන් නිදහස් වීමට උපරිම උත්සාහයක නියැලෙනවාය කියන බලාපොරොත්තුව. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනාකරනවා පැවිදි පක්ෂය විසින් ගිහි පක්ෂයට, දෙමාපියන් විසින් දරුවන්ට, ගුරුවරුන් විසින් ශිෂ්‍යයන්ට, කෙනෙකු විසින් තව කෙනෙකුට පිරිනැමිය හැකි උතුම්ම දායාදය සතර අපායෙන් මිදීමේ මාර්ගය පහදා දීමය, සමාදන් කරවීමය කියලා. නව වසරක් ආරම්භයේදී බුලත් අතකින්, කැවිලි පිඟානකින්, කේක් ගෙඩියකින්, සුභ පැතීමකින්, හුවමාරු කර ගන්නා ඥාතිත්වය, ස්වාමිත්වය, සෙනෙහස, හිතවත්කම

ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළ සැබෑ ඥාති සංග්‍රහය සමග මොනතරම් නම් ප්‍රාථමික දැක්මක්ද? සුභ අලුත් අවුරුද්දක් වේවා කියල කරන ශුභාශිංසනය තුළ මෛත්‍රිය, මනුෂ්‍යත්වය මුසුවෙලා තිබෙන බව ඇත්ත. ඒ ඇත්තේ තරමටම එම ශුභාශිංසනය තුළ අවිද්‍යාවද සැඟවී තිබෙන බව ඇත්තම කාරණයකි.

අවිද්‍යාව කියල කිව්වේ විද්‍යාවෙන් තොර භාවයයි. ඒ කියන්නෙ ඇත්ත ඇති සැටියෙන් නොදැකීමයි. දුක සැප මාරුකොට ගෙන දැකීමයි. ජාති, ජරා, ව්‍යාධි, මරණවලට තව තව ළංවන මොහොතේ සුභ නවසරක් වේවා කියනවා වෙනුවට ලැබුවාවූ නව වසර, සතර අපායෙන් නිදහස් වෙන වසරක් වේවා කියල ප්‍රාර්ථනා කළොත් එතන තිබෙනවා ජාති, ජරා, ව්‍යාධි, මරණවලින් මිදීමට ඔබ ගන්නාවු උතුම් උත්සාහයක්. එහෙත් පින්වත් ඔබ මෙවැනි අර්ථවත් සුභ පැතීමක් කරන්න ලැජ්ජයි. අර්ථවත් දෙයින් අයින් වෙලා අනර්ථවත් දෙය ළංකරගන්නවා. බුදුසරණයි, තෙරුවන් සරණයි කියලා කියනව. නමුත් ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශණාකොට වදාළ ධර්ම මාර්ගය ගැන කියන්න ලැජ්ජා වෙනවා. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ සරණගියා යැයි කියන්නෙ අර්ථවත් ආකාරයෙන් ධර්ම මාර්ගයේ ගමන් කරනවාය කියන කාරණයයි. පින්වත් ඔබ සතර අපායෙන් නිදහස් වීම සඳහා සමාදන් විය යුතු තෙරුවන් කෙරෙහි අචල ශ්‍රද්ධාව, ශීලයේ පරිපූර්ණත්වය, පංචඋපාදානස්කන්ධයේ අනිත්‍යභාවය දැකීම කියන අර්ථයන් මහා සංඝ රත්නය විසින් නිරතුරුවම ඇසෙන මොහොතක, අපි මොනතරම් දුර්වලතාවයකින්ද ජීවිතය සැලසුම් කරගන්නේ. අප්‍රමාණ සැප ලැබිය හැකි මාර්ගයක් ඇස්පනාපිට තිබියදී අති දීර්ඝ දුකක් උදෙසා කෙටි සැපයමයි අපි සොයන්නේ. ලොව පහළවූ ශ්‍රේෂ්ඨ ශාස්තෲන් වහන්සේනමකගේ ඉගැන්වීම්වල අර්ථයන් ලිහිල් භාවයට පත්කොට ආගන්තුක වටිනාකම් අපේ කරගැනීම අභාග්‍යයකි. මෙතැනදී පින්වත් ඔබ සිතන්න අවශ්‍ය නැහැ අපට මාර්ගය කියල දෙන ගුරුවරු කොතැනද ඉන්නෙ

කියලා. ඇසෙන සම්බුදු ධර්මයයි ඔබ ඔබේ මාර්ගය කරගත යුත්තේ. ගුරුවරුන්ගේ පුංචි හෝ දුර්වලතාවයක් දකිනම් එයද මාර්ගය වැඩීමේදී කමටහනක් කොට ගැනීමට ඔබ දක්ෂවිය යුතුය.

ලෝක තත්ත්වයන්ට ඇලීමේ, ගැටීමේ ස්වභාවයන්ට යන්නේ නැතිව සමාජය, මනුෂ්‍යයා, ව්‍යාකූල වෙන්න වෙන්න ඇතිවන සමාජ විකෘතියත් ධර්මයේ අර්ථය වශයෙන්මයි අපි දැකිය යුත්තේ. ලෝක ධර්මයන් කෙරෙහි ඇලීමත් ගැටීමත් සකස්වෙන සිතක ඔබ නොදකින එකම දෙය අනිත්‍යයයි. ඒ කියන්නේ ධර්මයේ අර්ථය නොදැනීමයි. ධර්මයේ අර්ථය නොදකින්නා තමා අත්දකින ලෝක ධර්මතාවයන් හමුවේ ඇලීමත් ගැටීමත් අතර දෝලනය වෙමින් ධර්මයේ ස්වභාවය අවබෝධ කොටගැනීම මගහැර නිත්‍යවූ සැපයක්ම සොයනවා. මෙතැනදී තමයි සමාජ ව්‍යාකූලභාවය විකෘතිභාවය සකස් වෙන්නේ. අසීමිත ඇලීම්, අසීමිත ගැටීම්, අසීමිත උපේක්ෂාවන්ගේ එකතුවක් වෙනවා ලෝකය.

ඵලය ලෝකය තුළදී දුටුවත්, හේතුව සකස්වූයේ ධර්මය නොදත් මිනිස් සන්තානය තුළම නේද? කැඩෙන, බිඳෙන, විසිරෙන සම්මුති ලෝකයේ අර්ථය සකස් වෙන්නේ නාම රූප දෙක නැමති 'පුංචි ලෝකයේ' හේතුඵල ධර්මතාවයන් නිසාම නේද? ඒ නිසා පින්වත් ඔබ ධර්ම මාර්ගයට එන්න. මාර්ගයේ හික්මෙන්න. එවිට ඔබ දකින ලෝකය යහපත් වේවි. ඔබ ලෝකය තුළ සුරක්ෂිත වේවි. ඔබ ලෝකයෙන් නිවීයාවී. ඉහත කරුණු සියල්ලම සකස්වුනේ ඔබ තුළින්ම නේද? කැඩෙන, බිඳෙන, විසිරෙන සම්මුති ලෝකයත්, නාම රූප නැමති මම කියන 'පුංචි ලෝකයත්', අනිත්‍යයේ අර්ථයෙන්ම සකස්වුන දේවල්ය. අර්ථය අනිත්‍යවූ කල්හී යමක් නිත්‍ය භාවයක් සොයයි නම් ඔහු සොයන දෙය කවදාවත් හමුනොවනු ඇත. ඔබද මාද සසර මෙතෙක් පැමිණියේ එම නිෂ්ඵල ගමනයි.

පින්වත් ඔබ ලැබූ මේ ජීවිතයද සැප කෙරෙහි ඇති තෘෂ්ණාව නිසා සකස් කොට ගත් ජීවිතයකි. පින්වත් ඔබම තීරණය කරන්න

ඔබ ධර්මයෙන් කොතරම් දුරස්වෙලාද ඉන්නෙ කියලා. මේ දුරස් භාවය අවම කරගන්න ඔබ විසින් ඇති කරගන්නා අධිෂ්ඨානය ක්‍රියාත්මක භාවයට පත්වෙද්දී ඔබ තුළ ශ්‍රද්ධා, වීර්ය, සති, සමාධි, ප්‍රඥා කියන ධර්මතාවයන් වැඩෙන්න ඕනේ එකිනෙකට අඩු වැඩි භාවයෙන් තොරව. මෙන්න මේ 'අඩු වැඩි භාවයකින් තොරව' කියන ස්වභාවය සමජයේ හුඟ දෙනෙකුගෙන් ගිළිහී ගොස් තිබෙනවා. ප්‍රඥාව වැඩෙන ආකාරයට නොවේ සද්ධා, වීර්‍ය්‍යය, සති, සමාධි කියන කාරණා ජීවිතයට එකතුකර ගන්නේ. විදර්ශනා ඥාණය වැඩෙන දිශාවටමයි පින්වත් ඔබ ඉහත කාරණය සතියෙන්, සිහියෙන් යුතුව ජීවිතයට ගලපා ගතයුත්තේ. මමත්වය වැඩෙන දිශාවට නොවේ. වසරක උදාවක් සමරන මොහොතක මෙවැනි ධර්මයක් ගැන පින්වත් ඔබ නැවත නැවත සිතනවා නම්, මෙවැනි ධර්මයකට මුල්තැන දෙනවා නම් එම වසර මොන තරම් සංහිඳීමට පත්වූ වසරක් වේවිද? අර්ථවත් ලෙසම තෙරුවන් සරණගිය වසරක් වෙනවා නේද? පින්වත් ඔබ ගත්තා වූ තීරණයෙන් සැනසෙන්නේ ඔබම නේද? දුකෙන් මිදෙන දිශාවට යන්නේ ඔබම නේද? එසේ නොවුන කල්හි ඔබ යන දිශාව ගැන පහත සටහන තබමි.

ජනවාරි පළවෙනිදා කියනකොටම සිහියට නැගෙන්නේ දෙසැම්බර් 31 දා රාත්‍රියයි. මේ රාත්‍රියේ භික්ෂුව වැඩසිටියේ අගනුවරට ආසන්න ආරණ්‍යයකය. රාත්‍රී 12.00 වෙලාවට ආසන්න වෙද්දී පුපුරා ගිය රතිඤ්ඤා පිපුරුම් හඬ මොන තරම් වේගවත්ද කියලා පින්වත් ඔබටත් ඇසෙන්නට ඇති. මේ රතිඤ්ඤා පිපුරුම් හඬේ ඝෝංකාරය කියන්නේ අවිද්‍යාවේ හඬයි. ඔබ හිතල බලන්න මීට වසර විසිපහකට පෙරාතුව ඉඳල වසරින් වසර මේ හඬ වැඩිවුනා මිසක් අඩුවුනේ නැහැ. අනාගතයේ කවදාකවත් මේ හඬ අඩුවෙන්නේ නැහැ, වැඩිවෙනවා මිසක්. මේවා ලෝක ධර්මතාවයන්. මනුෂ්‍යයා ධර්මයෙන් පිරිහෙන්න පිරිහෙන්න නොවටිනා වටිනාකම් අර්ථවත් වෙනවා. ශීලයේ, සමාධියේ, ප්‍රඥාවේ නිහඬභාවයට එරෙහි ස්වභාවයන් තමයි

සකස් වෙන්නෙ. ඝෝෂාව යම් තැනක තිබෙනවා නම් එතන ශිලයක්, සමාධියක් තිබෙන්න විදිහක් නැහැ. මේ දෙක නැති තැන ප්‍රඥාව ගැන කථා කරල තේරුමක් නැහැ. ආයිමත් අපි එන්නේ අවිද්‍යාව කියන තැනටමයි. ලෝකයේ තිබෙන සැබෑම නිහඬතාවය අත්විඳින්න පුළුවන් ඝෝෂාව තුළදීයි. දෙසැම්බර් 31 රාත්‍රියේ භික්ෂුව සයනය මත වැතිරී ඒ සැබෑම නිහඬතාවය අත්වින්දා හොඳ හැටියට. පරිසරය ඝෝෂාකාරී වෙන්න වෙන්න තමන්ගේ සිතේ නිහඬභාවය හොඳින් දැනෙනවා, පෙනෙනවා. පුපුරණ රතිඤ්ඤා හඬින් දෙදරුම්කන පරිසරය, නිහඬ සිතින් අත්දකිද්දි අවිද්‍යාවේ ඝෝෂාවත්, විද්‍යාවේ නිහඬතාවයත් සක්සුදක් සේ පැහැදිළි වෙනවා. අර්ථවත් වෙනවා. එවිට දුකක්, සැපක් නොවේ සිතට දැනෙන්නේ. අවදානමෙන් මිදුනාවූ නිදහසේ සුවයයි. මෙවන් අසිරිමත් මාර්ගයක් පින්වත් ඔබේ ඇස්පනාපිට තිබියදී ශීලයේ, සමාධියේ, ප්‍රඥාවේ උතුම් නිහඬතාවයේ අර්ථය රතිඤ්ඤාවේ හඬින් විනාශකොට දමනවා.

පින්වත් ඔබ කල්පනා කරන්න වසර සුබ වෙන්න කියලා. ඔබ කොතෙක් රතිඤ්ඤා පත්තු කළත් වසර සුබවෙලා තිබෙනවාද? දවසින් දවස ක්‍රෝධය, වෛරය, දුෂ්ශීල භාවය මහා වේගයකිනුයි සමාජයේ ඉහළ යන්නේ. රතිඤ්ඤා පිපුරුම් හඬේ දෝංකාරය යම් සේ වේගවත්ද දුෂ්ශීලභාවයේ වර්ධනයත් සමාජය තුළ වේගවත් වෙලා. ශ්‍රාවකයා ශාස්තෘන්වහන්සේ හඳුනන්නේ නැහැ. ගුරුවරයා ගෝලයා හඳුනන්නෙ නැහැ. දෙමාපියන් දරුවන් හඳුනන්නෙ නැහැ. පාලකයා ඇත්ත යුක්තිය හඳුනන්නේ නැහැ. පිරිහීමේ දෙසටමයි සමාජය ගමන් කරන්නේ. ඒ කියන්නේ කොතෙක් රතිඤ්ඤා පත්තු කළත් වසර සුබවෙලා නැහැ. කොහොමද වසර සුබ වෙන්නෙ මනුෂ්‍යයා විසින් මොන තරම් අකුසල් කන්දරාවක් සිදුකර ගෙනද? මොනතරම් සත්ත්ව ඝාතන, සත්ත්ව හිංසාවන් සිදුකර ගෙනද? වසරක් උදාවෙන්නේ. දෙසැම්බර් 31 වෙනිදා රාත්‍රියේ රතිඤ්ඤා පත්තු කරන ඔබ මොනම හේතුවක් නිසාවත් සිතන්නෙ නැහැ ඔබ පත්තු කරන රතිඤ්ඤා නිසා බරපතල

සත්ත්ව ඝාතන, සත්ත්ව හිංසාවන් සිදුවෙනවා කියලා. මොකද ඔබ දකින්නෙ ඇසෙන් පෙනෙන ලෝකය පමණයි. ගස්, ගල්, මනුෂ්‍යයෝ, ගෙවල් දොරවල් ඔබට පෙනෙන ලෝකය. ඒ ලෝකය තුළ ඔබ නිවැරදි කරුවෙක් බව ඇත්ත. නමුත් පින්වත් ඔබ තරගයට පරිසරය දෙදරුම් කවමින් පුපුරුවා හරින රතිඤ්ඤා හඬින් මොනතරම් ඔබට නොපෙනෙන අමනුෂ්‍යයින් මිය යනවා ඇත්ද? කොතෙක් ඔබට නොපෙනෙන අමනුෂ්‍යයින් තුවාල ලබනවා ඇත්ද? මෙම ප්‍රේත, භූත අමනුෂ්‍යයින් මේ රාත්‍රියේ අත් විඳින්නා වූ පීඩනය නිසා ඔවුනගේ සිත තුළ සකස් වෙන්නාවූ වෛරය, ක්‍රෝධය නව වසරේ අසුභ තුටුපඬුරක් සේ ලෝකයාට ලැබෙනවා. ගස්වල වැඩ සිටින රුක් දෙවිවරු භුම්මාටු දෙවිවරු වැනි කොටස් මේ බිහිසුණු රතිඤ්ඤා හඬින් මොන තරම් කම්පාවෙනවා ඇත්ද. ඒ දෙවිවරුන්ගේ සිත තුළත් ද්වේශය, වෛරය, ක්‍රෝධය සකස්වෙනවා. මේ ද්වේශයත් නව වසරක් උදාවෙද්දී ඔබ ලබන අසුබ තුටුපඬුරක්මයි. එම රාත්‍රියේදී රතිඤ්ඤා හඬට බියෙන් දුවන තිරිසන් සතුන් කොතෙක් නම් සිටිනවාද? මරභයෙන් ගැහෙමින් සැඟවෙන්න දිවයන ඒ සිත් තුළ ද්වේශය, වෛරය සකස්වෙනවා. මේ ද්වේශයත් නව වසරේ ලෝකයා ලබන අසුභ තුටුපඬුරක්මයි. රතිඤ්ඤා කරලක් පුපුරා යනකොට එම හඬට, ගින්දරට පිළිස්සී දෙදරුම් කෑමට ශරීරය පුපුරා ගොස් මොන තරම් කුඩා කෘමි සතුන් මියයනවා ඇතිද? මේ විනාශවන සතුන්ගේ සිතේ සකස්වෙන ද්වේශයත් නව වසරේ ඔබ ලබන අසුභ තුටු පඬුරක්මය. ගස්වල, කැදැලිවල ජීවත්වෙන කුරුල්ලන්, කුඩා පැටවුන්, මෝරන බිත්තර මොන තරම් විනාශවෙලා යනවා ඇතිද? ඔය දෙදරුම් කෑමේ හඬට. එම කුරුල්ලන් බියට පත්වී අන් සතුන්ගේ ගොදුරු බවට පත්වෙනවා ඇතිද? මේ සතුන්ගේ සිත් තුළ සකස්වන ද්වේශයද නව වසර උදාවේදී ඔබ ලබන අසුබ තුටු පඬුරක්මය. ඉහත කොටස් අසහනයට, අපහසුතාවට, මරණයට, මරණීය වේදනාවන්ට, හිංසාවට පත්වීමෙන් සකස් වන්නාවූ අකුසල් කන්ද කර ගසා ගෙන තමයි නව වසරක් උදාවෙන්නේ. මේ අමානුෂික ඛේදවාචකය පින්වත් ඔබට

නොපෙනෙන්නේ අවිද්‍යාවේ හඬ බලවත් වීම නිසාය. පින්වත් ඔබට මාර සිතක් ඇතිවෙන්න පුළුවන්, රතිඤ්ඤා පත්තුකළාම සතුන්ව මරා දැමීමේ, හිංසාකිරීමේ චේතනාවක් ඔබ තුළ නැතිය කියලා. ඒ සිතිවිල්ල නිවැරදි වෙන්න පුළුවන්. නමුත් මියයන, තුවාල ලබන, හිංසනයට පත්වෙන, එම සත්ත්වයින්ගේ සිතේ නැගෙන ද්වේශය, වෛරය, ක්‍රෝධය සුබ පිරිත් දේශනාවක් සේ නොව, අසුබ වියරු අඳෝනාවක් සේ වායු ගෝලයට එකතුවනවා නියතය. බියෙන්, වෛරී චේතනාවන් සකස් කොටගෙන මියයන අමනුෂ්‍යයින්, තිරිසන් සතුන් වඩාත් නපුරු වියරු අමනුෂ්‍යයින් බවට පත්ව නැවත උපත ලබා, තමන්ගේ පෙර ජීවිතයේ විනාශයට හේතුවූ රතිඤ්ඤා පත්තුකළ මනුෂ්‍යයින්ගෙන් පළිගැනීමේ සිත් සකස් කොට ගැනීමේ ස්වභාවයද පින්වත් ඔබ තේරුම් ගත යුතුය. සමාජය දිනෙන් දිනම වෛරය, ක්‍රෝධය, ද්වේශය වැඩෙන දිශාවටමද මනුෂ්‍යයා වියරු ස්වභාවයටම පත්වීමටද හේතු ඉහත කාරණා තුළද සැඟව තිබීමට පුළුවන. මේ සිද්ධීන් දෙස බැලීමේදී ඔබට වැටහෙනවාද අවිද්‍යා සහගත ක්‍රියාවන් ඔබව මොනතරම් විනාශය කරා දුක කරා රැගෙන යනවාද කියලා.

පන්සලේ ඝණ්ඨාරය නාද කරන කොට, හේවිසියක හඬ ඇසෙන කොට, මඟුල් බෙර හඬ ඇසෙන කොට මොන තරම් සංහිඳීමක්, සංයමයක් එම හඬේ තිබෙනවාද. එම හඬින් ඉහතින් දැක්වූ විනාශයන්, අකුසලයන් සිදුවෙනවාද? කුඩා කිරිදරුවෙක් නම් පීඩා විඳින්න පුළුවන්. පින්වත් ඔබට ශබ්ද පූජාවක් කිරීමට අවශ්‍ය නම් පමණක් තිස්එක් වනදා මධ්‍යම රාත්‍රියට පන්සලේ ඝණ්ඨාරය නාද කරන්න ගමටම ඇසෙන්නට. මඟුල් බෙරයක් නාද කරන්න. මෙය සමාජයට නුහුරු දෙයක් බව ඇත්ත. එහෙත් ඔබ තුළින් නරකක් වරදක් නම් වෙනත් සත්ත්වයකුට සිද්ධවෙන්නේ නැහැ. දෙවියන් අමනුෂ්‍යයන් පවා මේ හඬට ප්‍රිය වෙනවා. තිරිසන් සතුන් පවා මේ හඬ විඳිනවා. හැමෝගෙම ආශිර්වාදයෙන් තමයි වසරක් උදාවෙන්නේ. සශ්‍රික දිව්‍යතලවල සිටින දෙවියන් පවා

ඔබට ආශිර්වාද කරනවා. කාටද මේ ආශිර්වාද කරන්නේ? ශීලයට. පින්වත් ඔබ ශීලයෙන් හික්මුන නිසයි, රතිඤ්ඤා පත්තුකිරීමෙන් සත්ත්ව ඝාතන, සත්ත්ව හිංසා සිදුවෙනවාය කියන යථාර්ථය දැක්කේ. ශිල්පද ආරක්‍ෂා කරන්න උත්සාහගත් නිසයි ඔබ එම වැරදි ක්‍රියාවෙන් වැළකුනේ. ශීලයට වටිනාකමක් දෙමින් තමයි එතකොට ඔබ නව වසර අරඹන්නේ. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කළ නිසයි ඔබ සත්ත්ව හිංසාවෙන් වැළකුනේ. ශීලයට වටිනාකමක් දෙන විටම ඔබ තෙරුවන් සරණේ පිහිටලා. රතිඤ්ඤා පත්තුකිරීමෙන් සතුන්ට මරණීය දුක, හිංසනය සිදුවෙනවාය, මම එම සතුනිට අභය දානය දෙනවාය කියලා හිතන කොටම ඔබ තුළ කුසල් චේතනාවක් සකස්වෙලා. නව වසර පින්වත් ඔබ අරඹන්නේ සතර අපායෙන් මිදීමේ සාධක සියල්ලම දෝතින් දරාගෙනමයි. පුංචි දෙයකින්, මොන තරම් නම් වෙනසක් සිදුකරන්න පුළුවන්ද. මේ පුංචි දෙය වෙනස් කරගැනීමට නොහැකිවීමෙන්, ඔබ සසර මොනතරම් නම් දුර ගමනකට වැටෙන්න ඉඩ තිබෙනවාද?

# දෙවියන්ද වඳින පින් බිමයි මේ....

## 2012 විනාශයක් ගැන (සත්පුරුෂ)

## ඔබ බියවිය යුතු නැත

*පින්වත් භික්ෂූන් වහන්සේ විසින් මේ ලිපිය අප අතට පත්කළේ 2011 වසර අගදීය. ඒ වන විට මායාවරුන්ගේ දින දසුන ඇඳා ගනිමින් 2012 වසරේ සිදුවියහැකි ලෝක විනාශයක් ගැන සැකයක්, බියක්, මතවාදයක් ලෝකයා තුළ විය. මේ ගැන අහම්බයෙන් දැනගන්නට ලැබුණු උන්වහන්සේ, එය ධර්මයට ගලපමින්, ධර්මය තුළ වන රැකවරණය සඳහන් කරමින් තැබූ මෙම සටහන, එම වකවානුවෙන් වසර කිහිපයක් ගෙවී ඇති අද සිට ආපසු හැරී බැලීමේදී, එම ධර්ම කරුණුවල ගැලපීම පිළිබඳ පින්වත් ඔබට අදහසක් ගතහැකි සාධකයක් යැයි සිතමු.*

භික්ෂුව මේ මොහොතේ වැඩ සිටින කුටියට පැමිණි ආගන්තුක වැඩිහිටි ස්වාමීන්වහන්සේ නමක් ප්‍රකාශ කළා වසර 2012 දී ලෝකයේ සිදුවන යම් අසහනකාරී තත්ත්වයක් සම්බන්ධයෙන් ලෝකයා කථාබහ කරන බව. පින්වත් උන්වහන්සේද ඒ ගැන රටේ ලෝකේ කථාකරන මතවාද කිහිපයක්ම ප්‍රකාශ කළා. භික්ෂුවට මේ ගැන කිසිදු දැනීමක් නැහැ. ඔය වගේ කිහිපදෙනෙක් කියපු දේවල් අසා තිබෙනවා පමණයි. මේ සිද්ධිය මෙතැනින් අහවර වුනා. එය හුදෙක් පිළිසඳරක් පමණක් වුනා. එක්තරා භික්ෂුවක් ඉහත සිතිවිල්ල සිතමින් සිට අරමුණුවලින් බැහැරව හුදෙකලා කුටියේ සමාධිමත්ව වැඩසිටින විට භික්ෂුවට ඇසෙනවා 'අප ශ්‍රී ලංකා මාතා... නමෝ නමෝ නමෝ නමෝ මාතා... ශ්‍රී ලංකා

ජාතික ගීය (සම්පූර්ණයෙන්ම)

මෙය ගැයෙන්නේ පිරිමි සහ කාන්තා කටහඬින්. භික්ෂුව අරමුණු නොකරම, මේ ඇසෙන්නේ දිව්‍ය ශ්‍රෝත හඬ. ඒ කියන්නේ දෙවියන්ගේ හඬ.

එම ගීතයේ හඬ සමග සංගීත රාවය එක දිගට භික්ෂුවට ඇසෙන්නට පටන් ගත්තා. වේලාව අළුයම 1ට පමණ ඇති. වනගත මුළු ප්‍රදේශයම දැඩි නිහඬතාවක තිබුණා. භික්ෂුවට දැනුනේ භික්ෂුව මොහොතකට පෙර සිතමින් සිටි සිතිවිල්ල 2012 වසර කෙරෙහි දෙවියන්ගේ ප්‍රතිචාරය තමයි දිව්‍ය ශ්‍රෝත තුළින් ඇසෙන්නේ. භික්ෂුව ලැබූ මේ අත්දැකීම පින්වත් ඔබට මෙහි සටහන් කරන්නේ ලෝකයා සමඟ සසඳා බලනකොට පින්වත් ඔබ මොනතරම් වාසනාවන්තද කියලා ඔබට දැනගන්නයි.

ලොව්තුරා බුදුරජාණන් වහන්සේ සුගතිය වශයෙන් හඳුන්වන ලද සශ්‍රීක දිව්‍යතලවල දෙවියන් පවා බෞද්ධ රටේ උතුම් පින්වතුන්ලා වෙනුවෙන් ආශිර්වාද කරනවා. ලක් මාතාවට යහපතක් වේවා, සුරක්ෂිත වේවා කියලා. පින්වත් ඔබ හොඳින් දැනගන්න ඕනේ සුගති භූමිවල වැඩ සිටින මාර්ගඵල ලාභී නොවන සශ්‍රීක දෙවිවවරුන්, දිව්‍යාංගනාවන් කියන්නේ කවුද කියලා. පායාසී කියන සූත්‍රයේදී කුමාර කාශ්‍යප මහ රහතන් වහන්සේ දේශනා කරනවා සශ්‍රීක දිව්‍යතලවල වැඩ සිටින දෙවියන් හැමවිටම මනුෂ්‍ය ලෝකයේ මනුෂ්‍යයාට යොදුන් සියයක් ඈතින් ඉන්නේ කියලා. එම දෙවියන් මනුෂ්‍යයාට යොදුන් සියයක් ඈතින් ඉන්නේ මනුෂ්‍ය ගඳ දෙවියන්ට ඉවසන්නට බැරි නිසා. මෙතැනදී මනුෂ්‍යයාගේ ගඳ කියාලා කියන්නේ මනුෂ්‍යයාගේ දහඩිය ගඳ නොවෙයි. මනුෂ්‍යයාගේ දුසිල්වත් භාවයේ ගඳ, අසත්පුරුෂ භාවයේ දුගඳ, තෘෂ්ණාවේ අපුල දුගඳ ඉවසන්න දරන්න දෙවියන්ට බැරි නිසයි දෙවියන් නිරතුරුවම මනුෂ්‍යයාට වඩා යොදුන් සියයක් ඈතින් වැඩසිටින්නේ. නමුත් ශීලයෙන්, සමාධියෙන්, ප්‍රඥාවෙන් පිරිසිදු පින්වත් මනුෂ්‍යයන් ළඟට දෙවියන් එනවා. දෙවියන් එම පින්වතුන්ට ආශිර්වාද කරනවා.

පින්වත් ඔබට මට මනුෂ්‍ය ලෝකයේ සිට සග්‍රික දිව්‍යතලවලට ඇති දුර යොදුන් ලක්‍ෂ ගණනක් වුවද ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනාකොට වදාළ උතුම් ධර්ම මාර්ගය තුළ එම දිව්‍ය තලවල හඬ ගෙදර තිබෙන ගුවන් විදුලියේ හඬ තරමටම අපට සමීපකොට දී තිබෙනවා. මේ සම්මා සම්බුදු ඥානයේ උතුම් ආශ්චර්යයයි. සමාධියේ ආශ්චර්යයෙන් අත්දකින ලෝකය, විදර්ශනාවේ අවබෝධයෙන් අනිත්‍ය, දුක්ඛ, අනාත්ම වශයෙන් දකිමින් ලෝකයෙන් මිදෙන මාර්ගයක් බෞද්ධ අපට උරුමකර දී තිබෙනවා.

මේ ආශ්චර්යය දකිද්දී, ඇසෙද්දී, කියවද්දී තෙරුවන් කෙරෙහිමයි පින්වත් ඔබ ශ්‍රද්ධාව සකස්කොට ගතයුත්තේ. පින්වත් ඔබටත් මේ සම්බුදු උණුසුම උරුමයි. මාර්ගය තුළ නිවැරදිව ගමන් කළොත්. මනුෂ්‍යයින්ට යොදුන් සියයක් ඈතින් වැඩ සිටින දෙවියන්, දිව්‍යාංගනාවන් කියන්නේ, අතීත මනුෂ්‍ය ජීවිතවල තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවේ, දානයේ, ශීලයේ ඵලයයි. මනුෂ්‍ය ලෝකයේ කුණු කසල, අපුල, ගේ දොර ඉඩකඩම්, සැමියා බිරිඳ, දූ දරුවන්, කීර්ති ප්‍රසංශා, නිලතලවලට ඇති ඡන්ද රාගයේ විෂ තාවකාලිකය මරාදමූ උතුම් සිල්වතුන්ගේ සුගති භූමියයි සග්‍රීක දිව්‍ය තල කියන්නේ. මෙවන් සුගති භූමිවල වැඩසිටින දෙවියන් මේ පුණ්‍ය දීපයට සෞභාග්‍යයක් වේවා කියලා දිව්‍ය සංගීතයෙන් ආශිර්වාද කරනවා. බලන්න පින්වත් ඔබ නොදකින, පින්වත් ඔබ නොසිතන, කහවනු-ඩොලර්-රියාල් පසුපස්සේ හඹායන බැංකු ගිණුමේ ඉලක්කම් පේළිය වැඩිකරගැනීම උදෙසාම වෙහෙසෙන, පින්වත් ඔබ අමතක කළා වූ මතකයක් දෙවියන්ට තිබෙනවා. දෙවිවරු දන්නවා තමන්ට මෙවන් අසිරිමත් දිව්‍ය සැපයක් ලබාගැනීමට උපකාර වූ සද්ධර්මය අවංකවම, විවෘතවම, තවමත් බබලන්නේ මේ ධර්මද්වීපයේය කියලා. නමුත් මේ ධර්මද්වීපයේ උතුම් මනුෂ්‍යයින් හැටියට ඉපදිලා පින්වත් අපි මුදලට, කීර්තියට, දේපලට, වැඳවැටෙමින් ඒවා මත්තේම අපේ උතුම් බෞද්ධකම දුර්වල කරගත්තත්, ඒ සග්‍රීක දෙවියන් සද්ධර්මය හේතුවෙන් ලබාගත් ඒ සග්‍රික දිව්‍යශ්‍රීය අත්විඳිමින්ම ඒ සද්ධර්මය තවමත්

බැබලෙන මේ පින්බිමට, ශ්‍රී ලංකා මාතාවට 'නමෝ නමෝ මාතා' කියලා නමස්කාර කරනවා ගීතයෙන්. මේ උතුම් රට රැකේවා, චිරාත් කාලයක් දිනේවා ! කියලා.

දෙවියන් එහෙම මේ උතුම් රටට චිරාත් කාලයක් දිනේවා ! කියලා ආශිර්වාද කරන්නේ ඔබ අප මෙන් කුණු කසල ලෞකික සම්පත් බලාපොරොත්තුවෙන් නොව, මේ උතුම් සද්ධර්මයේ ආරක්‍ෂාව, මේ උතුම් ධර්මය එක දිනක් හෝ වැඩිපුර ආරක්‍ෂාවී පවතීවා කියන සත්පුරුෂ භාවයෙන්මයි. දෙවිවරු හොඳින් දන්නවා තමන් යම් දවසක දිව්‍ය සැප අහවර වී දිව්‍ය තලවලින් චුත වුවහොත් නැවත දෙවියෙක් වීමට නම් සම්මා සම්බුද්ධ ශාසනය අතුරුදහන් නොවී පවතින්න ඕනේය කියලා. ඒ වගේම පින්වත් දෙවියන් දන්නවා මේ ගෞතම ශාසනය අවසන් මොහොත දක්වා රැකෙන්නේ මේ උතුම් පින් බිමේමයි කියලා.

සග්‍රික දිව්‍යතලවල සිටින දෙවියන්ගේ අම්මා කියන්නේ සද්ධර්මයට. සද්ධර්මය නැමැති අම්මාගෙන් තමයි, එහි ඵලයෙන් තමයි දිව්‍ය සම්පත් දෙවියන්ට ලැබෙන්නේ. බලන්න සද්ධර්මයට දෙවියන් මොනතරම් කෘතගුණ සලකනවාද කියලා. නමුත් උතුම් සුගති භූමියක් වන මේ මනුෂ්‍ය ලෝකයේ උරුමය ලැබූ ඔබ දවසකට එක පැයක් සද්ධර්මය වෙනුවෙන් කැපවෙනවාද? ඔබ ලබන ආදායමෙන් අවම වශයෙන් සියයට දහයක් වත් කර්මය කර්මඵල විශ්වාසයෙන්, තෘෂ්ණාවෙන් තොරව දන්දෙනවාද? අවම වශයෙන් පංචශීලය නිතිපතා ආරක්‍ෂා කරගන්න උත්සාහ ගන්නවාද? ලෝකයාට නොවේ, අවම වශයෙන් තම සැමියා, බිරිඳට, එසේත් නැතිනම් අසල්වැසියාටවත් මෛත්‍රීය වඩනවාද? පින්වත් ඔබේම හදවතට තට්ටුකර ඔබම අසන්න. උත්තරය 'නැහැ' නම් පින්වත් ඔබ අසත්පුරුෂයෙක් බව ඔබම දකින්න නිහතමානී වෙන්න. මොකද ඔබට මේ මනුෂ්‍ය ජීවිතය ලබාගන්න උපකාරවූ උතුම් ධර්මයන්ට ඔබ කෘතවේදී නොවන නිසා. පින්වත් ඔබට දෙවියන් නොපෙනුනාට දෙවියන්ට ඔබව පෙනෙන බව සිතන්න. උපක්‍රමශීලීව එහෙම සිතාවත් වහ වහා

නිවැරදි වෙන්න. ලෝකයාව රවට්ටන්න අපිට පුළුවන් වෙන්න පුළුවන්. එහෙත් ලෝක ධර්මතාවයන් රවට්ටන්න අපට බැහැ. ඒ වගේමයි. මනුශ්‍යයින්ව රවට්ටන්න අපට පුළුවන්, නමුත් සශ්‍රීක දිව්‍යතලවල දෙවියන් රවට්ටන්න අපට බැහැ. අප හොඳින් මතක තබාගන්න ඕනේ, සතුටින් සිනාසෙමින් ලෝකයාට වහන්වෙමින් අපි කොතෙක් වැරදි කළත්, එම දුසිල්වත්භාවයේ විපාකයන් නිසා මරණින් මතු නිරයට වැටුනොත් නිරයේදී ඔබට මුණගැසෙන යම රජුත් සශ්‍රීක දිව්‍යතලයක සිටින දෙවිකෙනෙක්ම බව ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. මනුෂ්‍ය ලෝකයේදී සියල්ල ඔබ මුදලට ගත්තත් යමරජු ඉදිරියේ ඔබ නිරිසතෙක් බව සිහි තබාගත යුතුය. උපරිම අවුරුදු 80 ක ජීවිතයක් උදෙසා, තාවකාලික තනතුරක් උදෙසා ඇයි දෙයියනේ මේ උතුම් සද්ධර්මයෙන් බැහැරට ගොස් නිරයට වැටෙන්නේ. මෙලොව පරලොව දෙකේදීම ඔබ අනාරක්ෂිත වෙනවා.

ලොව්තුරා බුදුරජාණන් වහන්සේ ධර්මය අර්ථය තුළ මේ ජීවිතය දැකිය යුත්තේ නාසයෙන් ඉහළට ගත් ආශ්වාස පොද නාසයෙන් පිටවන මොහොතේ මේ ජීවිතයේ මරණය සිදුවේය කියන අර්ථයයි. නමුත් ලෝකය පවතිනවා, සංස්කාරකයන්ට නිජබිමක් වෙමින්. ඒ නිසා කිසිවක් අපට අවශ්‍ය විදිහට සිදුවන්නේ නැහැ. ලෝකයේ නිරතුරුවම අතුරු විනාශයන් සිදුවෙමින් පවතිනවා. සතර මහා ධාතුවේ කිපීම නිසා විනාශයන් සිදුවෙන්න පුළුවන්. පස්ස, වේදනා, සංඥා, සංස්කාර, විඤ්ඤාණ කියන පංච උපාදානස්කන්ධය නිත්‍යභාවයෙන්, ආත්මීය භාවයෙන් ගැනීම නිසා දෙවියන්ගේ, මනුෂ්‍යයන්ගේ, අමනුෂ්‍යයන්ගේ වියරු භාවය, තෘෂ්ණාධික භාවය නිසා විනාශයන් සිදුවෙන්න පුළුවන්. මේ කුමන ආකාරයේ විනාශයක් වළක්වන්න දෙවියන්ට බැහැ. මොකද විනාශය කියන්නේ ධර්මය. ඒ කියන්නේ අනිත්‍යය. මාර්ග ඵලලාභී නොවන දෙවියනුත් මේ ධර්මතාවයන්ට යටයි. නමුත් සුගතිභූමිවල වැඩසිටින මහේශාඛ්‍ය දෙවියන්ට පුළුවන් පිංවතුන්ට උපකාර කරන්න. මොකද ඒ අය සුරක්ෂිත නිසා.

ඒ සුරක්ෂිතභාවය දෙවියන් ලබාගන්නේ ධර්මය තුළින්. ඉරවල් හතක් පායා කල්ප විනාශයක් සිදුවන මොහොතේත් මාර්ගඵල ලැබූ දෙවියන්, දිව්‍යාංගනාවන් සුරක්ෂිතයි කියලා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා. මේ උතුම් මොහොතේ දිව්‍යතලවල වැඩසිටින දෙව්වරුන් 'අප ශ්‍රී ලංකා මාතා  නමෝ නමෝ මාතා' කියලා මේ බොදු දේශයට ආශිර්වාද කරන්නේ 'අප සුරක්ෂිතයි, පින්වත්  මනුෂ්‍යය, ඔබත් ශ්‍රී සද්ධර්මය තුළින් සුරක්ෂිත වෙන්න' කියන කාරණය මතක් කරන්නයි. බලන්න ධර්මයේ සුරක්ෂිත භාවයෙන් සිංහනාද කරන දෙව්වරු. ඒ දෙවියන් සිංහනාද කරන්නේ කල්ප විනාශයක් පැමිණියත් අප සුරක්ෂිතයි කියලා. නමුත් මේ උතුම් සද්ධර්මය ජීවමානව පවතින මේ ධර්මද්වීපයේ මනුෂ්‍ය අපි සුනාමියක් එයි, මිසයිලයක් එයි, භූමිකම්පාවක් එයි කියලා හැංගෙන්න බංකර් හදනවා. ශාන්ති කර්ම කරනවා. දේවාල පස්සේ දුවනවා. තවත් සරළව පැහැදිලි කරනවා නම් අපි තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන්, ශීලයෙන්, දානයෙන් දුර්වලයි කියන කාරණයයි.

පින්වත්  ඔබට බියක් සකස්වෙනවා නම් ඔබ කළ යුත්තේ බංකර් තැනීම, යන්ත්‍ර මන්ත්‍ර, ශාන්තිකර්ම කිරීම නොව, සුරක්ෂිතභාවය සඳහා අවශ්‍ය ශ්‍රද්ධාව, ශීලය, දානය කියන බංකර් තුන ශක්තිමත්ව ජීවිතය තුළින් ගොඩනගා ගැනීමය. කල්ප විනාශයකදීවත් එම බංකර් බිඳින්න බැරි බවට ලොව්තුරා බුදුරජාණන් වහන්සේ සහතිකයක් දෙනවා.

# අවසාන අවස්ථාව

අද වෙසක් පුරපසළොස්වක පොහොය දවස. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ සම්මා සම්බුද්ධත්වය අවබෝධකර වසර දෙදහස් හයසියයක් සපිරෙන ප්‍රවෘත්තියක් ඇසෙනවා. භික්ෂුව මේ මොහොතේ වැඩ සිටින්නේ මිනිස් වාසයෙන් දුරස්වූ හුදකලා කුටියක නිසා බාහිර සමාජයේ ක්‍රියාවන් ගැන දන්නෙ නැහැ. අද වැනි දවසක ලොව්තුරා බුදුරජාණන් වහන්සේ සම්මාසම්බුද්ධ ඥාණයෙන් පරිපූර්ණවූ චතුරාර්ය සත්‍යය ධර්මයයි අවබෝධ කොට වදාළේ. එවන් අර්ථවත් දිනයක ධර්මයේ අර්ථය හොඳින් ජීවිතයට ගලපා ගන්න ඕනේ. ධර්මය කියල කියන්නෙ චතුරාර්ය සත්‍ය ධර්මය, පටිච්ඡ සමුප්පාදය, සතර සතිපට්ඨානය, පංචඋපාදානස්කන්ධය, සප්ත බොජ්ජංග ධර්මයන්, භව නිරෝධය උදෙසා පක්ෂ වෙන්නාවූ සත්තිස් බෝධිපාක්ෂික ධර්මයන්මයි. ඔබේ ජීවිතය තුළින් අද දවසේ මේ ධර්මතාවයන් තණ්හා, දිට්ඨි, මාන්නයෙන් තොරව වැඩෙන අවබෝධවන දිශාවට ජීවත්වුනා නම් අද දවසේ පින්වත් ඔබ සැබැවින්ම ලොව්තුරා බුදුරජාණන් සරණගිය කෙනෙක් වෙනවා. මෙම අර්ථවත් මාර්ගයෙන් බාහිරව වෙසක් තොරණ, වෙසක් කූඩු, දන්සැල්, සැරසිලි, නාට්‍ය සංදර්ශන වැනි දේවල් තුළින් ඔබ සැනසුනා නම්, ඒවා වැටෙන්නේ ශාසනයේ නාමයෙන් කෙරෙන සිල්ලර වෙළඳාම් ගණයටම බව කිවයුතුයි. නමුත් මේවා ප්‍රතික්ෂේප කරන්න කාටවත් බැහැ. තමනුත් සතුටුවෙලා අනුන්වත් සතුටුකිරීම තමයි මේවායේ අරමුණ. ජීවිතයටම පන්සලකට ගොස් ශීලයක් සමාදන් නොවූ මනුෂ්‍යයෙක් හදිස්සියේ මැරෙන මොහොතක තමන් නැරඹූවා වූ වෙසක් තොරණක නේක වර්ණ විදුලි බුබුලුවලින් ඒකාලෝක

වූ බුදු සමිඳුන්ගේ රූපය සිහියට නැගිලා, එම පුණ්‍ය සිතුවිල්ල නිසාම සුගතිගාමී ජීවිතයක් ලබන්න පුලුවන්. නමුත් මේවා භවයේ ලබන්නාවූ සිල්ලර සැපයන්මයි. අපට තිබෙන්නේ එකිනෙකට වෙනස් වූ ඉන්ද්‍රිය ධර්මයන්ගේ ස්වභාවයන්. ඒ නිසා අර්ථයෙන් විවිධවූ ක්‍රියාකාරකම් සමාජය තුළ පැවතීම ධර්මතාවයක්මයි. එම ධර්මතාවය ඇලීමෙන්, ගැටීමෙන් තොරව උපේක්ෂාවෙන් යුතුව දකිමින් ධර්මයේ සැබෑ අර්ථය තුළට පැමිණීමට පින්වත් ඔබ දක්ෂ විය යුතුය. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කරනවා මහපොළවෙන් පස් මිටක් අතට අරගෙන, මහ පොළවේ තිබෙන ඉතිරිපස් සමග උපමාකරලා 'මහණෙනි, මියයන සත්ත්වයන්ගෙන් සුගතිගාමී ජීවිත ලබන්නේ මේ අතේ තිබෙන පස්ප්‍රමාණයටයි' කියලා. මහ පොළවේ තිබෙන පස් තරමටම සත්ත්වයා දුගතිගාමී ජීවිතවලට වැටෙන්නේ කියලා. මෙම සම්මා සම්බුද්ධ වචනයට අනුව අපි උත්සාහ ගන්න ඕනේ සමාජය තුළ සිදුවන දෙය අර්ථවත්ද නැතිද යන්න සෙවීමට නොවේ. ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ අතේ තිබෙන පස් මිටෙන් එක් පස් කැටයක් වෙනවාය කියන උත්සහායටයි එන්න ඕනේ.

ලෝකය කියන්නේ හාස්‍යයක්. සත්ත්වයාගේ මෝහය වැඩිවන්න වැඩිවන්න විකට ජවනිකා වැඩිවෙනවා. හාස්‍ය රසය තව තව වැඩිවෙනවා ලෝකය සංකීර්ණයි කියන්නේ, ලෝකය ලස්සනයි කියන්නේ, බලා ඉවරයක් කරන්න බැහැය කියන්නේ ඔබේ සිත මේ සියල්ලටම වඩා වේගවත්ය කියන කාරණයයි. රූපය සැම විටම තිබෙන්නේ රූපයේ ස්වභාවයෙන්. රූපය කෙරෙහි ඇති ඡන්දරාගය නිසාම ඔබමයි රූපයට අනේකවිධ වටිනාකම් දෙන්නේ. ඉහත අර්ථය පින්වත් ඔබට හොඳින් වැටහෙන්න සුදුසු කතා ප්‍රවෘත්තියක් මෙහි සටහන් කරනවා.

භික්ෂුව වැඩසිටි ප්‍රදේශයක එක දායක ගෙදරක වයෝවෘද්ධ අම්මා කෙනෙක් සිටියා. භික්ෂුව මේ නිවසට හත් අට වතාවක්ම පිණ්ඩපාතය සඳහා වැඩම කරලා තියෙනවා. මේ හැම වතාවකම භික්ෂුවට පෙනෙනවා නිවසේ කාමරයක සිට බිත්තිය අල්ලමින්

ඉතා අපහසුවකින් අම්මා කෙනෙක් ඇවිත් පුටුවක වාඩිවෙනවා. ඇයට වයස අවුරුදු අසූ පහක් පමණ ඇති. ටිකක් මහත ශරීරයක් තිබෙනවා. හොඳින් පිරිසිදු වෙලා ඉන්න පාටක් පෙනෙන්නේ නැහැ. තමන්ගේම දරුවා සිටියත් එම අම්මාව අතින් අල්ලලා හාමුදුරුවො වැඩම කිරීමට පෙර පුටුවේ වාඩි කරන්නේවත් නැහැ. එයාම බිත්තිය අල්ලාගෙන එන්නේ. කොටින්ම ඒ අම්මා දැන් එම නිවැසියන්ට එපා වෙලා. අඩුම තරමින් එම නිවැසියන් හාමුදුරුවන්ට පූජා කරන ආහාරයක්වත් එම අම්මාට අත ගස්වන්නේ නැහැ. වයෝවෘද්ධ භාවය නිසාම, ජරා ව්‍යාධි ලක්‍ෂණ නිසාම හැමෝටම එපා වෙලා සිටි මේ අම්මා මිය යනවා. මේ අම්මා මැරුණාට පස්සේ භික්ෂුවක් අරමුණු කොට බලනවා මේ අම්මා කුමන ආකාරයේ නැවත උපතකට ගියාද කියලා. ඒ වෙලාවේ භික්ෂුවට අරමුණු වෙනවා මියගිය අම්මාගේ රූප ස්වභාවයෙන්ම යුත් පාවෙන භූත රූපයක්. වෙනසකට තිබුණේ කොණ්ඩේ කරල් දෙකකට ගොතලා බැඳලා තිබුණා. ළමා වයසේ ගැහැණු දරුවෙකුගේ වගේ. භික්ෂුව ඉදිරියේ ඇය පාවෙනවා. හරස් අතටයි පාවෙන්නේ. මෙය භවයේ තවත් උපතක්. ඇස, කණ, නාසය, දිව, මනස, කය ඇයට තිබෙනවා. අපට වගේම මේ භූත සත්ත්වයාට බාහිර රූප ස්පර්ශය වීමෙන් පංච උපාදානස්කන්ධය සකස් වෙනවා. මිය යන අවස්ථාවේ ශක්තිමත් කුසල් අකුසල් නිමිත්තක් සකස් නොවීම නිසා මෙවැනි භූත ස්වභාවයේ ජාතියක් සකස් වෙන්න පුළුවන්. මෙම භූත ස්වභාවය හරියට නිදාගෙන ඇහැරුන දරුවෙක් වගේ. තද නින්දෙන් අවදිවුණ ගමන් දරුවා පියවි සිහියෙන් නොවේ ඉන්නේ. මුහුණට වතුර ටිකක් ඉස්සාම හොඳින් අවදි වෙනවා. ශක්තිමත් කුසල් අකුසල් චිත්තයක් මිය යන මොහොතේ සකස් නොවූ නිසා භූත ස්වභාවයට පත් මෙම සත්ත්වයාටත් පාංශුකූල පින්කම, සත් දවසේ පින්කම හරියට අඩ නින්දේ පසුවෙන දරුවෙකුට වතුර ටිකක් මුහුණට ඉසීම වැනිය. අසිහියෙන් මියයාම, නින්දේදී මියයාම, ක්ෂණිකව සිදුවන අනතුරු මරණවලදී මෙන්ම ළමා මරණ වලදීද ඉහත ස්වභාවයක් සකස් විය හැකියි. මෙන්න මෙවැනි අයට තමයි පාංශුකූල පින්කම, සත්

දවසේ බණ පිංකම වටින්නේ. මෙවැනි පිනකින් කුසල් අකුසල් නිමිත්තක් ශක්තිමත් කරවලා ඊළඟ උපතට ඇය පැන ගන්නවා.

මෙම මව මියගොස් දින තුනේදී තමයි භික්ෂුවට මෙම මවගේ භූත ස්වභාවයේ උපත සමාධියේදී දර්ශනය වුනේ. ඒ අසරණ මැණියන් වෙනුවෙන් මෙය සටහන් තබන භික්ෂුවද නිරතුරුවම පින් අනුමෝදන් කළා. මරණයේ භූමිදාන කටයුතු අහවරවෙලා දිනකට පසුව ඇයව භික්ෂුවක් සමාධියෙන් අරමුණු කොට බලද්දි භික්ෂුවට දර්ශනය වෙනව කුඩා ගැහැණු දරුවෙක්. ඒ කියන්නෙ ඇය මව් කුසක බිළිදියක් ලෙස උපත ලැබූ බවයි. මෙතැනදී උපත කියල සටහන් කළේ මවගේ ගර්භාශකුටියට බැසගත් බවයි. භික්ෂුව මේ ඔබට පැහැදිලි කරමින් එන්නේ ලෝකය හාස්‍යයක් වෙන්නෙ කොහොමද කියලා. දැන් කවුද මේ මැරුණ වයෝවෘද්ධ අම්මා. වයස අවුරුදු අසූපහක් වන, හැමෝටම එපාවෙලා කරදරයක් වෙලා හිටපු, හරි හැටි පිරිසිදු භාවයක්වත් නොතිබුණ, ශරීරයෙන් තෙල් බෙහෙත් ගඳ හමපු, ජරා ව්‍යාධියට පත්වූ අයෙක්. මේ අම්මා කළාවූ කුසල් අකුසල් හේතුවෙන් සකස්වුන විඤ්ඤාණ ධාතුව මුලින් භූත සත්ත්වයෙක් හැටියට බැසගත්තා. භූත සත්ත්වයා තුළ සකස්වුන සංස්කාර ධර්මයන් හේතුවෙන් සකස්වූ විඤ්ඤාණ ධාතුව ඉන් චුත වී මව්කුසක බිළිදියක්ව බැසගත්තා.

දැන් මේ බිළිදිය බැසගත් මව්කුස හිමි තැනත්තිය දින විසි අටක් ගියාට පස්සෙ දැන ගන්නවා තමන්ගේ කුසේ දරුගැබක් ඇතිවුණාය කියලා. මේ සුබ ආරංචිය දැනගත් මොහොතේම ඇය මේ බව දැනුම් දෙන්නෙ තමන්ගේ සැමියාට. සැමියා එවිට මොකද කරන්නේ. මෙලෝ සිහියක් නොමැතිව බිරිඳව සිපගන්නවා. වාසනාවන්ත දරුපැටියෙක්, සුරතල් දරුපැටියෙක්, ලස්සන දරුපැටියෙක් ඔයා මට දෙන්න කියලා. එදා ඉඳන් භාරහාර වෙනවා, බේබිසූට් මහනවා, කොට්ට හදනවා, ලස්සන සුසිනිඳු ඇතිරිලි, මල් පීස් රෙදිමයි සොයන්නේ. දරුවා නළවන්න තොටිලි ගේනවා, සෙල්ලම් බඩු එකතු කරනවා. වැදගත් රෝහලක දරු ප්‍රසූතිය

කිරීමට සිහින දකිනවා. මේ සියල්ල කරන්නේ කවුරුන් උදෙසාද? දිව්‍යලෝකයෙන් පහළවූ දිව්‍යාංගනාවක් උදෙසාද? නැහැ. මීට මාසයකට පෙර මිය පරලොව ගිය අර වයෝවෘද්ධ ආච්චිගේ සංස්කාර ධර්මයන් හේතුවෙන් සකස්වුන දරුගැබයි මේ බිහි වෙන්න යන්නේ. එදා එම ආච්චිව අතින් අල්ලවා වාඩිකරන්නවත් කෙනෙක් හිටියෙ නැහැ. ඒ තරමටම ඇයව ජරා, ව්‍යාධි නිසාම කොන් කරලා. වර්තමානයේ ඇයව නලවන්න තොටිලි හදනවා. ප්‍රසූත කරන්න වැදගත් රෝහල් සොයනවා. සුසිනිදුම රෙදිපිලි සොයනවා. මේකම නේද ලෝකය කියන්නේ? එහෙම නම් ලෝකය කියන්නෙ හාස්‍යයක් නොවේද? විඤ්ඤාණය නැමති මැජික්කරුවා සංස්කාර ධර්මයන්ගේ ශක්තියෙන් නිපදවන අනේක විධ රූපයන් කෙරෙහි ඡන්ද රාගයෙන් අපිද විඤ්ඤාණයට බැඳී යනවා. මැජික්කරුවෙක් එක මොහොතක පරවියෙක් දෑතට ගෙන සුදු රෙදි කඩකින් එම සතාව වසා, මොහොතකින් රෙදිකඩ ඉවත් කරනවා. එවිට එතන ඉන්නේ ගිරවෙක්. මැජික්කරුවා ගිරවාව රෙදිකඩකින් වසනවා. මොහොතකින් එම රෙදිකඩ ඉවත් කරනවා. එවිට එතන ඉන්නේ හාවෙක්. හාවාව රෙදි කඩකින් වසනවා. මැජික්කරුවා තම මැජික් යෂ්ටියෙන් යමක් කරනවා. දැන් එතන ඉන්නේ බෝනික්කෙක්. මැජික්කරුවා තම මැජික් යෂ්ටිය උපයෝගී කොටගෙන ප්‍රේක්ෂකයා මුලාකොට රිසිසේ රූපයන් මවයිද සංස්කාරධර්මයන් නැමති යෂ්ටිය උපයෝගී කරගෙන විඤ්ඤාණය නැමති මැජික්කරුවාද එකිනෙකට වෙනස් රූප නිපදවයි. රෝහලේ ලෙඩ ඇඳේ දුක්විඳින රෝගීන් ඔබ දැක තිබෙනවාද? නාස් සිදුරුවලට බට දමල. මුඛයට බට දමල. මුත්‍රා මාර්ගයට බටයක් දමල. සේලයින්, රුධිරය දෙනවා. මරණාසන්නව ලෙඩා ඇඳේ වැතිරිලා සිටිනවා. ඥාතීන්ටත් මේ රෝගීන්ව එපාවෙලා. උපස්ථායකයින්ටත් මේ රෝගීන්ව එපා වෙලා. සමහරු මෙවැනි රෝගීන් දිහා බලන්නත් බයයි. ඒත් මේ රෝගියා මැරිලා නැවත මව් කුසක උපතක් ලැබුවොත් මොන සැලකිලිද?... මොනතරම් ආදරයක්ද ඔහු ලෝකයාගෙන් ලබන්නෙ. මේක නේද ලෝකය කියන්නේ. පසුගිය ජීවිතයේදී

තිරිසන් ලෝකේ හරක් කුලයේ ඉපදිලා, අලි කුලයේ ඉපදිලා, කුකුල් කුලයේ ඉපදිලා මේ ජීවිතයේ මනුෂ්‍යයෝ වෙච්ච අය භික්ෂුවකට අරමුණුවෙලා තිබෙනවා. රූපය කෙරෙහි ඇති ඡන්ද රාගය සත්ත්වයාව මොන තරම් හාස්‍යයක් බවට පත්කොට තිබෙනවාද. රූපය කෙරෙහි ඇති ඡන්ද රාගය මේ තරම් සත්ත්වයාව හාස්‍යයට පත්කොට තිබියදීත් අපි තවම වෙසක් දිනයේවත් රූපයට ඇති ඡන්ද රාගයෙන් මිදීමට කැමත්තක් දක්වන්නෙ නැහැ. එදාටත් රූප සොය සොයා යනවා.

තොරණ, වෙසක් කූඩු, සැරසිලි, භක්ති ගීත, නාට්‍ය සංදර්ශන, විදුලි බුබුලු.... මේවා සොය සොයා යන තරමට රැස්වෙන සංස්කාර ධර්මයන් ඔබට භවයේ කැමැති කැමැති රූප උපද්දවලා දෙනවා. වෙසක් දිනයේ රාත්‍රියේ අගනගරය යම් සේ චමත්කාර ජනකද, ඔබටත් භවයේ චමත්කාර ජනක උපත් සකස් කර දෙනවා. පක්ෂීන්ගේ ලෝකය, මාළුන්ගේ ලෝකය මොනතරම් චමත්කාර ජනකද කියලා බලන්නකෝ. විවේකී සිතෙන් මේවා සිතන්න. මේවා තමයි කමටහන්.

මේ ලෝකයේ උපත ලබන සෑම සත්ත්වයෙක්ම ජරා, ව්‍යාධි, මරණ කියන කාරණා තුන දෝතින් දරාගෙනමයි උපත ලබන්නේ. නමුත් රූපය කෙරෙහි ඇති ඡන්ද රාගය නිසා ඔබට මේ යථාර්ථය පෙනෙන්නේ නැහැ. ඉපදුණ අලුත කුඩා බිළිඳකුගේ සුරතල් භාවය, අසරණ භාවය හමුවේ ඇතිවන ආදරය නිසා මේ දරුවාගේ ජීවිතය තුළ ඇති ජරා, ව්‍යාධි, මරණ ලක්ෂණ සැඟවිලයි තියෙන්නේ. නමුත් පින්වත් ඔබ සතියෙන් සිහියෙන් යුතුව මේ පුංචි රූපය දෙස බැලුවොත් එම රූපය තුළ සැඟවී ඇති ජරා, ව්‍යාධි, මරණ කියන කාරණා හඳුනාගන්න පුළුවන්. සතිය, සිහිය නැති තැනදී ඔබ දරුවාට ආදරය කරනවාය කියන්නේ, රැකවරණය දෙනවාය කියන්නේ මේ ජරා, ව්‍යාධි, මරණ ලක්ෂණ වසන් කිරීමට, යටපත් කිරීමට, පරාජය කිරීමට ගන්නා වූ උත්සාහයක්මයි. මේ උත්සාහයේදී අප කවුරුත් තාවකාලිකව දිනුවත් අවසානයේදී පරාජය වන එකමයි සිද්ධවෙන්නේ.

භව නිරෝධය යනු එස්සය අනිත්‍ය වශයෙන් අවබෝධ කර රූපයට ඇති ඇලීමත්, ගැටීමත්, උපේක්ෂාවත් කියන කාරණා තුනෙන්ම නිදහස්වීමය.

අපි මේ පුංචි බිළිඳු රූපයට මොන තරම් ඡන්ද රාගයක් ඇතිකරගෙන තිබෙනවාද කියලා කියනවා නම් සමාජයේ මතයක් ප්‍රකාශ වෙනවා, බිළිඳු දරුවාගේ සිත ප්‍රභාෂ්වරයි කියලා. නොකිලිටියි කියලා. මේ පුංචි රූපයට ඇති තෘෂ්ණාව නිසාමයි මෙවැනි මාර සිත් වැඩිහිටියන් තුළ ඇතිවෙන්නේ. වැඩිහිටියකුගේ සිත යම් සේද කුඩා බිළිදෙකුගේ සිතුවිලිද රාග, ද්වේෂ, මෝහ අකුසල මූලයන්ගෙන් සංසාරික පුරුදු, ඉව ඔස්සේ වැඩිලයි තිබෙන්නෙ. තමා කැමති උපාදානයන් අහිමි වෙනකොට ළදරුවා කියල වෙනසක් නැහැ. ද්වේෂය සකස් වෙනවා. දරුවෙක් නව මාසයක් මව් කුස ගර්භාෂය මගේ කරගෙනයි ජීවත් වෙන්නෙ. අපිට පෙනුනට මේ දරුවා නව මාසයක් අතපය වකුටු කරගෙන මේ ලේ සැරව පිරුණු බැලුම් බෝලයක් වන් අවකාශය තුළ තෙරපෙමින් දුක් විඳිනවා නේද කියලා, ඒ අපි හිතන හැටි. නමුත් මේ ළදරුවා ගර්භාෂය තුළ ජීවත් වෙන්නේ මේක මගේ නිවස, මේක මගේ කාමරය, මේක මගේ තැන කියන උපාදානය සකස් කොටගෙන කැමත්තෙන්මයි. එයාට දුකක් දැනෙන්නෙ නැහැ. අපිට පෙනෙන දුක ළදරුවා සැපක් හැටියටමයි දකින්නෙ. ළදරුවා මව් කුස තෘෂ්ණාවෙන් යුතුව උපාදානය කොට ඇති නිසා තමයි අම්මා කෙනෙක් දරුවා බිහිකරන වෙලාවෙ මහා වේගයකින් කෑමොර දෙමින් ලෝකයාට බිහිවෙන්නෙ. දරුවාගේ විරෝධයයි එයා ප්‍රකාශ කරන්නේ. මගේ තැනින් මාව මුදාගත්තාය කියන විරෝධය. මෙතන තිබෙන්නෙ ද්වේෂයක් වෛරයක් නොවේද? ඒ කියන්නෙ දරුවෙක් ඉපදෙනකොටම ද්වේෂය වෛරය සකස් කරගෙනමයි උපදින්නේ. ඉන් පස්සෙ බලන්න දරුවා අම්මාගේ උණුසුම උපාදානය කොටගන්නවා, තෘෂ්ණාවෙන්ම. දැන් අම්මාගේ උණුසුම, පියයුරු සැපයි කියල මව් කිරට උපාදානය ඇති කරගෙනයි සිටින්නේ. අම්මාගේ තුරුලේ සිටින මේ දරුවා

යමෙක් අතට ගන්න හැදුවොත් මහා වේගයකින් කෑමොර ගහනවා. මුහුණ රතු කර ගන්නවා. මේ පුංචි සිතේ සැඟවී ඇති ද්වේෂය, වෛරය, රාගයමයි මේ හැසිරීම්වලට හේතුව. ඒ නිසාම පුංචි සිත ප්‍රභාෂ්වරයි කියන කාරණය, පුංචි දරුවන්ගේ රූපයන් කෙරෙහි අපේ ඇති ඡන්ද රාගය නිසාම සකස් කොටගත් මෝහ මුලික අදහසක්. එම නිසා කුමන රූපයකට ඔබ බැඳුනත් ඒ බැඳී ඇත්තේ මාරයාටය කියන කාරණයයි අදවන් දිනයක ලොව්තුරා බුදුරජාණන් වහන්සේ අවබෝධකොට ගත්තේ. ධර්ම සාකච්ඡාවක් අතරතුර එක තරුණ මවක් භික්ෂුවගෙන් විමසුවා 'හාමුදුරුවනේ, මට කුඩා දරුවෙක් සිටිනවා. දරුවාගේ කටයුතුත් කරමින්, සැමියාගේ කටයුතුත් කරමින්, ගෙදර දොර කටයුතුත් කරමින් මම කොහොමද මේ ධර්මය තුළ ජීවත්වෙන්නේ කියලා. මේ ප්‍රශ්නය පින්වත් ඔබටත් අදාල ප්‍රශ්නයක් බව ඔබටත් වැටහෙනවා ඇති. භික්ෂුව ඇයට දුන්න පිළිතුර තමයි 'දැන් ඔබ බැඳීම්වලට බැඳිලයි සිටින්නේ. ඒ නිසා බැඳුනු බැඳීම් ගැන දුක් වෙන්න එපා. බැඳුණු බැඳීම් උදෙසා ඔබෙන් වියයුතු යුතුකම් කොටසක් තිබෙනවා නම් එවා නොපිරිහෙලා ඉටු කරන්න. කරන්නාවූ හැම යුතුකමක්ම කුසලයක් සේ දකින්න. බැඳුණාවූ හැම බැඳීමක් කෙරෙහිම ඇලීමෙන් ගැටීමෙන් තොරව උපේක්ෂාවෙන්ම බලන්න. බැඳුනාවූ බැඳීම්වලින් ඔබ ලබන අත්දැකීම් අලුත් බැඳීම් ඇතිකර නොගැනීමට කමටහන් කොට ගන්න. කිරිදරුවෙක් ඇති මවකට වුවද තමා දක්ෂ නම් නිවසේ සිටිමින්ම ගිහි පිංවතුන්ලාට සමාදන් විය හැකි උපරිම ශීලයක් සමාදන් විය හැකි හෙයින් ශීලයට උපරිම වටිනාකමක් දෙමින් කටයුතු කරන්න. තණ්හා, මාන්න, දිට්ඨීන්ගෙන් තොරව ඉහත කාරණා ඉටුකරන ගමන් ඔබට තාවකාලික සැපයක් යැයි දැනෙනා එකම සිතුවිල්ලක් හෝ අවබෝධයෙන් යුතුව අනිත්‍යය දකිමින් අතහැරීමට දිනපතා පුරුදුවන්න. මේ කරුණු කාරණා දිනපතා තෙරුවන් කෙරෙහි ශ්‍රද්ධාවෙන් ඔබේ ජීවිතය තුළින් වැඩෙන විට තවත් නකුල මාතාවක්, විශාකාවක් වීමට අවශ්‍ය ධර්මතාවයනුයි ඔබ තුළින් ක්‍රියාත්මක වෙන්නේ.

අද වැනි වෙසක් පුර පසොළොස්වක දිනයක ලොව්තුරා බුදුරජාණන් වහන්සේ අවබෝධ කොට වදාල චතුරාර්‍ය සත්‍යය ධර්මයේ මුල්ම ආර්ය සත්‍යය වන දුක ඇතිවෙන හේතුව තමයි තෘෂ්ණාව. කුමක් කෙරෙහිද තෘෂ්ණාව සකස්වෙන්නෙ රූපය කෙරෙහි. රූපය කෙරෙහි ඇති කරගන්නා තෘෂ්ණාව නිසාමයි සත්ත්වයා මේසා භව ගමනේ දුකට පත්වෙන්නේ. තෘෂ්ණාවෙන් මිදීමේ මාර්ගයයි ආර්ය අෂ්ඨාංගික මාර්ගය. ඉහත එක්දරු මවට දෙන ලද පිළිතුර තුළ එම චර්යාවන් ජීවිතය තුළින් ක්‍රියාත්මක කළොත් ආර්ය අෂ්ඨාංගික මාර්ගයම ඒ තුළින් ආවරණය වෙනවා. ගිහි ජීවිතයකට මොනතරම් වටිනාකමක්ද ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ ධර්මය තුළින් ලබාදී තිබෙන්නේ.

රූපයන් කෙරෙහි ඡන්ද රාගය ඔබ තුළ වැඩිවෙනකොට බිරිඳ, සැමියා, දරුවන්, සම්පත් කෙරෙහි දැඩි තෘෂ්ණාවක් සකස්වෙන කොට ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනාකොට වදාළ පහත ධර්ම කාරණය සිහියට ගන්න. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේ වඩින පාර හරහා දිවයන කඩිරැලක් පෙන්වලා ආනන්ද ස්වාමින් වහන්සේට දේශනා කරනවා 'ආනන්ද මේ කඩිරැලේ සිටින සෑම කඩියෙක්ම අතීතයේ සක්විතිරජ වෙලා ඉඳල තිබෙනවා' කියලා. තිරිසන් ලෝකයේ කඩියාත් සක්විතිරජ වෙලා ඉඳලා තිබෙනවා නම් පින්වත් ඔබ සංසාරයේ කී වතාවක් නම් සක්විති රජ වෙලා ඉන්න ඇතිද? ඒ සක්විති රාජශ්‍රිය අත්විඳින්න ඇතිද? සක්විති රජ කෙනෙකුට තම පින් බලයෙන්ම පහළවෙන පංච කල්‍යාණයෙන් යුතු ස්ත්‍රී රත්නය, අහසින් ගමන් කරන ඇත් රත්නය, අහසින් ගමන් කරන අජානීය අශ්ව රත්නය, මහපොළවේ ඇති ඕනෑම සම්පතක් එර්ධියකින් දැකිය හැකි පුරෝහිත රත්නය. අන්තඃපුර බිසෝවරුන් හරහා ලැබෙන දහසක් පුතුන්.... මේසා අසිරිමත් වූ සම්පත් පින්වත් ඔබ සංසාරයේදී ලබල තිබෙනවා. මෙලොව ජීවත්වන සෑම කාන්තාවක්ම අතීත සංසාරයේ සක්විති රජවරුන්ගේ පංචකල්‍යාණයෙන් බබලන ස්ත්‍රී රත්නය ලෙස ඒ අසිරිය විඳලා තිබෙනවා. සක්විති රජවරුන්ට දාව අසිරිමත්

පුතුන් ලැබූ මච්වරුන් වෙලා ඉඳලා තිබෙනවා. සෘද්ධිමත් ඇතුන්, අසුන් පිට ගමන් බිමන් ගිහින් තිබෙනවා. අතීතයේ පින්වත් ඔබ ලැබූ මේ අසිරිමත් සම්පත්, රාජශ්‍රීය සමග ගලපා බලනකොට මේ ජීවිතයේදී ඔබ ලබා ඇත්තේ මොන තුට්ටු දෙකේ දෙයක්ද. අතීතයේ සක්විති රජ කෙනෙක් හැටියට පංචකල්‍යාණයෙන් බබලන ස්ත්‍රී රත්නයක් බිරිඳ කරගෙන සිටි ඔබ ඒ අසිරිමත් ස්ත්‍රීරත්නයත් වර්තමානයේ ඔබේ බිරිඳත් සංසන්දනය කොට බලන්න. අතීතයේ සක්විති රජවරුන්ගේ අසිරිමත් ස්ත්‍රී රත්නයක් වූ පින්වත් ඔබ වර්තමානයේ ඔබ බැඳී ජීවත්වන ස්වාමිපුරුෂයා දෙස බලන්න. මොන නොවටිනා දෙයක් කෙරෙහිද ඔබ මේ බැඳී සිටින්නේ. අතීත ජීවිතයේදී සෘර්ධිමත් ඇතුන් පිටින්, සෘර්ධිමත් අජානීය අසුන් පිටින් මහේශාක්‍ය ලීලාවෙන් අහසින් ගමන් ගිය ඔබ මේ ජීවිතයේදී යානාවක් කොට ගත් ඔය යකඩ ගොඩ මොන තුට්ටු දෙකේ දෙයක්ද? අතීතයේ සක්විති රජවරුන් එම රාජ්‍ය ඇමතිවරුන් ලෙස සිටි පින්වත් ඔබ මේ ජීවිතයේදී බලය යැයි අත්විඳින්නේ බියම නේද? බිය සකස් වෙන තැන සකස් වෙන්නේ අකුසල්ම නේද? අතීතයේ ඔබ ලැබූ රාජ්‍යයන් යටත් කරගැනීමට සමත් අසිරිමත් යෝධ බල, යෝධ ශක්තිය ඇති පුතුන් හා සසඳා බලනකොට මේ ජීවිතයේදී ඔබ ලැබූ දරුවන් කවුරුන්ද? අතීතයේ පින්වත් ඔබ ලැබූ සම්පත් සමග සසඳා බැලීමේදී මොන 'නොවටිනා වටිනාකමක්ද' මේ ජීවිතයේ ඔබ ලබා තිබෙන්නේ. පින්වත් ඔබ කැමතිවුනත් අකමැතිවුනත් මෙය තමයි ඔබේ ජීවිතයේ යථාර්ථය. ඒ නිසා ධර්මය කෙරෙහි ශ්‍රද්ධාවෙන් මේ ඇත්ත ගැන සිතන්න. එවිට ඔබට දැනේවි මේ ලෝකයේ දෙවියෙක්, මනුෂ්‍යයෙක් හැටියට විඳින්න යම් සැපයක් සම්පතක් තිබෙනවා නම් ඒ සෑම සම්පතක්ම අතීතයේ ඔබ අත්විඳලා අත්දැකලා තිබෙනවාය කියලා. සියළු සැපයන් අත්වින්දත් පින්වත්ඔබට බැරිවුනා ඒවා කෙරෙහි ඇති තෘෂ්ණාවෙන් මිදෙන්න. සක්විති රජවරයා තිරිසන් ලෝකයේ කඩියෙක් බවට පත්වුනෙත්, ඔබ නැවත සාමාන්‍ය මනුෂ්‍යයෙක් බවට පත්වුනෙත් මේ අසීමිත තෘෂ්ණාව නිසාමයි. පින්වත් ඔබ

මේ තාක් සංසාරයේ ලෝකය තුළ වින්දාවූ අසිරිය හොඳටම ප්‍රමාණවත්. දැන් ලෝකයෙන් මිදෙන මාවතට එන්න බලන්න. ඒ කියන්නේ දුකෙන් මිදෙන්න. පින්වත් ඔබ රූපය කෙරෙහි ඇති තෘෂ්ණාවයි ප්‍රහීන කළයුත්තේ මේ දුකෙන් මිදීමට. එම නිසා පින්වත් ඔබ ස්ත්‍රී, පුරුෂ භේදයකින් තොරව අතීතයේ ඔබ අත්වින්දාවු අසිරිමත් සැපයන්, මහේශාක්‍ය ජීවිත ගැන සිහිපත් කොට මේ ජීවිතයේදී ඔබ බැඳී ඇති රූපයන් සමග අතීත රූපයන් සංසන්දනයකොට මේ ජීවිතයේදී ඔබ ලබා ඇති අවම නොවටිනා සැපයන් සහ බැඳී ඇති රූප කෙරෙහි අවබෝධයෙන් කලකිරීම ඇතිකරගන්න. අවබෝධයෙන් කලකිරීම කියන්නේ ගැටීම නම් නොවේ. ඒක හොඳින් තේරුම් ගන්න ඕනේ. ගැටීම සකස්වෙන තැනදීම ඇලීමත් තිබෙනවා. මොකද තමන් ගැටෙන්නේ යම් දෘෂ්ටියක් කෙරෙහි ඇලීම නිසාමයි. ගිහි ජීවිතය තුළ අවබෝධයෙන් කලකිරෙන තැනැත්තා තමා බැඳී ඇති බැඳීම් කෙරෙහි අවබෝධයෙන් කලකිරෙමින් එම බැඳීම් උදෙසා තමාගෙන් විය යුතු යුතුකම් ඉටුකරමින්, උපේක්ෂාව තුළයි ජීවත්වෙන්නේ. මේ උපේක්ෂාව තුළදී පින්වත් ඔබතුළින් මෙතෙක් නොකළාවු කුසල් සිදුවෙනවා. ඔබ අවබෝධයෙන් කලකිරීමේ නාමයෙන් ගැටීම් සකස්කොට ගතහොත් නොකළාවූ අකුසල් ජීවිතය තුළින් සිදුවේවි. පෙනෙනවා නේද බරපතළ වෙනස්කම් දෙක. නොදැනුවත්භාවය නිසාම සමාජය තුළ අප්‍රමාණ පිරිස් අවබෝධයෙන් කලකිරීම, ගැටීමේ ස්වභාවයක් ලෙසට පත්කොට ගෙන අකුසල් සිදුකර ගන්නවා. මෙවැනි අනුවණකම් නිසා පහසුවෙන් ලැබිය හැකි ධර්මයේ සැබෑ පිලිසරණ අප විසින්ම ඈත් කොට ගන්නවා. මේ අවදානමෙන් පින්වත් ඔබට මිදීමට අවකාශ ලැබෙන්නේ තණ්හා, මාන්න, දිට්ඨීන්ගෙන් තොරව ධර්මය ජීවිතයට ගලපා ගැනීමෙන්මයි.

කුමක් නිසා පින්වත් ඔබ තණ්හාව ඇතිකරගන්නද? මාන්නය ඇතිකරගන්නවාද? දෘෂ්ටීන් ඇතිකරගන්නනද? මේ ඇස නිසා මාන්නය ඇතිකරගන්නවාද? මොකක්ද මේ ඇස කියල කියන්නේ.

ලෙඩවෙන දෙයක්, නරක්වෙන දෙයක්, වයසට යන දෙයක්, සුද එන, කබ, කඳුළු, සැරව එන දෙයක්. අන්ධ වන දෙයක්. ඔය ඇස මනසින් ගලවල අතට ගන්නකො. මස් ගුලියක් විතරමයි. නහරවැල් එල්ලුණ, රුධිරය තැවරුණ, දුගඳ, කුණුවෙන ඇසක් මේක. මෙතැන තිබෙනවාද තණ්හාවක් ඇතිකරගන්න දෙයක්. මෙතන තිබෙනවාද මාන්නය ඇතිකරගන්න දෙයක්. මෙතන තිබෙනවාද දෘෂ්ටියක් ඇති කරගන්න දෙයක්. නැහැ. පින්වත් ඔබගේ ඇස ගැන පමණක් නොවේ අනෙක් සෑම ලොකු, කුඩා, ලස්සන, අවලස්සන මනුෂ්‍යයින්ටත් මෙය ගලපා දකින්න. සතර අපායේ ජීවත්වන සත්ත්වයාගේ ඇසත්, දෙවියාගේ, බ්‍රහ්මයාගේ ඇසත් ඉහත ස්වභාවයේම බව දකින්න. ඇස කෙරෙහි අවබෝධයෙන් කලකිරෙන්න.

දැන් පින්වත් ඔබ කන දෙස බලන්න. මොකක්ද මේ කන කියල කියන්නේ ලෙඩවෙන දෙයක්, නරක් වෙන දෙයක්, වයසට යන දෙයක්, කලාඳුරු බැඳෙනවා, සැරව පිරෙනවා, මස්දළු එනව, බිහිරි භාවයට පත්වෙනවා. ඔය කණ ගලවල අතට ගන්නකො. මස් ගොබයක් විතරයි. රුධිරය, නහරවැල් තැවරුණ කුණුවෙන දෙයක්, කන තුළ තිබෙනවාද තණ්හාවක්, මාන්නයක්, දිට්ඨියක් ඇති කරගන්න දෙයක්. නැහැ. පුංචි කාලේ සුසිනිඳු සුරතල් භාවයෙන් පැවති කන්පෙති වයෝවෘද්ධ වෙනකොට ගොරෝසු කුල්ලක් බවට පත්වෙලා. ජරා, ව්‍යාධි, මරණ කියන හිමිකරු මේවා අයිති කරගෙන.

පින්වත් ඔබ නාසය දෙස බලන්න. නාසය ලෙඩවෙන දෙයක්, වයසට යන, මැරෙන දෙයක්, නාස් කුහර දෙක තුළ රෝම කූප පිරිල, සොටු මස් දළු, සෙම, ලේ පීනස, දිය පීනස නාසයේ කොටස් කරුවන්. සෙම්ප්‍රතික්ෂාව හැදෙන කොට, පීනස හැදෙන කොට නාසය ප්‍රතික්‍රියා දක්වන්නෙ මොන තරම් කුරිරු ආකාරයටද? ඔය නාසය මනසින් ගලවල අතට ගන්නකෝ. සිදුරු දෙකක් සහිත මස් ගොබයක් පමණමයි. මස අයිති කුණුවීමටයි. නිල මැස්සන්ටයි. දැන් ඔබ හිතන්න නාසය නිසා තණ්හාව, මාන්නය, දිට්ඨිය ඇතිකරගන්න හේතුවක් තිබෙනවාද? නැහැ.

පින්වත් ඔබ දිව දෙස බලන්න. දිව ලෙඩවෙන, වයසට යන, මැරෙන දෙයක්. දිවේ මැලියම් බැඳෙනවා. කුණුකෙළ බැඳෙනවා. ගෙඩි, බිබිලි එනවා, එක උදයක කට නොමැද්දොත් දිවේ දුගඳ ඔබට දැනිලා ඇති. මේ දිව මනසින් ගලවල අතට ගන්නකෝ. රුධිරය තැවරුණ, නහරවැල් තැවරුණ, මස් ගොබයක් පමණක්මයි. මේ කුණුවෙන මස් ගොබයත් හරකෙක්, එළුවෙක්, ඌරෙක්ගේ දිව නැමැති මස් ගොබයත් අතර වෙනසක් තිබෙනවාද? නැහැ. එකම ස්වභාවයමයි. වයෝවෘද්ධ භාවයට පත්වෙන කොට ඔය දිවට දැනෙන රසය නොදැනී යනවා. ඔබ ජීවත්ව සිටියදීම දිව මැරෙනවා. මෙවන් දිවක් කෙරෙහි තණ්හාව, මාන්නය, දිට්ඨිය කුමක් සඳහා ඇති කරගන්නද?

පින්වත් ඔබේ මනස දෙස බලන්න. වරෙක රාග, ද්වේෂ, මෝහ කියන සිතුවිලිවලින් පිරිලා. තවත් විටෙක අලෝභ, අද්වේශ, අමෝහ සිතුවිලිවලින් පිරිලා. හරියටම සුළඟ වගේ. ඇතිවෙන ඇලීම් ගැටීම් හේතුවෙන් මොහොතින් මොහොත කුසල් අකුසල් සිත් වෙනස් වෙනව. සුගතිගාමී කුසල්, අපායගාමී අකුසල් සකස් කොට දෙනවා. වරෙක ඔබව සතුටු කරවනවා. තවත් වරෙක ඔබව හඬවනවා. දුක සැප මුසු සංඥාවන් වේදනාවන් නිරතුරුවම සකස් කොට දෙනවා. ඔබ වයෝවෘද්ධ භාවයට පත්වෙන කොට මනසේ තැන්පත්ව ඇති ධර්ම රූප මැකී යනවා. ඒ කියන්නේ මතකය මැරෙනවා. මෙවන් මනසක් නිසා තණ්හාව, මාන්නය, දිට්ඨිය ඇතිකරගෙන ඇති ඵලය මොකක්ද?

දැන් පින්වත් ඔබ කය දෙස බලන්න. මේක ලෙඩවෙන, වයසට යන, මැරෙණ කයක්. ආහාරයෙන්, ජලයෙන්, ඖෂධවලින් යැපෙන කයක්. ආශ්වාසයෙන්, ප්‍රාශ්වාසයෙන් රැකෙන කයක්. කබ, කඳුළු, දහඩිය, සෙම්, සොටු, අසූචි, මුත්‍රා, නිරතුරුවම පිටකරන කයක්. පිරිසිඳු නොකළොත් ගඳ ගහන කුණුවෙන, පණුවො ගසන කයක්. මෙතන ආඩම්බර වෙන්න දෙයක් තිබෙනවාද? මම කියල තණ්හාව, මාන්නය, දිට්ඨියක් ඇතිකරගන්න දෙයක් තිබෙනවාද? නැහැ.

දැන් පින්වත් ඔබ ආයතන හැටියට ඇස, කන, නාසය, දිව, මනස, කය ගැන බැලුවා. මේවායේ ගත යුතු කිසිම දෙයක් තිබුණේ නැහැ. තිබුණේ ජරා, ව්‍යාධි, මරණමයි. මීළඟට ඔබ සතර මහා ධාතූන් හැටියට මේ ශරීරය අරගෙන බලන්න. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ සතර සතිපට්ඨාන සූත්‍රයේදී දේශනා කරනවා ගව ඝාතකයෙක් එළදෙනෙක් මස් කරල හතරමං හංදියක එම එළදෙනව මස්, බොකු, කටු, සම් වශයෙන් වෙන් කොට තබා විකුණනවා වාගේ පින්වත් ඔබේ ශරීරයත් පඨවි. ආපෝ. තේජෝ. වායෝ වශයෙන් වෙන් වෙන් වශයෙන් කොටස් කර බලන්න කියල. ඔබේ ශරීරයේ තද ස්වභාවයෙන් තිබෙන මස්. බොකු. බඩවැල් ආදිය වෙනමත්, ශරීරය තුළ දියර ස්වභාවයෙන් තිබෙන සෙම්, සොටු, රුධිරය, මුත්‍ර, මේදය ආදිය වෙනමත් ශරීරයේ පඨවි, අපෝ, වායෝ ධාතූන් සමග මුසුවී පවතින තේජෝ ස්වභාවයත් ශරීර අභ්‍යන්තරය පුරා තිබෙන වායෝ ස්වභාවයත් වෙන් වශයෙන් අරගෙන බලන්න. පින්වත් ඔබ ඔබේ ශරීරය නිර්මාණය වී තිබෙන සතර මහා ධාතූන් ගැන කොතෙක් බැලුවත් එතන තියෙන්නේ මසට අයත්, මස විනිවිද ගිය, ගඳ ගහන, කුණුවෙන, පණුවො ගහන දෙයක්මයි. මේ සතර මහ ධාතූන් නිසා තණ්හාව, මාන්නය, දිට්ඨිය ඇතිකර ගැනීමේ තේරුමක් තිබෙනවාද? නැහැ. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ මේ ශරීරය කොටස් තිස් දෙකකට වෙන් කරල පෙන්වලා තිබෙනවා. දෙතිස් කුණුපයන් හැටියට. කෙස්, ලොම්, නිය, දත්, සම්, මස්, නහර.... ආදී වශයෙන්. මේ එකින් එක වෙන් වශයෙන් අරගෙන බලන්න. මේ ශරීරය කොටස් තිස් දෙකකට වෙන් කරල අවයව හැටියට බලන්න. මේ කොටස් තිස්දෙක තුළම තිබෙන්නේ ජරා, ව්‍යාධි, මරණම නේද? ඒ කියන්නේ කුණුවීම, ගඳ ගැසීම, විනාශවීම පමණක්ම නේද? මේ එකකවත් තිබෙනවාද මම කියල තණ්හාව, මාන්නය, දිට්ඨිය ඇතිකරගන්න හේතුවක්. නැහැ.

ආයතන හැටියට බැලුවත්, සතර මහා ධාතූන් හැටියට බැලුවත්, දෙතිස් කුණුපයන් හැටියට බැලුවත් මෙතන තිබෙන්නේ පින්වත්

ඔබ මගේ කරගෙන ජීවත්වන අනිත්‍ය, දුක්ඛ, අනාත්ම භාවයට අයත් දෙයක්ම නේද? යමක් අනිත්‍යය නම්, යමක් දුක නම්, යමක් අනාත්ම නම් එම දෙය පින්වත් ඔබ නිත්‍යයි, සැපයි, ආත්මයි කියල ගත හොත් එතන සකස් විය යුත්තේ දුකම නේද? ඇස සැපයි කියල ගතහොත්, ඇස නිත්‍යයි කියල ගත හොත්, ඇස තුළ ආත්මයක් තිබේ කියල ගත හොත් ඔබ ලුහුබඳින්නේ නැති දෙයක් පසුපස නේද? සතර මහා ධාතුවත්, දෙතිස් කුණපයත් නිත්‍යයි, සැපයි, ආත්මයි කියල ඔබ ගතහොත් එය මුලාවක්ම නේද? අවිද්‍යාව නිසාම සකස් වූ සක්කාය දිට්ඨිය නිසාම අනිත්‍යය, දුක්ඛ, අනාත්ම භාවයට පත්වන මේ ඔබේ රූපය ඔබගේ ශරීරය නිත්‍ය, සැප, ආත්ම භාවයෙන් ගැනීම නිසා නේද දුක සකස් වෙන්නේ. ඒ නිසා පින්වතුනි අදවන් උතුම් වෙසක් පුරපසොළොස්වක පොහොය දිනක ලොව්තුරා බුදුරජාණන් වහන්සේ අවබෝධකොට වදාළ චතුරාර්‍ය සත්‍ය ධර්මයන්ගේ මුල්ම ආර්ය සත්‍යය වන දුක්ඛ සත්‍යය පින්වත් ඔබ තුළින්ම දකින්න පුළුවන් නේද? සතර මහ ධාතුවෙන් සැදුන, ආහාරයෙන් යැපෙන, ආශ්වාස ප්‍රාශ්වාසයෙන් රැකෙන රූපය කෙරෙහි ඇතිකර ගන්නා තෘෂ්ණාව නිසාම නේද මේ දුක සකස් වෙන්නේ. රහතන් වහන්සේ නමකට දුක නැහැ නේද? නමුත් රහතන් වහන්සේටත් ඇසක් තිබෙනවා. එම ඇසෙන් රූප දකිනවා. රහතන් වහන්සේටත් කනක් තිබෙනවා. එම කනෙන් ශබ්ද ඇසෙනවා. අනෙක් ආයතනත් එසේමයි. නමුත් රහතන් වහන්සේට දුකක් සකස් වෙන්නේ නැහැ. රහතන් වහන්සේගේ අධ්‍යාත්මික රූපයත්, බාහිර රූපයත්, විඤ්ඤාණයත්, පස්සය වන මොහොතේදීම රහතන් වහන්සේ පස්සය අනිත්‍ය වශයෙන් දකිනවා. ඒ දැකීමේ ශක්තිය රහතන් වහන්සේට තිබෙන්නේ රහතන් වහන්සේ භව නිරෝධය සාක්ෂාත් කරගන්නා මොහොතේ උතුම්වූ සමාධි තලයකදී රූපයේ අනිත්‍යභාවය ඥානදර්ශන තුළින් අවබෝධත්වයට පත්වී ඇති නිසා. රහතන් වහන්සේ එස්සය අනිත්‍ය වශයෙන් දකින නිසා විඳීමක් සකස් වෙන්නෙ නැහැ. විඳීමක් සකස් නොවන තැනක හඳුනා ගැනීමක්,

චේතනාවක්, බැසගැනීමට විඤ්ඤාණයක් සකස් වෙන්නෙ නැහැ. හුදු දුක්කාය, ඇසුණාය කියන කාරණය පමණයි. නමුත් පින්වත් ඔබ එස්සය නිත්‍ය භාවයෙන් ගැනීම නිසා රූපය කෙරෙහි ඇලීම්, ගැටීම්, උපේක්ෂාවන් සකස් කරගන්නවා. එහෙම නම් පිංවතුනි දුකත්, දුකට හේතුව වන තෘෂ්ණාවත් ඔබ තුළින්ම නේද සකස් වෙන්නේ. තෘෂ්ණාවත්, දුකත් ඔබ තුළින්ම නම් සකස් වෙන්නේ තෘෂ්ණාව නැතිකර ගත යුත්තේත් ඔබම නේද? තෘෂ්ණාව නැති කිරීමේ මාර්ගය වන ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ ගමන් කළ යුත්තේත් ඔබම නේද? එහෙමනම් පින්වතුනි චතුරාර්ය සත්‍යයේ මේ ආර්ය සත්‍යයන් හතරම ඔබ තුළින්ම නේද අවබෝධ කරගත යුත්තේ. මේ භව නිරෝධය සාක්ෂාත් කොට දෙන චතුරාර්ය සත්‍යය ධර්මයන් සියල්ලම ඔබ තුළින්ම නේද දැකිය යුත්තේ? දෙවියෙක්, බ්‍රහ්මයෙක් දෙන දෙයක් නොවේ නේද? මෛත්‍රී බෝධිසත්වයන් දෙන දෙයක් නොවේ නේද? ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ ධර්ම මාර්ගයම ජීවිතයට සතියෙන් සිහියෙන් යුතුව එකතු කරගත හොත් ඔබ ධර්මයේ කොටස් කරුවෙක් වෙනවා නේද? බලන්න ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළ උතුම් ධර්මය මොන තරම් සරලභාවයට පත්කර, තමා තුළින්ම ධර්මය දැකීමට ධර්මය අවබෝධකර ගැනීමට හැකි ආකාරයට දේශනා කොට තිබෙනවාද. ගිහි පින්වතුන්ට තමා තුළින්ම ධර්මය අවබෝධකර ගැනීමට. ඒ කියන්නෙ සතර අපායෙන් මිදීමට අවශ්‍ය කාරණා බුදුරජාණන් වහන්සේ දේශනාකර තිබියදී පින්වත් ඔබ මොනතරම් නම් තැන් තැන්වල රස්තියාදු වෙනවාද? ධර්මයේ වරද නොවේ, ධර්මය ගලපා ගැනීමේ වරදයි. සිඳිය යුතු සක්කාය දිට්ඨිය වැඩෙනවා නම්, එතැන වැඩෙන්නේ අධර්මයයි. දුක දැකීමෙන්, දුක හඳුනා ගැනීමෙන්, සැප සෙවීම නොවේ, ඔබ කළ යුත්තේ. දුක, සැප දෙකම අනිත්‍යභාවයට පත්වන ධර්මතාවයන් බව අවබෝධ කරගැනීමයි.

ඡන්ද රාගයෙන් මගේ කරගත් රූපයන් නිසා මහමෙරක් වන් දුකක් ජීවිතය තුළින් දරාගෙන සිටින පින්වත් ඔබ එම බරෙන්

නිදහස්වීමට පින්වත් ඔබ තුළින්ම ඇතිකර ගත යුත්තේ එකම එක කාරණයකි. ඒ රූපයන් කෙරෙහි ඇති තෘෂ්ණාවෙන් මිදීම පමණක්මය. මේ උතුම් ධර්මය පින්වත් ඔබ ජීවත්වන පින්බිමේ මහා සංඝරත්නය වෙතින් නිරතුරුවම ඔබට ඇසේ.

උතුම් වූ උපසම්පදා ශීලය දිවිහිමියෙන් ආරක්‍ෂා කරගන්නා ගෞරවනීය ස්වාමීන් වහන්සේලා ජීවත්ව සිටින තාක් කල් ශාසනය ජීවමානව පවතී. ශාසනය ජීවමානව පවතින තුරාවට ධර්මයේ සංදිට්ඨික වූද අකාලික වූද ගුණයන් පින්වත් ඔබට ඔබගේම ජීවිතය තුළින් අත්දකින්න උතුම් අවස්ථාවක් තිබෙනවා. පින්වත් ඔබ උත්සාහ ගත යුත්තේ එම කෙටි කාලයෙන් උපරිම ප්‍රයෝජනය ඔබේ ජීවිතයට ලබාගැනීමටයි. පින්වත් ඔබ නිවසේදීද, කාර්යාලයේදීද විවේකීව සිටින සෑම මොහොතකම සතියෙන් සිහියෙන් යුතුව ඔබගේ ඇස දෙස බලන්න. ඇසට පෙනෙන රූප දෙස බලන්න. ඇසත් රූපත් අනිත්‍යයි නේද? ඇසෙත්, ඇසින් දකින රූපවලත් නිත්‍යභාවයක් නැහැ නේද? ඒ අනිත්‍යය මෙනෙහි කරන්න. ඇසටත් රූපයටත් තිබෙන ඡන්ද රාගයෙන් මිදෙන දිශාවටම අවබෝධය ලබන්න. පින්වත් ඔබ කණ දෙස බලන්න. කනට ඇසෙන ශබ්දයන් හොඳින් අසන්න. මේ සෑම ශබ්දයක්ම හටගන්නේ රූපයකින් නේද? කනත් ශබ්දයත් අනිත්‍යයි නේද? කනත් කනට ඇසෙන ශබ්දයෙත් නිත්‍යභාවයක් නැහැ නේද? ඒ අනිත්‍යය මෙනෙහි කරන්න. කනටත්, ශබ්දයටත් තිබෙන ඡන්ද රාගයෙන් මිදෙන දිශාවට අවබෝධය ලබන්න.

පින්වත් ඔබ නාසය දෙස බලන්න. නාසයට දැනෙන ගඳ සුවඳ ගැන හොඳින් මෙනෙහි කරන්න. මේ සෑම ගඳ සුවඳක්ම ඇතිවන්නේ රූපයකින් නේද? මේ සෑම ගඳ සුවඳක්ම අනිත්‍යයි නේද? නාසයේත් ගඳ සුවඳේත් නිත්‍යභාවයක් නැහැ නේද? ඒ අනිත්‍යය මෙනෙහි කරන්න. නාසයටත් ගඳ සුවඳටත් ඇති ඡන්ද රාගයෙන් මිදෙන දිශාවට අවබෝධය ලබන්න.

පින්වත් ඔබ ඔබේ දිව දෙස බලන්න. දිවට දැනෙන රසයන් ගැන දකින්න. මේ සෑම රසයක්ම ඇතිවන්නේ රූපයක් නිසාම නේද? මේ සෑම රසයක්ම අනිත්‍යයි නේද? දිවත්, දිවට දැනෙන රසයේත් නිත්‍යභාවයක් නැහැ නේද? ඒ අනිත්‍යය මෙනෙහි කරන්න. දිවටත් රසයටත් ඇති ඡන්ද රාගයෙන් මිදෙන දිශාවටම අවබෝධය ලබාගන්න.

පින්වත් ඔබ මනස ගැන දකින්න. මනසේ ඇතිවන සිතිවිලි දෙස බලන්න. මේ සෑම සිතිවිල්ලක්ම ඇතිවුනේ රූපයක් නිසා නේද? මේ ඇතිවුනා වූ සෑම සිතිවිල්ලක්ම අනිත්‍යයි නේද? මනසත් මනසේ ඇතිවන සිතිවිලිත් නිත්‍ය භාවයක් නැහැ නේද? මේ අනිත්‍යය මෙනෙහි කරන්න. මනසටත්, ධර්ම රූපයන්ටත් ඇති ඡන්ද රාගයෙන් මිදෙන දිශාවටම අවබෝධය ලබන්න.

පින්වත් ඔබ කය ගැන දකින්න. කයට දැනෙන පහස දෙස බලන්න. කයට දැනුනාවූ සෑම පහසක්ම ඇතිවුනේ රූපයක් නිසා නේද? මේ ඇතිවුනාවූ සෑම පහසක්ම අනිත්‍යයි නේද? කයත්, කයට දැනෙන පහසත් නිත්‍ය භාවයෙන් නැහැ නේද? මේ අනිත්‍යය මෙනෙහි කරන්න. කයටත් කයට දැනෙන පහසටත් ඇති ඡන්ද රාගයෙන් මිදෙන දිශාවටම අවබෝධය ලබන්න.

මුලින්ම ඔබගේ ඇස, කන, නාසය, දිව, මනස, කය ගැන අනිත්‍යය දකිනවා වගේම ක්‍රමයෙන් ඔබ කැමති, අකැමැති ස්ත්‍රී පුරුෂ රූපයන්ගේද ඉහත ආකාරයෙන්ම අනිත්‍ය ස්වභාවය දකින්න. පින්වත් ඔබගේ විවේක කාලය දුකට හේතුවන, ඔබ කැමැති අකැමැති රූපයන් කෙරෙහි තෘෂ්ණාව වැඩෙන දිශාවට නොව, පින්වත් ඔබගේ විවේකය නිවීමේ මඟට ශක්තියක් වන තෘෂ්ණාව සිඳෙන දිශාවට යොමුකරන්න. පින්වත් ඔබ මුළින්ම රූපයන් කෙරෙහි ඇලීමේ ගැටීමේ ස්වභාවයෙන් මිදෙමින් උපේක්ෂාවෙන් රූපය දැකීමට පුහුණුවන්න. දැන්ම උපේක්ෂාවද අතහැරීමට ඉක්මන් නොවන්න. කලබලකාරී බවද, වේගවත් බවද එම සිතිවිලිවල අනිත්‍යභාවය දකිමින් උපේක්ෂාව තුළට

ගන්න. යෝගාවචරයෙක් වීමට පෙර ඔබ මුලින්ම යහපත්, සුන්දර පෞරුෂයකින් යුත් මනුෂ්‍යයෙක් වන්න. යුතුකම් දන්න, යුතුකම් ඉටුකරන ගිහි පින්වතෙක් වන්න. පින්වත් ඔබේ ජීවිතය කුසල් ධර්මයන්ගෙන් පුරවාගන්න. මේ කුසල්, භව නිරෝධය සඳහාම යැයි චේතනාවන් සකස්කර ගන්න. පින්වත් ඔබ ධර්මය අවබෝධකර ගනිමින් පෙරට යන්නේ පින්වත් ඔබ තුළම සකස්වන්නා වූ අධර්මය 'කෙලෙස්' පරාජය කරමින් බව හොඳින් මතකයේ තබාගන්න. ඒ නිසා පින්වත් ඔබ ඔබට අවංකවෙන්න. ඔබ ඔබට වංක වී ඔබ කොතෙක් ලෝකයට අවංක වීමට ගියත් අර්ථයක් නොමැති බව වටහා ගන්න. **මෝහයේ කෙටි සැපයත්, අවබෝධයේ නිදහසත් අතර ඇති අයෝමය වෙනස සතියෙන් සිහියෙන් යුතුව නිරතුරුවම මෙනෙහි කිරීමට පුරුදුවෙන්න.** වසර 2600 සම්මා සම්බුද්ධ ජයන්තිය උත්සව ශ්‍රීයෙන් අද වෙසක් දිනයේ සමරන ඔබ, වසර දෙදහස් හයසියවැනි සම්මා සම්බුද්ධ ජයන්තියක් අනාගතයේදී නැවත සැමරන වාරයක් පැමිණියදාට.... එදාට පින්වත් ඔබ කුමන ලෝකයක, කුමන සත්වයෙක් ලෙස උපත ලබා සිටිය හැකිදැයි මෙනෙහි කරන්න. පෙර බුද්ධශාසනයේ 2600 වැනි සම්මා සම්බුද්ධ ජයන්තිය මහත් උත්සව ශ්‍රීයෙන් සැමරූ උදවිය වර්තමානයේ ලක්‍ෂ කීයක් සතර අපායේ දුක්විඳිනවා ඇතිද? ඒ නිසා පින්වත් ඔබ ධර්මය අර්ථය තුළට එන්න. අදවන් උතුම් වෙසක් දිනයේ විදුලි බුබුලු, චිත්‍ර බකට්, වෙසක් කූඩු බලනවා වගේම දුකට හේතුවන තෘෂ්ණාව දෙසත් බලන්න. එයමයි දුකේ අර්ථය. දුකින් මිදීමේ අර්ථය ධර්මයයි. ධර්මය යනු අනිත්‍යයි. මුළින් පින්වත් ඔබ රූපයේ අනිත්‍යභාවය ගැන බැලුවා වගේම රූපය ඇසුරින් සකස් වෙන්නා වූ පංච උපාදනස්කන්ධයේ අනිත්‍ය භාවය දෙසත් බැලිය යුතුයි. අධ්‍යාත්මික රූපයත්, බාහිර රූපයත්, විඥානයත් කියන කාරණා තුන එකතුවන තැන සකස්වන ඵස්ස, වේදනා, සංඥා, සංඛාර, විඥාන කියන ධර්මතාවයන්ගේ අනිත්‍යභාවයන් එදිනෙදා ජීවිතයේ කටයුතු කරන ගමන් ඔබට ලැබෙන විවේක අවස්ථාවන්හීදී බොහොම පහසුවෙන් වඩන්න පුළුවන්. පින්වත්

ගිහි පිංවතුන්ලාට සරල ආකාරයෙන් පංච උපාදානස්කන්ධයේ අනිත්‍යභාවය දැකීමට, ඒ පිළිබඳ මූලික දැනුම ලබාගැනීමට පහත ආකාරයට ඔබ මෙනෙහි කරන්න.

**ඇස අනිත්‍යයි, රූපය අනිත්‍යයි**

ඇස නිසා හටගත්තාවූ යම් ඵස්සයක් වේද එය අනිත්‍යයි
ඇස නිසා හටගත්තාවූ යම් විඳීමක් වේද එය අනිත්‍යයි
ඇස නිසා හටගත්තාවූ යම් හඳුනාගැනීමක් වේද එය අනිත්‍යයි
ඇස නිසා හටගත්තාවූ යම් චේතනාවක් වේද එය අනිත්‍යයි
ඇස නිසා හටගත්තා වූ යම් විඥානයක් වේද එය අනිත්‍යයි
ඇස අනිත්‍යයි, රූපය අනිත්‍යයි
ඇසත් රූපයත් විඥානයත් ඵස්සයෙන් හටගන්නා වූ
පංච උපාදානස්කන්ධයම අනිත්‍යයි
නාම රූප ධර්මයෝ අනිත්‍යයි

**කන අනිත්‍යයි, ශබ්දය අනිත්‍යයි**

කන නිසා හටගත්තාවූ යම් ඵස්සයක් වේද එය අනිත්‍යයි
කන නිසා හටගත්තාවූ යම් විඳීමක් වේද එය අනිත්‍යයි
කන නිසා හටගත්තාවූ යම් හඳුනාගැනීමක් වේද එය අනිත්‍යයි
කන නිසා හටගත්තාවූ යම් චේතනාවක් වේද එය අනිත්‍යයි
කන නිසා හටගත්තා වූ යම් විඥානයක් වේද එය අනිත්‍යයි
කන අනිත්‍යයි, ශබ්දය අනිත්‍යයි
කනත් ශබ්දයත් විඥානයත් ඵස්සයෙන් හටගන්නා වූ
පංච උපාදානස්කන්ධයම අනිත්‍යයි
නාම රූප ධර්මයෝ අනිත්‍යයි

**නාසය අනිත්‍යයි, ගඳ සුවඳ අනිත්‍යයි**

නාසය නිසා හටගත්තාවූ යම් ඵස්සයක් වේද එය අනිත්‍යයි
නාසය නිසා හටගත්තාවූ යම් විඳීමක් වේද එය අනිත්‍යයි

නාසය නිසා හටගත්තාවූ යම් හඳුනාගැනීමක් වේද එය අනිත්‍යයි
නාසය නිසා හටගත්තාවූ යම් චේතනාවක් වේද එය අනිත්‍යයි
නාසය නිසා හටගත්තා වූ යම් විඥානයක් වේද එය අනිත්‍යයි
නාසය අනිත්‍යයි, ගඳ සුවඳ අනිත්‍යයි
නාසයත් ගඳ සුවඳත් විඥානයත් ඵස්සයෙන් හටගන්නා වූ
පංච උපාදානස්කන්ධයම අනිත්‍යයි
නාම රූප ධර්මයෝ අනිත්‍යයි

**දිව අනිත්‍යයි, රසය අනිත්‍යයි**

දිව නිසා හටගත්තාවූ යම් ඵස්සයක් වේද එය අනිත්‍යයි
දිව නිසා හටගත්තාවූ යම් විඳීමක් වේද එය අනිත්‍යයි
දිව නිසා හටගත්තාවූ යම් හඳුනාගැනීමක් වේද එය අනිත්‍යයි
දිව නිසා හටගත්තාවූ යම් චේතනාවක් වේද එය අනිත්‍යයි
දිව නිසා හටගත්තා වූ යම් විඥානයක් වේද එය අනිත්‍යයි
දිව අනිත්‍යයි, රසය අනිත්‍යයි
දිවත්, රසයත්, විඥානයත් ඵස්සයෙන් හටගන්නා වූ
පංච උපාදානස්කන්ධයම අනිත්‍යයි
නාම රූප ධර්මයෝ අනිත්‍යයි

**මනස අනිත්‍යයි, සිතිවිලි අනිත්‍යයි**

මනස නිසා හටගත්තාවූ යම් ඵස්සයක් වේද එය අනිත්‍යයි
මනස නිසා හටගත්තාවූ යම් විඳීමක් වේද එය අනිත්‍යයි
මනස නිසා හටගත්තාවූ යම් හඳුනාගැනීමක් වේද එය අනිත්‍යයි
මනස නිසා හටගත්තාවූ යම් චේතනාවක් වේද එය අනිත්‍යයි
මනස නිසා හටගත්තා වූ යම් විඥානයක් වේද එය අනිත්‍යයි
මනස අනිත්‍යයි, සිතිවිලි අනිත්‍යයි
මනසත් සිතිවිලිත් විඥානයත් ඵස්සයෙන් හටගන්නා වූ
පංච උපාදානස්කන්ධයම අනිත්‍යයි
නාම රූප ධර්මයෝ අනිත්‍යයි

**කය අනිත්‍යයි, පහස අනිත්‍යයි**
කය නිසා හටගත්තාවූ යම් ඵස්සයක් වේද එය අනිත්‍යයි
කය නිසා හටගත්තාවූ යම් විඳීමක් වේද එය අනිත්‍යයි

කය නිසා හටගත්තාවූ යම් හඳුනාගැනීමක් වේද එය අනිත්‍යයි
කය නිසා හටගත්තාවූ යම් චේතනාවක් වේද එය අනිත්‍යයි
කය නිසා හටගත්තා වූ යම් විඥානයක් වේද එය අනිත්‍යයි
කය අනිත්‍යයි, පහස අනිත්‍යයි
කයත් පහසත් විඥාණයත් ඵස්සයෙන් හටගන්නා වූ
පංච උපාදානස්කන්ධයම අනිත්‍යයි
නාම රූප ධර්මයෝ අනිත්‍යයි

පංච උපාදානස්කන්ධයමයි ලෝකය කියන්නේ. අතීතයේ, වර්තමානයේ දක්කාවූ රූපයන් ගලපමින් එම රූපයන් ඇසුරින් සකස්වුන නිරතුරුවම අනිත්‍ය භාවයට පත්වුන ඉහත ධර්මතාවයන් මනසින් දකින්න, මෙනෙහි කරන්න, සජ්ජායනා කරන්න, මුමුණන්න.

මේ කුමක් කළත් පින්වත් ඔබ ධර්මරත්නය කෙරෙහි ගෞරවයෙන් නම් එය කරන්නේ එය ඔබේ මෙලොව පරලොව යහපත පිණිසම හේතුවේවි. පින්වත් ඔබට භාවනාවක් ලෙස මෙම ධර්මය වැඩීමට අවකාශය අඩුනම් ඔබ ගීයක්, කවියක්, මුමුණනවා වෙනුවට අර්ථය දකිමින් ගෞරවයෙන් ඉහත ධර්මය හඬ නගා කීවද එය ඔබට යහපතක් පිණිසමයි හේතුවෙන්නේ. මේ ලෝක ධාතුව තුළ ඇති පරම සත්‍යයයි, ඔබ හඬ නගා කියන්නේ කියලා දෙවියන් ඔබට සාධුකාර දේවී. පින්වත් ඔබ අනිත්‍යයි, අනිත්‍යයි කියලා මෙනෙහි කරන වාරයක් පාසා ඔබ ධර්මාවබෝධයේ දිශාවටමයි ගමන් කරන්නේ. නිත්‍ය සංඥාවක් ගන්නා මොහොතේම ඔබ භවයට, මාරයාගේ ලෝකයටමයි ඇදී යන්නේ. ලොව්තුරා සම්මා සම්බුදුරජාණන් වහන්සේ අදවන් උතුම් වෙසක් දිනයක නිවාදූමූ භව ගමන, ආදර්ශයට

ගනිමින් පින්වත් ඔබත් භව ගමන නිවා දැමීම සඳහා මූලිකම අඩිතාලම වන සක්කාය දිට්ඨිය ජීවිතයෙන් පරාජය කරදැමීමට පෙර සටහන්වල දක්වා ඇති පරිදි තෙරුවන් කෙරෙහි අචල ශ්‍රද්ධාවත්, ශීලයේ ආර්ය කාන්තභාවයත්, නෙක්කම්ය උදෙසා දන්දීමත්, පින්වත් ඔබ ඇසුරු කරන ගෞරවනීය ස්වාමීන් වහන්සේලාගේ අවවාද අනුශාසනා පරිදි (ඉහත සඳහන් කර ඇති පරිදි) පංච උපාදානස්කන්ධයේ අනිත්‍ය භාවය දැකීමටත් අදවන් උතුම් වෙසක් දිනයක පින්වත් ඔබ අධිෂ්ඨානය ඇතිකරගන්න.

මෙතෙක් ගෙවාගෙන පැමිණි භව ගමන පුරාවට පින්වත් ඔබ ලොව්තුරා බුදුරජාණන් වහන්සේට පුජාකරන ලද උතුම්ම බුද්ධ පුජාව එය වේවි. මෙය පිණුල්වී ඉවතලන පුජාවක් නොව අවබෝධය ලබා තමාම නිවී යන පූජාවකි. භව ගමන අවුලවා ගන්නා පුජාවන්ගෙන් මිදී භවගමන නිවාගන්නා සැබෑම සම්බුද්ධ පුජාව සම්බුදු පියානන් පිරිනිවන් මංචකයේ සැතපෙන මොහොතේත් ශ්‍රාවක ඔබෙන් බලාපොරොත්තුවු මහා කරුණා ගුණයෙන් යුත් අවසාන අවවාදය බවද පින්වත් ඔබ සිහිපත් කොට ගත යුතුය. ඒ අසිරිමත් වූ ශාස්තෘන් වහන්සේගේ පරිනිර්වානයද මංගල්‍යයක් බවට පත්වෙන්නේ උන්වහන්සේගේ මහා කරුණාවෙන් යුතුව කළ අවසාන අවවාදයේ අර්ථය පින්වත් ඔබ ජීවිතය තුළින් හැකි තරමින් අවබෝධකොට ගැනීමෙන්මය. අවම වශයෙන් මාර්ගඵල ලාභී දෙවියෙක්, දිව්‍යාංගනාවක් ලෙස මීළඟ භවයේ උපත සකස් කොට ගැනීමට පින්වත් ඔබට බුදුරජාණන් වහන්සේ දේශනාකොට වදාළ උතුම් ශ්‍රී සද්ධර්මය ඇසුරෙන් කරන ලද ඉහත සටහන් ඔබට මාර්ගයක්ම, ආලෝකයක්ම වේවා. මේ මාර්ගයද, ආලෝකයද විවරවන්නේ දුකෙන් මිදීම උදෙසා ඔබ තුළ සකස්වෙන විර්යයේ තරමට බව සිහිපත් කොට ගත යුතුය. ඔබ තුළ විර්යය ඇත. එහෙත් එම විර්යය ක්‍රියාත්මක වන්නේ වැරදි දිශාවටය. මාරයා නැමති පාපමිත්‍රයා ඇසුර නිසා විර්යය

ඔබව දුක දෙසට මෙහෙයවයි. රූපය කෙරෙහි ඡන්දරාගයෙන් ඇලී භවයේ දුක දෙසට ඔබව මෙහෙයවීමට අයෝමය ශක්තියක් සේ ඔබ තුළින් සකස්වෙන විර්ය ක්‍රියාකරයි.

ඔබ පංච උපාදානස්කන්ධයේ අනිත්‍යභාවය වැඩීමත් සමඟ, රූපයේ යථා ස්වභාවය ගැන අවබෝධය ලබන තරමටම, වීර්යය කළ්‍යාණ මිත්‍රයෙක් ලෙසින් ඔබ තුළින් නැගී සිටිනු ඇත. පින්වත් ඔබේ කැමැත්ත කුමක්ද, එම කැමැත්ත උදෙසා වීර්යය උපාකාරීවනු ඇත. එමනිසා ඉහත සඳහන් කළ පංච උපාදනස්කන්ධයේ දුක කෙරෙහි ඇතිකරගන්නා දැනුමෙන්, ඉන් ඔබ්බට ගොස් අනුමාන අවබෝධයෙන්, සතර අපායෙන් මිදීම පිණිස සක්කාය දිට්ඨිය නැතිකර ගැනීම සඳහාම කැමැත්ත ඇතිකර ගන්න. මෙතැනදී වීර්යය සකස් වන්නේ පංච උපාදනස්කන්ධයක් හැටියටමයි. නමුත් ඒ උපාදානය භව නිරෝධයට මාර්ගය විවරකර ගැනීම උදෙසා ඇතිකර ගන්නා විඳීමක්මයි. මෙසේ ඔබ ඇතිකර ගන්නා වීර්යය, තණ්හාව මාන්නය  දිට්ඨිය නිසා අපතේ යාමට ඉඩ නොදෙන්න. ලෝකයාගෙන් ලකුණු, ප්‍රසාදය, අනුකම්පාව ලබාගැනීමට නොව ලොව්තුරා බුදුරජාණන් වහන්සේ වර්ණනා කළ ශ්‍රාවකයෙක්, සුදුවත් දරණ උපාසක උපාසිකාවක් වීමට වීර්යය උපකාරී කොටගන්න. ඉන්ද්‍රියයන් හයට අරමුණුවන සියල්ල ගැනම සිතීම මොහොතක් නතර කොට සිතුණු අරමුණු සියල්ලේම අනිත්‍ය දකින්න. මෙවැන් අවස්ථාවක ඔබතුළ ඇතිවන ක්ෂණික සංසිදියාව නැවත නැවත විඳීමට කැමති වෙන්න. විවේකීව රූපයේ වින්දනය කැමති සිතට රූපයේ අනිත්‍ය බව මෙනෙහි කරවන්න.

පින්වත් ගිහි ජීවිතයක් ගතකරන ඔබ රාත්‍රී නිදි පැදුරට, සයනයට ගියාට පස්සේ රූපයන් කෙරෙහි විඳීම සකස් කොට දෙන අකුසල් විතර්කයන්ට අවස්ථාව නොදී දිනයේ උදෑසන සිට රාත්‍රිය දක්වා ඔබගත් ආහාර ගැන සිතන්න. උදේ පාන්දරම තේ එකක් බිව්වා, නැවත උදේට ඉදිආප්ප, පාන් ආහාරයට ගත්තා. උදේ දහයට නැවත තේ එකක් බිව්වා. දහවල් බත් ව්‍යංජන

සමඟ ආහාර ගත්තා. සවස තේ බිව්වා. නැවත රාත්‍රියට ආහාර ගත්තා. ඔබ ගත්තාවූ ආහාරයන් සිහිපත් කරලා ඒවායේ පිරිසිදු භාවය, ගුණාත්මක භාවය ගැන සිහිපත් කරල දැන් ඔබ සිතන්න උදේ සිට ගත් ඉහත ආහාරවලට දැන් මොකද වෙලා තිබෙන්නෙ කියලා. රාත්‍රි නිදි පැදුරට යනකොට දිනය පුරාවට ගත්ත ආහාරවලට මොකද වෙලා තිබෙන්නේ. ආමාශයේ වමනය බවට පත්වෙලා, අසූචි, මුත්‍රා බවට පත්වෙලා. සෙම්, සොටු, මේදය බවට පත්වෙලා. රුධිරය බවට පත්වෙලා. අවසානයේදී ආයුෂ, වර්ණය, සැපය බලය බවට පත්වෙලා. ඔබ දිනය පුරාවට වෙහෙස මහන්සිවී රැකියා, ව්‍යාපාර, ගොවිතැන් කටයුතු කරන්නේ මේ ආහාරය උදෙසාම නේද? පින්වත් ඔබ ශිල්පද බිදගනිමින් මේ වෙහෙසෙන්නේ කුමක් උදෙසාද? වමනය, අසූචි, මුත්‍රා, සෙම්, සොටු, රුධිරය කියන කසල ගොඩක් නිපදවීම උදෙසා නොවේද? මේ සියල්ලගේම අවසාන ඵලය ආයුෂ, වර්ණය, සැපය, බලය, කියන කාරණා සියල්ලමත් අනිත්‍ය භාවයට පත්වන තාවකාලික දේවල් නේද? මේවා අනිත්‍ය භාවයට පත්වන නිසා දුකම නේද සකස්වෙන්නේ. යමක් අනිත්‍ය නම්, යමක් දුක නම් එතැන මගේ යැයි ආත්ම භාවයෙන් ගැනීමට දෙයක් නැහැ නේද? උදේ ඉඳන් කරන 'හපන්කම්' රාත්‍රියට මෙනෙහි කරන්න, අනිත්‍ය සංඥාව වැඩෙන ආකාරයටම.

ආහාරයත්, ආහාරයෙන් පෝෂණය වන කයත්, ඉහත කාරණා දෙකේම අතුරු ඵලයනුත් තම ජීවිතය තුළින්ම දකින්න. කටට, දිවට, රසම සොයන ඔබ මේ රාත්‍රියේ එම රසයේ යථා ස්වභාවය නුවණින් දකින්න. දකිමින්ම නින්දට යන්න. එය ඔබට සුවදායී නින්දක් වේවි. හෙට උදාවන දිනයද සිහි නුවණින් යුතුව ආහාරය ගැන දකින දවසක් වේවි. නිදිපැදුරේදීම ඔබ මියගියහොත් එය ඔබට සුවදායී මරණයක්ම වේවි. ඉහත ආකාරයට ඔබ සිතන්න පුරුදු වුනොත්, කොතැනකදීවත් ඔබට එය නරකක් නම් වෙන්නේ නැහැ. මොකද ඔබ හිතන්නේ, මෙනෙහි කරන්නේ ධර්මයම නිසා. රූපයේ අනිත්‍ය භාවයම නිසා. ආහාරය ඉහත ආකාරයට මොන

තරම් පිළිකුල් භාවයට, අනිත්‍ය භාවයට පත්වන දෙයක් වුනත් පින්වත් ඔබට පුළුවන් ආහාරයටත් යම් වටිනාකමක් දෙන්න. එය කරන්න පුළුවන් ප්‍රත්‍යාවේක්ෂාවෙන් ආහාරය පරිහරණය කළොත් පමණයි. ඒ කියන්නේ 'අනිත්‍ය භාවයට පත්වන ආයුෂ, වර්ණය, සැපය, බලය උදෙසා නොවෙයි මේ අහාරය ගන්නේ, මේවා කෙරෙයි ඡන්ද රාගය ඇතිකර ගෙන නොවෙයි ආහාර ගන්නේ, මේ බ්‍රහ්මචාරී ජීවිතය පවත්වා ගැනීමට ශීල, සමාධි, ප්‍රඥා මාර්ගයේ ගමන් කිරීමට අවශ්‍ය වැය වුනාවූ ශක්තිය යළි ලබාගැනීමට, අලුතින් ශක්තිය උපදවා ගැනීම. අරමුණු කරගෙනයි ආහාර ගන්නේ කියන කාරණය ජීවිතයට එකතුකර ගැනීමෙන් නොවටිනා ආහාරයක් වටිනා අරමුණක් උදෙසා ප්‍රයෝජනයට ගැනීමට පින්වත් ඔබට පුළුවන්.

ඉහත ආකාරයට පින්වත් ඔබ ආහාරය ගැන සෑම රාත්‍රියකම මෙනෙහි කළොත් ආහාරය කෙරෙහි ඇති තෘෂ්ණාවෙන් මිදෙන දිශාවට ඔබ ගමන් කරාවී. තෘෂ්ණාවෙන් මිදෙන මාර්ගය වන ආර්ය අෂ්ඨාංගික මාර්ගයේ ගමන් කිරීම උදෙසා පමණක් කය පවත්වා ගැනීමේ අරමුණ ඇතිවයි ආහාර ගන්නේ. තෘෂ්ණාව නිසා ආහාරයේ ඇතිවීමත්, තෘෂ්ණාව ප්‍රහාණය කිරීමෙන් ආහාරයේ නිරෝධයත්, තෘෂ්ණාව ප්‍රහීන කිරීමේ මාර්ගය ආර්ය අෂ්ඨාංගික මාර්ගය බවත් පින්වත් ඔබ අවබෝධකොට ගතහොත් ඔබ ඒ කාරණයෙන්ම සම්මා දිට්ඨියට පත්වෙනවා කියන සහතිකය, සම්මා දිට්ඨි සූත්‍රයේදී සාරිපුත්ත මහෝත්තමයන් වහන්සේ පින්වත් ඔබට සහතිකයක් දෙනවා. මෙම සහතිකය දෙස් විදෙස් සුපිරි සූපවේදීන්ගේ කටට කෙළ උනනා, මැරෙන ලෙඩවෙන වයසට යන කයක් මොහොතක් රසවත් කර වමනය, අසුචි, මුත්‍ර බවට පත්වෙන ආහාර වට්ටෝරු උදෙසා දෙන, දුකට හේතුවන සහතිකයක් නොව, දුකින් මිදීමේ සහතිකයයි. තළු මර මරා ඇස් ලොකු කරමින් නලල රැළි ගන්වමින්, තමා තුළ තිබෙන්නාවූ තෘෂ්ණාව යන කාරණය අහාරයේ ඇති රසයක් ලෙස මෝහ මූලිකව ගැනීම නිසා ඇති කර ගන්නා ආහාර කෙරෙහි වන

කෑදරභාවය විසින් ලබන ජීවිතයේදී ආමාශගත පණුවන්, නරක්වූ ආහාර මත සෑදෙන පණුවන් ලෙස ආහාරයේ බැසගෙනම ජීවත්වීමට අවශ්‍ය උපතක් එවැනි අයට සාදා දීමට හැකිය.

පින්වත් ඔබ කය පෝෂණය කරනා ආහාරය, රූපයේ නිරෝධය උදෙසාම ප්‍රයෝජනයට ගන්න. අතීත භවයන් හීදී සශ්‍රික දිව්‍යතලවල ඉපිද සිතූ සිතූ රසයන්ගෙන් රසවත් වූ දිව්‍ය ඕජාව රිසිසේ විඳ ඇති පින්වත් ඔබ, එම රසයන්ගෙන් නොසෑහුනු ඔබ මේ වටිනා මොහොතේ ධර්මයේ රසය යොදාගනිමින් කෙලෙස් රස හීනවන දිශාවට ක්‍රියාත්මක වන්න. එවිට පින්වත් ඔබට ආහාරය වටිනා දෙයක්, රසවත් දෙයක් වශයෙන් නොව හේතූන් නිසා සකස්වූ දෙයක් බව වැටහෙනු ඇත.

පින්වත් ඔබ මෙවැනි ධර්මයන් තුළින් ජීවිතය සක්කාය දිට්ඨිය සිඳෙන දිශාවටම අවබෝධය කරායෑමට උත්සුක වෙන්න. නිරතුරුවම තණ්හාව, මාන්නය, දිට්ඨිය කියන මාර ධර්මයන්ගෙන් පරිස්සම් වෙන්න. තමා කෙරෙහි, 'මම' කියන දැඩි සංඥාවක් මතුවන සැනින් එය අනිත්‍ය වශයෙන් දකින්න පුරුදුවෙන්න. පංච උපාදනස්කන්ධයේ අනිත්‍යභාවය වැඩීමේදී ඔබ තුළින් ඔබට දැකිය හැකි උතුම් ලක්ෂණය නිහතමානීකම බව හොඳින් මතක තබාගන්න.

එම ලක්ෂණය ඔබ තුළින් විද්‍යාමාන නොවේ නම් පින්වත් ඔබ තණ්හා, මාන්න, දිට්ඨි නැමැති මාර ධර්මයෙන්ගේ ග්‍රහණයට අසුවී ඇති බව ස්ථිරය. මහා කරුණා ගුණයෙන් ඔබව සොයා වැඩම කොට ඔබට නිවැරදිවීමේ මාර්ගය කියාදීමට වර්තමානයේ ජීවමාන බුදුරජාණන් වහන්සේ නොමැත. ඒ නිසා සතර අපායේ දුක ගැන දකිමින් ඔබ ඔබ විසින්ම නිවැරදි විය යුතුය. ශාසනයේ ප්‍රඥාව අතින් අගතැන්පත් සාරිපුත්ත මහෝත්තමයන් වහන්සේ වරක් සිංහනාදයක් කරනවා 'භාග්‍යවතුන් වහන්ස. මම හරියට රොඩී රැහැක රොඩී දරුවෙක් වගේ' කියලා. මේ උතුම් නිහතමානීකම ධර්මයේ අස්වැන්නමයි.

අද වැනි උතුම් වෙසක් දිනයක ලොව්තුරා බුදුරජණන්වසේව දකින්න. ධර්මාවබොධයේ වටිනාකම හඳුනාගන්න. පින්වත් ඔබ, අප කෙරෙහි මහා කරුණාවෙන් සම්මාසම්බුද්ධ ඥානය අවබෝධ කරගත් තැන් පටන් පරිනිර්වානය දක්වාම සත්ත්වයාට තෙරුවන් කෙරෙහි අචල ශ්‍රද්ධාවම, ශීලයේ වටිනාකම නෙක්කම්මය උදෙසා දන්දීමේ වටිනාකම ම, පංච උපාදනස්කන්ධයේ අනිත්‍යභාවය දකීමේ වටිනාකම ම ගිහි ජීවිත ගතකරන පිංවතුන්ලාට දේශනා කරමින් සතර අපායෙන් එතෙරවීමේ මාර්ගයම, භව ගමනේ සනාථ වන මාර්ගයම කියාදුන් එවන් තවත් අසිරිමත් ශාස්තෲන් වහන්සේ නමක් තවත් වසර ලක්‍ෂ ගණනකට පහළ නොවන බව, ලෝකයාට මුණනොගැසෙන බව අපි සිහි නුවනින් දැනගත යුතුය. එහෙයින් පින්වත් ඔබ ඉදිරියේ මේ මොහොතේ ඇති අභියෝගය ජය නොගතහොත් තෙරුවන් නොමැති ලොවක ඉබාගාතේ යන මිත්‍යාදෘෂ්ටිකයන් ලෙස (මනුෂ්‍ය ජීවිතයක් ලැබුවද) දුක්විඳනු ඇත. ශීලයෙන් මනුෂ්‍යයා ගිලිහුනු ලොවක, හිරි ඔතප් දෙක නැතිවුන ලොවක මනුෂ්‍යයාත්, තිරිසන් සතාත් දෙදෙනෙකු නොව එකම කුලයක් වනු ඇත. මේ අවදානමෙන් පින්වත් ඔබට මිදිය හැකි වන්නේ මේ ජීවිතය තුළදීම සතර අපායෙන් මිදීම සඳහා ඔබ දක්‍ෂවුවහොත් පමණක්ම වනු ඇත. ගිහි පිංවතුන් උදෙසා එම ගිහි බැඳීම් සමඟ කටයුතු කරමින් සතර අපායෙන් මිදීමට අවශ්‍ය කරුණු කාරණා භික්‍ෂුවට ලැබුණු විවේක කාලයන්හීදී මෙසේ සටහන් තබන ලදී.

සතර අපායෙන් මිදීම යනු සෝවාන් ඵලයයි. ඉහත සටහන් වල අඩුපාඩු තිබිය හැකිය. එවැනි අඩුපාඩු තිබුණ හොත් ඒවා ගැන විතර්කයන් සකස් කර ගන්නේ නැතිව ලොව්තුරා බුදුරජාණන් වහන්සේ දේශනා කොට වදාළ සූත්‍ර ධර්මම පරිශීලනය කර අඩුපාඩු සකස්කරගන්න. මොකද බුදුරජාණන්ව වහන්සේමයි සියල්ලම දන්නේ. අපි අඩුපාඩු සහිතමයි. මේ ආකරයෙන් සිතන්න පුරුදුවුනොත් පමණක්මයි පින්වත් ඔබ තව තවත් බුදුරජාණන් වහන්සේගේ, ධර්ම රත්නයේ, සංඝ රත්නයේ සරණ සොයන්නේ.

එසේ නොවී මම සියල්ලම දන්නවායැයි කියන මනෝභාවය ඔබව බුදුරජාණන් වහන්සේගෙන් තව තවත් දුරස්කරන දිශාවටමයි මෙහෙය වන්නේ. ලොව්තුරා බුදුරජාණන් වහන්සේගෙන්, ධර්ම රත්නයෙන්, සංඝරත්නයෙන් දුරස්වෙනවාය කියන්නේ, මාරයට ළංවෙනවාය කියන කාරණයයි. මෙම අභියෝගය පරාජය කළ හැක්කේ ඔබ තුළ ඇතිවන තණ්හාව, මාන්නය, දිට්ඨිය කියන කාරණා මාර ධර්මයන් බව නිවැරදිව හැඳිනගෙන එම කුසල ධර්මයන් ඔබ තුළින් පරාජය කර දැමීමේ මාර්ගයට පැමිණීමෙන්ය. මේ මාර්ගයේදී පින්වත් ඔබ මුළින්ම මමත්වයේ දැඩි භාවය, ඒ කියන්නේ සක්කාය දිට්ඨිය සිඳ දමා සතර අපායෙන් නිදහස්වනු ඇත. මේ නිදහස සැබෑම භව ගමනේ නිදහස්වීම නොවන අතර ගෞතම සම්මා සම්බුද්ධ ශාසනය අවරට යන මේ මොහොතේ සැබෑම නිදහස්වීම උදෙසා ඔබ ලබන නිදහස වනු ඇත. මින් ඉදිරියට පින්වත් ඔබ මාර්ග ඵල ලාභී දෙවියෙක්, දිව්‍යාංගනාවක්ම ලෙස දිව්‍යතලවල සශ්‍රීක සැපයන් විඳ මතු දිනක සුවසේ ධර්මයේ ඉතිරි අවබෝධයන් ලබා, දිව්‍යතලයකදීම-බ්‍රහ්මතලයකදීම නිවී යනු ඇත.

ඝෝරතර සසරේ
තවත් එක් සන්ධියක
ඉබාගාතේ ඇවිදි
සංසාර සතුන් හට
නොඇලෙන්න කියාදුන්
නොගැටෙන්න සිහිය දුන්
අතහරින සතිය දුන්
නිදුකානගේම පුත්
සඟ මැණික ඔබම විය

කරගන්න මහ කුසල්
බෙදා ලොවටම දහම
ඔබේ අවබෝධයෙන්
සැනසීය මනු කැලක්
එමතු නොව දෙවියෝද
එයින් තුටු වනු දනිමි

සාරිපුත් පරපුරේ
අපේ කාලේ උපන්
මහකසුප් මහතෙරගෙ
එමඟ යන බුදු පුතුනි
එක්කෝ මරණයය
නොමැතිනම් නිවනමය
කියා කළ සිහ නාද
තව කොහෙන් අසන්නද

ඔබේ දම් ගැලපුමට
නොතිත් පැසසුම් එතැයි
කියූ කල මා ඔබට
පුතේ මේ මගෙ නොවෙයි
බුදුරජුන් දහමමය
නිහතමානීව කීවු
ඒ වදන් රාවදෙයි

කොහේ හෝ වන පෙතක
මේ මොහොතෙ වැඩ සිටින
අපේ පිනටම උපන්
හිමියනේ ඔබෙ ගුණෝන්
දකිමු අපි බුදු රජුන්

ඒ අමා මැණියන්
සහස් දෙකකුත් අඩක්
ගෙවී වස් ගතවෙතත්
වදයි ඔබ වැනි පුතුන්
ලෝ සතට සෙනෙහසින්



ISBN 978-955-7887-04-3

මිල රු. 125 /-